# ආඛ්‍යාන narrations

*Open access, refereed biannual journal*
ISSN 2478-0642 | Volume 10 | Issue 01| 2025



**Center for Indigenous Knowledge and Community Studies (CIKCS)**
Sabaragamuwa University of Sri Lanka

ආඛ්‍යාන narrations

*Open access, refereed biannual journal*
ISSN 2478-0642
Volume 10 | Issue 01| 2025
Sabaragamuwa University of Sri Lanka

Attribution-NonCommercial-ShareAlike
CC BY-NC-SA
Legal Code: https://creativecommons.org/licenses/by-nc-nd/4.0/legalcode

**Editorial Board**

**Editor in Chief**

**Prof. K. V. D. Edirisooriya Manike**, Department of Geography and Environmental Management, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Editors**

**Prof. Sarath Ananda**, Department of Social Sciences, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Prof. Manoj Ariyarathne**, Department of Languages, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Prof. E. P. N. Udaya Kumara**, Department of Natural Resources, Faculty of Applied Sciences, Sabaragamuwa University of Sri Lanka

**Prof. Jayaprasad Welgama**, Department of Social Sciences, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Prof. Saman Handaragama**, Department of Social Sciences, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Prof. Pradeep Uluwaduge**, Department of Social Sciences, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Prabath Galagamage**, Visiting Lecturer, Department of Social Sciences, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

ආඛ්‍යාන narrations

*Open access, refereed biannual journal*

ISSN 2478-0642

Volume 10 | Issue 01| 2025

## Language Editors

**Dr. Noel Dassanayakea**, Language Editor in English, Department of Languages, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**S. P. S. P. Weerasinghe**, Language Editor in English, Senior Lecturer, Department of Languages, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Nalaka Jayasena**, Language Editor in Sinhala, Visiting Lecturer, Gampaha Wickramarachchi University of Indigenous Medicine

## Panel of Reviewers

**Prof. Emerit. Kalinga Tudor Silva**, Department of Sociology, Faculty of Arts, University of Peradeniya

**Senior (Chair) Prof. Premakumara De Silva**, Department of Sociology, Faculty of Arts, University of Colombo

**Prof. S. M. K. Herath**, Department of Sociology, Faculty of Arts, University of Colombo

**Prof. Pradeep Uluwaduge**, Department of Social Sciences, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Prof. Emerit. H. M. D. R. Herath,** Department of Sociology, Faculty of Arts, University of Peradeniya

**Dr. G. K. C. S. De Silva**, Department of Languages, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka

**Dr. Upul Priyantha Gamage,** Department of Sinhala, Faculty of Language Studies, Buddhist and Pali University of Sri Lanka

**Prof. Sunanda Premasiri**, Department of Sinhala, Faculty of Arts, University of Peradeniya

**Dr. I. M. T. Ilangasinghe**, Senior Lecturer, Department of Painting, Faculty of Visual Arts, University of the Visual & Performing Arts

**Dr. W. K. N. C. Withanage**, Department of Geography, Faculty of Humanities and Social Sciences, University of Ruhuna

**Dr. Sumudu Premachandra**, High Court Judge, Civil Appeal Kandy

## Technical Specifications

***Fonts***
Abhaya Libre (Unicode)

***Page Size***
A4 - 8.27 x 11.67 inches

***Format***
Portable Document Format (PDF)

***Full Journal access***
https://www.sab.ac.lk/cikcs/akyana_narrations

***SUSL e-Repository***
http://repo.lib.sab.ac.lk:8080/xmlui/handle/123456789/561

https://www.researchgate.net/institution/Sabaragamuwa_University_of_Sri_Lanka

Submit your academic papers to director@cikcs.sab.ac.lk

*Cover page photograph:*

***Location:*** *LUNUGANGA - Garden Residence of Geoffrey Bawa [Mobile captures]*

***Sithumini Rathnamalala,*** *Department of Integrated Design, Faculty of Architecture, University of Moratuwa*

## Table of Contents

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණපාන ගැටලු සහ අභියෝග පිළිබඳ විශ්ලේෂණයක් (බලංගොඩ නගර සභාව ඇසුරෙන්)__________________ 7

තත්කාලීන විචාරකයා කොළඹ යුගයේ දෙවැනි පරපුරේ කවිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාව්‍ය විචාරයෙහි ප්‍රාමාණිකත්වය පිළිබඳ අධ්‍යයනයක්______________________________ 26

ශ්‍රී ලංකාවේ ඡන්ද චර්යාව කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බලපෑම__________ 40

2019 වර්ෂයේදී ශ්‍රී ලාංකේය නාගරික බිත්ති අවකාශ සැරසූ වීදි සිතුවම් ප්‍රවාහය පිළිබඳ විශ්ලේෂණාත්මක පසුවිපරමක්_______________________________________________ 59

මහනුවර යුගයේ සිතුවම් කර්මාන්තයේ නියැළුණු චිත්‍ර ශිල්පීන්ගේ පරම්පරා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්________________________________________________ 85

**ආඛ්‍යානnarrations**
**Volume 10 | Issue 01 | January-June 2025 | Article 01**
**ISSN 2478-0642**

CC BY NC ND

Open Access, Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies, Sabaragamuwa University of Sri Lanka
Submit your academic papers to director@cikcs.sab.ac.lk
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

---

# තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණපාන ගැටලු සහ අභියෝග පිළිබඳ විශ්ලේෂණයක් (බලංගොඩ නගර සභාව ආශ්‍රයෙන්)

**ජී. සී. එල්. පතිරණ,** සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
pathiranaakash@gmail.com

**ඩබ්. ඒ. ටී. එන්. කුමාර,** සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
neranjantharindu@gmail.com

**Received:** 08 March 2025 / **Revised:** 03 May 2025 / **Accepted:** 15 May 2025

**සාරසංක්ෂේපය**

රාජ්‍ය තොරතුරු ජනතාව වෙත ප්‍රවේශ කිරීමට ගනු ලැබූ වැදගත් සාධනීය ප්‍රවේශයක් ලෙස තොරතුරු දැන ගැනීමේ පනත සඳහන් කළ හැකිය. මෙම පනත මඟින් ශ්‍රී ලාංකීය පරිපාලනය වගකීමෙන් හා විනිවිදභාවයෙන් ක්‍රියාකරන වැදගත් ප්‍රජාතන්ත්‍රීය ක්‍රමවේදයකට අනුගත වන සාධනීය පරිවර්තනයක් අරමුණු කරගනු ලැබීය. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ නව තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණපාන ගැටලු සහ අභියෝග පිළිබඳ විශ්ලේෂණය කිරීමයි. අධ්‍යයනය ප්‍රාථමික සහ ද්විතීයික දත්ත මත පදනම්ව සිදුකරන ලදී. ප්‍රාථමික දත්ත මත පදනම් වූ ව්‍යුහගත ප්‍රශ්නාවලි භාවිත කරමින් බලංගොඩ නගර සභා ජනතාවගෙන් 50කින් යුතු සරල සසම්භාවී නියැදියකින් දත්ත රැස් කරන ලදී. සසම්භාවී නොවන පහසුතම නියැදීම මගින් නගර සභා නිලධාරීන් 05කගෙන් සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගැනීම සිදුකරනු ලැබීය. ද්විතීයික දත්ත පොත්, සඟරා, සහ වෙබ් අඩවි තුළින් එක් රැස් කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් මෘදුකාංගය ද ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක අන්තර්ගත විශ්ලේෂණය ද උපයෝගී කොටගනු ලැබූ අතර දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු ප්‍රස්තාර රූප සටහන් හා සිතියම් යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනය මගින්

අනාවරණය වූයේ පනත ක්‍රියාත්මක වීමේ දී ගැටලු සහ අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී ඇති බවයි. නිලධාරී හා ජනතා මට්ටමේ දී පනත පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම, දැනුවත් වීමට ඇති මාර්ගවල සීමා සහ අවම ධාරිතාවය, ධනාත්මක සම්බන්ධීකරණයක් නොමැති වීම ප්‍රධාන ගැටලු ලෙස හඳුනාගත හැකි විය. අධ්‍යයනයෙහි ප්‍රධාන යෝජනාවන් බවට පත් වූයේ නිසි සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය තුළින් පුළුල් දැනුවත් කිරීමේ ප්‍රවේශයන් ගොඩනැගීමත් පනත වෙත ප්‍රවේශ වීම සඳහා ඇති බාධාවන් ඉවත් කිරීමත්ය. මෙම ගැටලු සහ අභියෝගයන් මඟහරවා ගැනීම තුළින් ශ්‍රී ලාංකීය සමාජය අපේක්ෂා කරන යහපාලනයෙහි අභිමතාර්ථයන් සාධනය කර ගැනීමේ හැකියාව පවතින බව සඳහන් කළ හැකියි.

**ප්‍රමුඛ පද:** *තොරතුරු දැන ගැනීමේ පනත, පරිපාලන වගකීම, විනිවිදභාවය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, බළන්ගොඩ නගර සභාව, පරිපාලන දැනුම සහ අවබෝධය*

**හැඳින්වීම**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට ම අපට සියවස් දෙකක් තරම් දිගු කාලයක් ගත විය. මේ තුළින් පාලකයා හා පාලිතයා අතර සම්බන්ධය දුරස් වූවා පමණක් නොව පරිපාලන ක්‍රමය තුළ දූෂණ, වංචා ද ශීඝ්‍ර ලෙස ඉහළ ගියේ ය. ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය හිමිවන්නේ ආසියානු කලාපයේ රටවල් සියල්ලට ම පෙරය. එහෙත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සුරක්ෂිත කිරීම පිළිබඳ ව සලකන විට අප නියෝජනය කරන්නා වූ දකුණු ආසියානු කලාපයේ රටවල් සියල්ලක් ම අපට පෙර තම රට වැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිය නීත්‍යානුකූලව ලබා දී ඇත. ශ්‍රී ලාංකිකයින් වන අපට තොරතුරු දැනගැනීමේ නීත්‍යානුකූල අයිතිය හිමිවන්නේ දකුණු ආසියානු කලාපයේ අවසන් රට වශයෙනි. ජනතාවට තොරතුරු විවෘත නොවීම නිසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන අංශ තුළ දූෂණ, හා වංචාව ඉහළ යාම සිදුව ඇත. ඒ තුළ අල්ලස් ගැනීම, අයථා මුදල් ගනුදෙනු පිළිබඳ සිදුවීම් වාර්තා වේ. විශේෂයෙන් 2015 ජනාධිපතිවරණයට ඉදිරිපත් වන එක්සත් ජාතික පක්‍ෂය ප්‍රමුඛ දෙමුහුන් ආණ්ඩුවේ ප්‍රධාන සටන් පාඨයක් වූයේ විශ්වීය සංකල්පයක් වන යහපාලන සංකල්පය මෙරට ස්ථාපිත කළ යුතු බවයි. යහපාලනය සංකල්පය තුළ විශේෂ ස්ථානයක් ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියට හිමි වෙයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ නව තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත 2016 ජුනි 21 වන දින පාර්ලිමේන්තුවේ ඒකච්ඡන්දයෙන් සම්මත වීම ඓතිහාසික සිදුවීමක් ලෙස අර්ථකථනය කිරීමේ වරදක් නැත. ලෝකයේ මුල්ම තොරතුරු අයිතිය පිළිබඳ නීතිය 1766 දී ස්වීඩනයේ සම්මත විය. එයින් වසර 250ක් ගතවන 2016 දී ප්‍රමාද වී හෝ ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කරවා ගැනීමට හැකි වීම පිළිබඳ ව සතුටු විය යුතුය.

ප්‍රජාතන්ත්‍රවාදයත්, එහි වගන්තිත් තිබූ පමණින් තොරතුරු දැනගැනීමේ අයිතිය හිමි වන්නේ හෝ සුරක්ෂිත වන්නේ නැත. එය මිනිසා සතු සෙසු අයිතිවාසිකම් සේම දිනාගත යුතු අයිතියකි. රාජ්‍ය නිලධාරින් තොරතුරු නිර්මාණය කරන්නේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නම්, ජනතාව සතු සම්පත් උපයෝගී කොට ගෙන නම්, එම තොරතුරු ජනතාවගෙන් වසන් නොකළ යුතුය. ඒ සඳහා ප්‍රවේශ වීමට ජනතාවට අවස්ථාව සලසා දිය යුතුය. තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා පනතක් සම්මත කළ ද රටක තොරතුරු නීතිය සාර්ථක වන්නේ එයින් පුරවැසියන් ප්‍රයෝජන ලබා ගන්නේ නම් පමණකි. නිවැරදි තොරතුරු වෙත ප්‍රවේශ වීම හරහා ආවේග, අනුමාන, ඇදහිලි හා කුමන්ත්‍රණවාදී ප්‍රබන්ධ මත පදනම්ව තීරණ හා නිගමනවලට එළඹීම වෙනුවට තොරතුරු හා සාක්ෂි මත පදනම්ව වඩාත් විචාරශීලී පුරවැසියෙකු නිර්මාණය කිරීම උදෙසා හේතු පාදක විය හැකිය. තොරතුරු දැනගැනීම පුරවැසියන්ගේ සමාජ අයිතියක් වන බවට වඩාත් පැහැදිලි කරනු ලබන තර්කයක් 1976 වර්ෂයේ දී ඉදිරිපත් විය. ඒ මෙක්සිකෝවේ පැවති තොරතුරු පරිහරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ අවසන් වාර්තාව තුළයි. එහි දැක්වෙන ආකාරයට "තොරතුරු යනු පුරවැසි අයිතියකි. එය වෙළෙඳ භාණ්ඩයක් නොවේ. එහි අරමුණ වන්නේ පුරවැසියා වඩවඩාත් දැනුවත් කිරීමයි. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඔවුන්ගේ ප්‍රශ්නවලට අදාළ සමාජ හා දේශපාලනික තත්ත්වයන් ගැන ඔවුන්ට පූර්ණ අවබෝධයක් ලබා දීමයි. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සහභාගි වීමට ඔවුන්ට හැකියාව ඇති බව මුළුමනින් ම වටහා දීමයි. තොරතුරු සමාජ අවශ්‍යතාවයකි. එය මානව අයිතිවාසිකම් පිළිබඳ ව පූර්ණ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය ම සාධකයකි. එසේ ම තොරතුරු 'විමුක්තිය' ලබා ගැනීමේ මෙවලමක් ද විය යුතු ය" (දෙසතිය ජූනි 2015, 26). තොරතුරු දැනගැනීමේ අයිතිය බලාත්මක කිරීම මඟින් තම රාජ්‍යයේ ඕනෑම ව්‍යාපෘතියක්, එහි මූල්‍ය කටයුත්තක් පිළිබඳව විමසීමටත්, එහි සැබෑ තත්ත්වය මෙන් ම එහි විනිවිදභාවය පිළිබඳ අදාළ පාලක පන්තියෙන් ප්‍රශ්න කිරීමටත් පුරවැසියාට බලය හිමි වේ. එසේම ඉල්ලා සිටින තොරතුරු ලබා දීමට නිලධාරීන් නීතියෙන් ම බැඳී සිටී. මේ තුළින් තොරතුරු වෙත ප්‍රවේශ වීමට පුරවැසියාට නීත්‍යානුකූල අයිතියක් හිමි වේ.

මෙරට නව තොරතුරු දැනගැනීමේ පනත සම්මත වීමත් සමඟ ම රාජ්‍ය අංශයේ සියලු ම ව්‍යාපෘති සහ සංවර්ධන වැඩසටහන් ආශ්‍රිත ව තොරතුරු ලබා දීම අනිවාර්යය කෙරෙන අතර එයට නීත්‍යානුකූලභාවයක් ද හිමි වේ. තව ද සෑම ආයතනයක ම තොරතුරු ලබාදීම සඳහා නිත්‍ය නිලධාරියෙකු පත් කෙරෙන අතර ඔහු පුරවැසියන් ඉල්ලා සිටින තොරතුරු ලබාදීමට බැඳී සිටී. පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු අධිකාරීන් විසින් ජනතාව තොරතුරු ඉල්ලනතුරු නොසිට, ස්වයංව තම ආයතනය පිළිබඳ වූ තොරතුරු ජනතාව වෙත ප්‍රසිද්ධ කළ යුතු වේ.

කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ බොහෝ අණපනත් මෙන් ම ප්‍රඥප්තීන් ද හුදෙක් ලියවිල්ලකට පමණක් සීමා වීම දැකගත හැකි ය. නිදසුනක් ලෙස 2007 කාල වකවානුව තුළ පුරවැසි ප්‍රඥප්තිය මඟින් ජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම අරමුණු කරනු ලැබීය. නමුත් තවමත් බොහෝ රාජ්‍ය ආයතන තුළ අකාර්යක්ෂමතා දැකගත හැකිය. ඒ අනුව තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණ පෑ හැකි ගැටලු හා අභියෝගයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

**සාහිත්‍ය විමර්ශනය**

ෂෝල් නිගම් (Shalu Nigam) විසින් සිදු කරන ලද "The Right to Information Act : Ten Years of Transparency or a Decade of Ambiguity" නමැති ලිපිය තුළ දක්වන ආකාරයට තොරතුරු දැනගැනීමේ අයිතිය හිමිකර දීම යනු රාජ්‍ය පරිපාලනයෙන් ජනතාවට හිමිවන්නා වූ නව යුගයක ඇරඹුමයි. එයට බල කිරීම මඟින් අධීක්ෂණය, පිරික්සීම, නැවත විමසීම, සැකසීම යනාදිය ද, විවිධ පනත් සම්බන්ධයෙන් පොදු කැමැත්ත, විශ්වසනීයත්වය සහ යුක්තිය අදාළ කරගනිමින් සිදු කිරීම තුළින් පරිපාලනයේ විවෘතභාවය, විනිවිදභාවය සහ යෝග්‍යතාවය වර්ධනය හරහා රාජ්‍ය පරිපාලනය ප්‍රතිව්‍යුහගත කළ හැකි බව ඔහුගේ අදහසයි. රාජ්‍ය පරිපාලනයෙහි දූෂණ මැඩලීමටත් පොදු ජනතාව හා පාලක පන්තීන් අතර බලසමීකරණයට අභියෝග කිරීමෙහි තීරණාත්මක උත්ප්‍රේරකයක් ලෙස ඔහු තොරතුරු දැනගැනීමේ පනත හඳුන්වා දෙයි. එහෙත් එය ක්‍රියාත්මක වී දීර්ඝ කාලයක් ගත වී ඇතත් අපේක්ෂිත පරමාර්ථ ඉටු වී නැත. පුරවැසියන් සවිබල ගැන්වීමට වඩා එමගින් සිදු වී ඇත්තේ බහුතරයක් වූ ජනතාව නොසලකා හැරීමය. එමගින් තොරතුරු ලබා දෙන්නා සහ ග්‍රාහකයන් අතර පුළුල් වන ද්‍රවීයතාව ප්‍රජාතන්ත්‍රවාදයෙහි ක්‍රියාකාරීත්වයට බාධාවක් වී ඇති බව පර්යේෂකයා පැහැදිලි කොට ඇත.

සැමුවෙල් පෝල් (Samuel Paul) විසින් රචනා කරන ලද — Right to Information on Candidates – How will the Voters Know? කෘතිය හරහා පුරවැසියාගේ තොරතුරු දැනගැනීමේ අයිතිය ඡන්දයක දී ඡන්ද අපේක්ෂකයාට අදාළව පවතින්නක් බව, ආර්ථික සහ දේශපාලනිකව පෘථුල අර්ථකථනයක් ලබා දෙමින් පවසයි. සුප්‍රීම් අධිකරණයේ දී පවා නැවත විමසීමේ බලය මේ හරහා ව්‍යවස්ථානුකූලවම ජනතාවට හිමිවන බවත්, මෙමගින් විවිධ පියවරයන් ඔස්සේ තොරතුරු දැනගැනීමේ අයිතිය විග්‍රහ කිරීමට හැකි බවත් ඔහු තවදුරටත් පෙන්වා දේ (Paul, 2003).

"Information and Communication" නමැති ලිපිය තුළ කුමාර් ( Kumar, 2024) සඳහන් කරන ආකාරයට තොරතුරු සහ සන්නිවේදනය විද්‍යාවක් ලෙස ගෙනිමින් එහි අන්තර්ගත දත්ත, තොරතුරු

හා දැනුම ආදියෙන් උද්ගත වන්නා වූ ගැටලු ආදිය විග්‍රහ කරයි. ඔහු තවදුරටත් පෙන්වා දෙන්නේ තොරතුරු දැනගැනීමේ අයිතිය තිබූ පමණින් එහි අගයක්, වටිනාකමක් නොමැති බවත් එය සක්‍රීයව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වන බවත්ය. එමෙන්ම ඉන්දීය තොරතුරු දැනගැනීමේ පනත සංශෝධනය කරමින් අයුක්තිය මඟහරවාලීම යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය නියමානුකූලව ක්‍රියාත්මක වන රටක් තුළ තිබිය යුත්තක් බව දක්වයි (Kumar, ,2004).

එම්.ටී.ටී.ආර් කුමාර (Kumara, 2019) විසින් සිදු කරන ලද "Right to Information Act: A Case Study on Sri Lanka" අධ්‍යයනය අරමුණු කොට තිබෙන්නේ තොරතුරු දැනගැනීමේ පනත් ක්‍රියාත්මක කිරීම මගින් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වේ ද යන්න පරීක්ෂා කිරීමයි. ත්‍රිවිධ හමුදාවට ලැබෙන තොරතුරු දැනගැනීමේ අයදුම්පත සහ තොරතුරු දැනගැනීමේ කොමිසම විසින් අවසන් කරන ලද අභියාචනා විමර්ශන නඩු දෙසීයක් පාදක කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කොට ඇත. පර්යේෂණය මගින් අනාවරණය කොටගෙන ඇත්තේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ජාතික ආරක්ෂාව යන යෙදුම නිවැරදිව නිර්වචනය කොට නොමැති බවත් එම නිසා නිලධාරීන් විවිධ නිර්වචනයන් ජාතික ආරක්‍ෂාව සම්බන්ධව ඉදිරිපත් කරන බවත්ය. කෙසේ වෙතත් පනත ක්‍රියාත්මක වීම මගින් කිසිසේත් ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන බව පර්යේෂකයා පැහැදිලි කරයි. පනත පිළිබඳව නිලධාරි මට්ටමේ දී දක්වන අවම දැනුවත්භාවය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රධාන අභියෝගයක් බවට පර්යේෂකයා නිගමනය කොට තිබේ.

ඉක්බාල් සවුජාන් (Saujanල 2022) ඇතුළු පිරිස සිදු කරන ලද "The Right to Information Act and Its Implementation in Sri Lanka:An Empirical Analysis" යන අධ්‍යයනයෙන් අරමුණු කොට ඇත්තේ පනත ක්‍රියාත්මක කිරීමේ දී මුහුණපාන ප්‍රධාන ගැටලු සහ අභියෝග හඳුනා ගැනීමටයි. ප්‍රධාන වශයෙන්ම අධ්‍යයනය ද්විතීයික දත්ත මත පදනම්ව සිදු වී ඇත. පනත ක්‍රියාත්මක වීමේ දී ප්‍රධාන අභියෝග ලෙසින් පර්යේෂකයා හඳුනාගෙන ඇත්තේ භාෂාව, වලංගු හේතු නොමැතිව ඉල්ලා සිටින තොරතුරු ප්‍රතික්ෂේප කිරීම, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය මෙම පනත ක්‍රියාත්මක කිරීමට පියවර නොගැනීම, පනත පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිකම යන සාධකයන්ය.

සමස්තයක් ලෙස මෙම සාහිත්‍ය විමර්ශනයන් සලකා බලන විට පර්යේෂකයා අවධානය යොමු කරන ක්ෂේත්‍රය සහ භාවිත කරන ක්‍රමවේදයන්ගෙන් වෙනස් වන ආකාරය හඳුනාගත හැකිය. සඳහන් කළ යුතු ප්‍රධානතම කාරණය වන්නේ බලංගොඩ නගර සභාව සම්බන්ධ කරගනිමින් තොරතුරු දැනගැනීමේ පනත සහ එහි ක්‍රියාත්මක වීමෙහි අභියෝග හඳුනා ගැනීමට මේ දක්වා සිදුකරන ලද පර්යේෂණයන් ඉතාමත්ම විරල වන බවය. එසේත් නැත්නම් ඒ පිළිබඳව සිදු වී ඇති අවධානය

ඉතාමත්ම සීමිතය. එමෙන්ම පර්යේෂකයා මෙහි දී සම්මුඛ සාකච්ඡා සහ යොදාගන්නා ප්‍රශ්නාවලි ක්‍රමවේදය ඔස්සේ ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කරගැනීමට උත්සාහ කරන්නේ තොරතුරු දැනගැනීමේ පනත බලන්ගොඩ නගර සභාව තුළ ක්‍රියාත්මක වීමේ දී මුහුණ බැමට සිදුවන ප්‍රායෝගික ගැටලු සහ අභියෝගයන් හඳුනා ගැනීමටය.

**පර්යේෂණ ගැටලුව**

ජනතාව සතු තොරතුරු දැනගැනීමේ අයිතිය නීත්‍යානුකූල කිරීමේ අවශ්‍යතාව ඉතා දිගු කලක සිට පැවතුණි. ඒ අනුව අලුතින් ගෙන ආ තොරතුරු දැනගැනීමේ පනත න්‍යායාත්මක ව සලකා බැලීමේ දී ප්‍රජාතන්ත්‍රවාදය විනිවිදකරණය කිරීමේ සාධනීය උත්සාහයක් ලෙස හඳුනාගත හැක. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ බොහෝ අණපනත් මෙන් ම ප්‍රඥප්තීන් ද හුදෙක් ලියවිල්ලකට පමණක් සීමා වීම දැකගත හැකිය. නිදසුනක් ලෙස 2007 ගෙන එනු ලැබූ පුරවැසි ප්‍රඥප්තිය මඟින් ජනතාවට කාර්යක්‍ෂම හා ඵලදායී සේවාවක් සැපයීම අරමුණු කරනු ලැබීය. එසේ වුවත් තවමත් බොහෝ රාජ්‍ය ආයතන තුළ අකාර්යක්‍ෂමතාවන් මෙන් ම ජනතාවට සමීප නොවූ පරිපාලන ක්‍රමවේදයන් ද දැකගත හැක. තව ද මෙරට තුළ අනෙක් රටවල මෙන් තොරතුරු අයිතිය ඉල්ලා ජනතාව තුළින් ගොඩ නැගුණු අරගලයක් නොපැවතිණි. විශේෂයෙන් ඉන්දියාව වැනි රටවල ජනතාව වීදි සටන් ක්‍රියාමාර්ග පවා ගනු ලැබූ අතර ඒ තුළින් තොරතුරු අයිතිය උදෙසා මහජන හඬක් නිර්මාණය වුණි. එවැනි ජන අරගලයක් තොරතුරු අයිතිය උදෙසා මෙරට ගොඩ නොනැගීම නිසාවෙන් මෙරට ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පුළුල් දැක්මක් පවතී ද? යන්න ද ගැටලුවකි.

එවන් පසුබිමක් තුළ අලුතින් ක්‍රියාත්මක වන 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණපාන ගැටලු හා අභියෝගයන් මොනවා ද? යන්න මෙම අධ්‍යයනයේ ප්‍රධානතම අභියෝගය වී ඇත.

**පර්යේෂණ අරමුණු**

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී ප්‍රධාන අරමුණ ලෙස හඳුනා ගනු ලැබුවේ තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී, ඇති විය හැකි ප්‍රායෝගික ගැටලු හා අභියෝග මොනවා ද යන්න හඳුනා ගැනීමයි. මෙම ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පර්යේෂකයා අනු අරමුණු කිහිපයක් ද යොදා ගනු ලැබීය. එනම් තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව ජනතාව සහ නිලධාරීන් සතු අවබෝධය හඳුනා ගැනීමත් නිලධාරීන් සතු වගවීමේ ප්‍රමාණය අවබෝධ කර ගැනීමත්ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය මිශ්‍ර ක්‍රමවේදය යටතේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත යොදා ගනිමින් සිදු කොට තිබේ. සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. මෙම අධ්‍යයනයෙහි නියැදිය සකස් වූයේ බලංගොඩ නගර සභාවෙන් සේවාවන් සේවා ලබා ගැනීමට පැමිණෙන සාමාන්‍යය ජනතාව 50ක් සහ විධායක ශ්‍රේණියේ නිලධාරීන් පස්දෙනෙකුගෙනි. සරල සසම්භාවී ක්‍රමවේදය අනුව සාමාන්‍ය ජනතාව 50ක් තෝරා ගනු ලැබූ අතර අර්ධව්‍යුහගත ප්‍රශ්න මාලාවක් මඟින් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. අනෙක් විධායක ශ්‍රේණියේ නිලධාරීන් පස්දෙනාගෙන් සම්මුඛ සාකච්ඡා තුළත් පර්යේෂණයට බඳුන් කෙරිණි. එහි දී එක් සාකච්ඡාවක් සඳහා විනාඩි තිහක පමණ කාලයක් වැය කොට ගනිමින් දත්ත රැස් කර ගන්නා ලදී.

ද්විතීයික දත්ත රැස් කිරීමේ දී පොත්පත් පර්යේෂණ ලිපි සහ සඟරා පර්යේෂණ වාර්තා සහ අන්තර්ජාලයේ හරහාත් දත්ත ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් මෘදුකාංගය ද ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක අන්තර්ගත විශ්ලේෂණය උපයෝගී කොටගනු ලැබූ අතර දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු ප්‍රස්තාර රූප සටහන් හා සිතියම් යොදා ගන්නා ලදී.


**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණපාන ප්‍රධාන ගැටලු සහ අභියෝග රැසක් බලන්ගොඩ නගර සභාව ඇසුරින් සිදුකරන ලද අධ්‍යයනය ඇසුරින් හඳුනාගත හැකි විය. ඉදිරිපත් කරන මෙම අභියෝග සහ ගැටලුවල ප්‍රධාන අරමුණ වන්නේ අනාගත ප්‍රතිපත්ති සාධනයෙහිලා අවශ්‍ය පාරදෘශ්‍යභාවය ගොඩනැගීමය.

**පනතෙහි ක්‍රියාත්මකභාවය හා පනත පිළිබඳ දැනුවත්භාවය**


ශ්‍රී ලංකාව තුළ හඳුන්වා දෙන නව පනත ක්‍රියාත්මක වීමේ දී ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇත්තේ පනත පිළිබඳව පවත්නා අල්ප දැනුම සහ අවබෝධයයි. එම තත්ත්වය ඉහළ සිට පහළට ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යයන්හි ප්‍රධාන අභියෝගයක් බවට පත් වී ඇත. තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී ද පර්යේෂණය තුළින් එම තත්ත්වය හඳුනාගත හැකි විය.

රූපසටහන 1: පනතෙහි ක්‍රියාත්මකභාවය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)

රූපසටහන 2: පනත පිළිබඳ දැනුවත්භාවය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)


පනත් ක්‍රියාත්මක වීම පිළිබඳව බහුතරයක් සවිඥානිකව සිටිය ද පනත පිළිබඳව අවබෝධයක් පවතින්නේ ඉතාම අඩු පිරිසකට බව මෙම දත්තවලින් පැහැදිලි වේ. තොරතුරු යනු සමාජ ආර්ථික සහ දේශපාලන සංවර්ධනයෙහි දී අත්‍යාවශ්‍ය සාධකයකි. තොරතුරු පිළිබඳව සවිඥානික වීම වූ කලී ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මකවීම පිළිබඳව සක්‍රියව සිටීමය. එහෙත් ජනතාවට අත්‍යවශ්‍යම පනතක් වූ තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව ඔවුන් දැනුවත් නොවීම ප්‍රබල අභියෝගයකි. එම තත්ත්වය ජනතාව මත පමණක්ම සීමා වන තත්ත්වයක් ලෙස සැලකිය නොහැකිය. බිම් මට්ටමට ළඟා වන විට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිලධාරින් ද සවිඥානික නැත. බලන්ගොඩ නගර සභාවේ නිලධාරින් සම්බන්ධ කර ගනිමින් සිදු කළ සම්මුඛ සාකච්ඡාවන් මගින් ද හඳුනාගත හැකි වූයේ ද එම තත්ත්වයයි.

“මූලික දේවල් පිළිබඳ අවබෝධයක් තියෙනව,ඒත් හොඳටම නම් දන්නෙ නෑ”

“100%ක් ම නම් නෑ, ටිකක් දන්නව ඉතින්”

බලංගොඩ නගර සභාවේ නිලධාරියකු විසින් සිදු කළ මෙම ප්‍රකාශනයන් මගින් පැහැදිලි වන්නේ බොහොමයක් නිලධාරීන් පනත ක්‍රියාත්මක වීම පිළිබඳව දැනගෙන සිටිය ද පනතෙහි අන්තර්ගතය හා සම්බන්ධ දැනුමෙහි අවකාශයන් සීමිත මට්ටමකින් පවත්නා බවයි. දැනුම සහ අවබෝධය ගොඩනැගෙන්නේ පනත පිළිබඳව සමාජය තුළ මතු කරන කතිකාවෙහි ප්‍රමාණය මත පදනම්වය. පනත පිළිබඳව නිවැරදි අවබෝධයක් දෙපාර්ශ්වයමට නොමැති බව පනතෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් සිදු කළ විග්‍රහයෙන් ද පැහැදිලි වේ. නව පනත මගින් ලබාගත හැක්කේ රාජ්‍ය අංශයට අයත් තොරතුරු පමණි, පෞද්ගලික අංශයන්ට අයත් තොරතුරු ලබා ගැනීම සඳහා විධිවිධාන පනත තුළ සපයා නැත.

රූප සටහන 3: තොරතුරු ලබා ගත හැකි අංශ




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)


පනත හරහා රාජ්‍ය අංශයෙන් තොරතුරු ලබා ගත හැකි බව 44% පවසන අතර, 56%ක් පවසන්නේ රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙන්ම තොරතුරු ලබාගත හැකි බවයි. මෙම දත්තයන්ට අනුව නැවත වාරයක් තහවුරු වන කරුණ වන්නේ මහජනතාවට පනත පිළිබඳ නිවැරදි දැනුවත්භාවයක් නොමැති බවයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකෙහිම තොරතුරු ලබාගත හැකි බව 56%ක් පැවසීම එයට හේතුවයි. 'පනත මඟින් ආවරණය කිරීමට උත්සාහකර ඇත්තේ පොදු අධිකාරීන් පමණක්ය', යන සන්නිවේදනය නියම ආකාරයෙන් ජනතාව වෙත ගලාගොස් නැති බව ඉන් පැහැදිලි වේ. සම්මුඛ සාකච්ඡාව දෙස අවධානය යොමු කිරීමේ දී ⅖ ක් රාජ්‍ය අංශයේ තොරතුරු පමණක් ලබාගත හැකි බව දක්වයි. ⅗ ක් ම පවසනුයේ නව පනත මඟින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේ ම තොරතුරු ලබාගත හැකි බවයි. ඒ අනුව ආයතනික විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට ද පනත පිළිබඳ නිවැරදි සහ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බව හඳුනාගත හැකිය.

"අංශ දෙකම පුළුවන් කියල මම හිතනව, වෙන්න ඕනත් ඒක නේද?"

"රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකම පුළුවන් කියල මම හිතනව"

බිම් මට්ටමේ දී ජනතාවට සහ නිලධාරින්ට පැහැදිලි සහ නිරවුල් ලෙස තොරතුරු ලැබිය යුතුය. එනම් තොරතුරු ලැබෙන මාර්ග ඒවායෙහි සාධනීයභාවය පිළිබඳව වඩාත් විවෘත සාකච්ඡාවක් සමාජය තුළ ගොඩනැගිය යුතුය.

රූපසටහන 4: පනත පිළිබඳ දැනුවත් වීමේ මාර්ග සහ එහි ශක්‍යතාවයන්





(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)

තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ දැනුවත් වූ ආකාරය විශ්ලේෂණයේ දී හඳුනාගත හැකි වූයේ විද්‍යුත් සහ මුද්‍රිත මාර්ගයන්ගෙන් වැඩි වශයෙන් දැනුවත් වූ බවයි. ප්‍රතිශතයක් ලෙස 16%ක් වූ පිරිසක් පමණක් වෙනත් මාර්ගයන්ගෙන් දැනුවත් වූ බව පැහැදිලි වේ. එහෙත් ප්‍රධාන ගැටලුව පවතින්නේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන්හි වැඩි ඉඩක් හිමිවන්නේ ප්‍රතිපත්තිමය කාරණාවන් පිළිබඳව සංවාදයන් ගොඩනැගීමට වඩා ජනප්‍රිය දේශපාලන සහ වෙනත් කාරණාවන් සම්බන්ධයෙන් වීමය. එම තත්ත්වය හේතුවෙන් තොරතුරු දැනගැනීමේ පනත සහ එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධව පුළුල් සාකච්ඡාවක් සිදු වී තිබේ ද යන්න අභියෝගාත්මකය.

පනත පිළිබඳව ගොඩනැගී ඇති දැනුවත් වීමේ වටපිටාව ඉතාම සීමිත හා පටු පරාසයක පැවතීම හේතුවෙන් පනතෙහි අන්තර්ගත ප්‍රතිපත්තීන් පිළිබඳව අවධානයක් ජනතාව මෙන්ම නිලධාරීන් ද නැත. පනත් කෙටුම්පතක් ලෙස තොරතුරු දැනගැනීමේ පනත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ

අවස්ථාවේ දී, තොරතුරු ලබා දීම සඳහා දින 49ක් තරම් දිගු කාලයක් ලබා දී තිබිණි. අනතුරුව සංශෝධන ද සහිතව සම්මත කිරීමේ දී එය දින 14කට සීමා කරනු ලැබීය.


රූප සටහන 5: තොරතුරක් ඉල්ලුම් කළ විට පිළිතුරු ලැබීමට ගත වන කාලය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)

පනතට අනුව සැබෑලෙස ම තොරතුරු ඉල්ලීමක් කිරීමෙන් අනතුරුව දින 14ක් ඇතුළත ප්‍රතිචාර දැක්විය යුතු වුවත් ජනතාව ඒ පිළිබඳව නිසි අවබෝධයක් නොමැති බව මෙම සොයාගැනීම් තහවුරු කරයි. ඒ අනුව 80%ක් වූ පිරිසට මේ පිළිබඳ නිවැරදි වූ දැනුවත් බවක් නොමැත. මේ සමගම අවධානය යොමු කරනු ලැබූ අනෙක් කරුණ වූයේ තොරතුරු නිලධාරියා විසින් තොරතුරු ලබා දීම පැහැර හැරීම, සාවද්‍ය තොරතුරු ලබාදීම වැනි ක්‍රියාවක් කළ අවස්ථාවක දී එයට ගතයුතු පියවර පිළිබඳ දැනුවත්භාවයක් පවතිනවා ද යන්න අනාවරණය කර ගැනීමයි.

රූප සටහන 6: තොරතුරු නිලධාරියා පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)


තොරතුරු නිලධාරියාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ නොහැකි බව 28%ක පිරිසක් ප්‍රකාශ කරයි. පැමිණිලි ඉදිරිපත් කළ හැකි බව 72%ක ප්‍රතිශතයක් ප්‍රකාශ කළත් පැමිණිලි ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් වෙත ද යන්න නිසි අවබෝධයක් 44%ක පිරිසකට නොමැත. 56%ක් පවසන්නේ උසස් හෝ ඉහළ නිලධාරියා වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි බවයි. සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ නිලධාරීන්ට ද මේ පිළිබඳ සැලකිය යුතු මට්ටමේ අවබෝධයක් නොමැත.

“මම හිතන්නේ පළාත් පාලන කොමසාරිස්, අමාත්‍යාංශ ලේකම් වගේ කාටහරි පුළුවන් වෙයි.”

“මට හරියට ම ඒ ගැන අදහසක් නැහැනෙ. කාටහරි පුළුවන් නේද?”


තොරතුරු දැනගැනීමේ පනතෙහි තිරසර සමාජීය පැවැත්ම අභියෝගාත්මක වන ආකාරය මෙම විශ්ලේෂණයන් මගින් පැහැදිලිය. පනතෙහි අතිශය වැදගත් ප්‍රතිපත්තියක් වූයේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පිහිටුවීමයි. ඒ පිළිබඳව වූ අවබෝධය එතරම් සුබවාදී නැත.

රූප සටහන 7: කොමිෂන් සභාව පිළිබඳ දැනුවත්භාවය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)

රූප සටහන 8: කොමිෂන් සභාවෙහි වැදගත් බව





(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)

තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පිළිබඳ දැනුවත්භාවය සැලකීමේ දී 38% වැනි සුළු පිරිසකට පමණක් අවබෝධයක් පවතින බව ප්‍රකාශ විය. 62%ක් වූ වැඩි පිරිසට තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පිළිබඳ අදහසක් නොමැති බව සනාථ විය. එසේ වුවත් නියැදි තොරතුරුවලට අනුව පෙනී යන කරුණ වනුයේ 84%ක් වන පිරිස තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව වැදගත් ආයතනයක් ලෙස සලකන බවයි. 16%ක් වූ පිරිසකට ඒ පිළිබඳ අදහසක් නොමැති ආකාරයක් දැකගත හැකි විය. කෙසේ නමුත් මේ පිළිබඳව පවතින අනෙක් ගැටලුව වන්නේ මෙරට විවිධ අරමුණු සඳහා ආරම්භ කළ විවිධාකාර කොමිෂන් සභා දැකගත හැකි වුව ද ඒවායෙහි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තුළ සක්‍රිය දායකත්වයක් එම ආයතන තුළින් දැකගත නොහැකි වීමයි. නිදසුන් ලෙස මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාවක් පැවතිය ද එයට ගතහැකි ඉහළ ම ක්‍රියාමාර්ගය වන්නේ නිර්දේශ ලබාදීම පමණි. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව ද එවැනි ඵල රහිත ආයතනයක් වේද යන සාධාරණ සැකයක් පවතින බව එක් නිලධාරියෙකු ප්‍රකාශ කළේ ය.

ඕනෑම ප්‍රතිපත්තියක් සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා නිලධාරීන්ගේ කැපවීම සහ ඔවුන්ගේ වගවීම අත්‍යවශ්‍ය වේ. බිම් මට්ටමේ නිලධාරින් වූ කලී ප්‍රජාව සමඟ සෘජුව සම්බන්ධ වන ඔවුන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් තම සේවාවන් ක්‍රියාත්මක කිරීමට සූදානම්ව සිටින නිලධාරින්ය. තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව ඔවුන් දැනුවත් කොට ඒ පිළිබඳව සවිඥානිකභාවයක් ගොඩනැගීම සම්බන්ධයෙන් නිලධාරීන්ට වැඩි වගකීමක් හිමි වේ.

රූප සටහන 9: නිලධාරීන්ගේ වගවීම




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත 2023)

මෙම විශ්ලේෂණය මගින් පැහැදිලි වන්නේ අධ්‍යයනයට ලක් කරනු ලැබූ බහුතරයක් සාමාන්‍ය ජනතාව නිලධාරීන්ගේ වගවීම එසේත් නැත්නම් පනත පිළිබඳව ජනතාව සතු අවබෝධය වර්ධනය කිරීම සම්බන්ධයෙන් සෘණාත්මක ස්ථාවරයක පසු වී ඇති බවයි. ඊට එක් හේතුවක් වී ඇත්තේ නිලධාරීන්ට ද යම් යම් සීමාකම්වලට යටත්ව තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමට සිදු වී තිබීමය. ඒ තුළින් නිලධාරීන් තොරතුරු සැපයීමට මැලිකමක් දැක්වූ බව පෙනී යයි. තොරතුරු හෙළි කිරීම මත අනවශ්‍ය ප්‍රශ්නවලට මැදි විය හැකි යැයි ඔවුන් තුළ පැවති බිය ද මෙයට හේතු වන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. සම්මුඛ සාකච්ඡාවක දී එක් නිලධාරියකු සිදු කළ පහත සඳහන් ප්‍රකාශනයෙන් ඒ බව පැහැදිලි වේ.

> “කලින් ඒකට කැමැත්තක් තිබුණෙ නැහැ වගේම අවසරයක් තිබුණෙත් නැහැ. ආයතන ප්‍රධානියාගේ අනුමැතියක් නැතිව මොනවත් කරන්න බයයිනෙ ඉතින්...”

> “සමහර ඒවා දීල තියෙනව ඒත් සමහර වෙලාවට අකමැති වෙනව. රහස්‍යභාවය රකින ඒවා හැර අනික් ඒවා දෙනව”

මෙමගින් අනාවරණය වන ප්‍රධාන කරුණක් වන්නේ ශ්‍රී ලංකාව විවෘත ආණ්ඩුකරණයට සූදානම් ද නැද්ද යන ප්‍රධාන තර්කයයි. තොරතුරු දැනගැනීමේ පනත විවෘත ආණ්ඩු කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රධාන වැදගත් සන්ධිස්ථානයකි. එහෙත් තොරතුරු දැනගැනීමේ පනත සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රජාව සමඟ ඍජුව ගනුදෙනු කරන බලංගොඩ නගර සභාව වැනි ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනයක සිදු කරනු ලැබූ මෙම පර්යේෂණය මගින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව තවදුරටත් විවෘත ආණ්ඩුකරණය පිළිබඳ සාකච්ඡාවට පිටුපසින් පවත්නා රාජ්‍යයක් වන බවයි. ඕනෑම පනතක් ක්‍රියාත්මක වීම සාර්ථක වන්නේ පනත පිළිබඳ නිසි අවබෝධය සහ දැනුම සමාජය තුළ පවතින්නේ නම් පමණි. ඒ සඳහා ජනතාව රාජ්‍ය නිලධාරීන් මෙන්ම දේශපාලන අධිකාරිය සතු වග වීම ද අමතක කළ නොහැකිය. පනත සමාජය තුළ සවිඥානික කිරීම පිළිබඳව මාධ්‍ය හරහා පුළුල් සන්නිවේදනයක් ගොඩනැගීම ඉහළ දේශපාලන අධිකාරිය සතු මූලික වගකීමකි. එමගින් පනතෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සමාජය දක්වන බලපෑම ධනාත්මකව වර්ධනය කරගත හැකිය. එහෙත් බලන්ගොඩ නගර සභාවේ නිලධාරීන් මෙන්ම එහි සේවාවන් ලබන ජනතාව ද තොරතුරු දැන ගැනීමේ පනත හා එහි අන්තර්ගතයන් පිළිබඳව තවමත් නිසි අවබෝධයකින් පසුවන බවක් නොපෙනේ.

**නිගමනය**

තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණ පාන ගැටලු සහ අභියෝග පිළිබඳ බලංගොඩ නගර සභාව ආශ්‍රයෙන් කරනු ලැබූ විශ්ලේෂණය තුළින් පහත නිගමනයන්ට එළඹිය හැකි විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමේ දී ඇති විය හැකි ප්‍රායෝගික ගැටලු හා අභියෝග මොනවා ද යන්න හඳුනා ගැනීමයි. එකී අරමුණ පිළිබඳ ව සලකා බැලීමේ දී හඳුනාගත හැකි වූයේ පනත පිළිබඳ සතුටුදායක මට්ටමේ අවබෝධයක් මහජනතාවට මෙන් ම රාජ්‍ය නිලධාරීන්ට ද නොපවතින බවයි. විශේෂයෙන් ම නගර සභාවේ ඒ ඒ අංශයේ ඉහළ නිලධාරීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේ දී හඳුනාගත හැකි වූයේ, ඔවුනට ද පනත පිළිබඳ නිවැරදි අවබෝධයක් නොපවතින බවයි. පනත පිළිබඳ අංශ ප්‍රධානීන් සතු අවබෝධය ද එතරම් පහළ මට්ටමක පවතී නම්, කණිෂ්ඨ නිලධාරීන්ගෙන් ඊට වඩා සාධනීය පිළිතුරක් අපේක්ෂා කළ නොහැකිය. තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වී දීර්ඝ කාලයක් ගතවී ඇතත් තවමත් අවම වශයෙන් එක් පුද්ගලයෙකුවත් තොරතුරු ලබාගැනීම සඳහා ඉල්ලීමක් සිදු කර නැත. බලංගොඩ නගර සභාව තුළ එක් පුද්ගලයෙකුවත් තොරතුරු ඉල්ලුම් කර නොතිබීම තුළ පනත තවමත් මෙරට සාර්ථක වී නොමැති බව නිගමනය කළ හැකිය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුව වී ඇත්තේ පනත පිළිබඳ ජනතාවගේ නොදැනුවත් භාවයයි. ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීම හරහා නිගමන රාශියක් වෙත එළඹීමට හැකි විය. ඒ අනුව තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වන බව බහුතරයක් දෙනා දැන සිටිය ද පනත පිළිබඳ අවබෝධයක් පවතින්නේ ඉතාමත් සුළු පිරිසකට පමණි. අති බහුතරයක් දෙනා තමන්ට තොරතුරු දැනගැනීමට අයිතියක් පවතින බව විශ්වාස කරයි. එහෙත් එයට හේතුව පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොමැත. පනත ක්‍රියාත්මක වීමට පෙර රාජ්‍ය ආයතන විනිවිදභාවයෙන් කටයුතු නොකළ බව තවදුරටත් විශ්ලේෂණය කිරීම මඟින් සනාථ විය. සමස්තයක් ලෙස තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ දැනගැනීමේ කැමැත්තෙන් ජනතාව මෙන් ම නිලධාරීන් ද පසුවන බව සඳහන් කළ හැකිය. පනතෙහි දුර්වලතාවයන් අවබෝධකර ගැනීම ද මෙම අධ්‍යයනයේ තවත් අනු අරමුණක් විය. මෙහි දී පර්යේෂකයා විසින් පනතෙහි ප්‍රධානතම දුර්වලතාවයක් ලෙස පනත මඟින් ම තොරතුරු දැනගැනීමේ අයිතිය සීමාකර තිබීම හඳුනා ගන්නා ලදී. නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාවට අදාළ තොරතුරු පිළිබඳ රහසිගත මූලාශ්‍රයක අනන්‍යතාවය හෙළිවන අවස්ථාවක දී සහ රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට බරපතල ලෙස අගතිදායක වන අවස්ථාවක තොරතුරු ලබා දීම නොකළ යුතු බවට පනතෙහි දැක්වේ. ආණ්ඩුව විසින් රාජ්‍ය ආරක්ෂාව අර්ථ විවරණය කරණුයේ යම් සේ ද, එම සියලු කරුණු ජනතාවට නිරාවරණය කිරීම මේ යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බවට මේ මඟින් පත් වේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වීමේ දී මුහුණ පෑ ගැටලු සහ අභියෝග පිළිබඳ විශ්ලේෂණය කිරීම මගින් පැමිණි නිගමනයන්ට අනුරූපව යෝජනා කීපයක් පහත පරිදි ඉදිරිපත් කළ හැකිය. තොරතුරු දැනගැනීමේ පනත ජනතාව වෙත සමීප කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු වේ. එලෙස ජනතාව වෙත සමීප කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කළ හැකිය. පාසල් විෂය නිර්දේශයට තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළත් කිරීම කළ යුතු වේ. එමගින් රාජ්‍ය අධිකාරීන්ගෙන් තොරතුරු විමසීමේ හුරුව පාසල් තුළින් ම ලබා දීමට හැකි වේ. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් පනත ජනතාව වෙත සමීප කිරීම සඳහා පුළුල් ප්‍රචාරණ වැඩ පිළිවෙලක් පවත්වාගෙන යා යුතු වේ. ඒ තුළින් පනත පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කළ හැකිය. බිම් මට්ටමේ සිට වැඩමුළු මගින් ජනතාව දැනුවත් කළ යුතු වේ. ඒ තුළින් තොරතුරු ඉල්ලා සිටීමට පෙළඹවීම සිදු කළ යුතු වේ. පනතෙන් සාර්ථක ප්‍රතිලාභ ලබාගත හැකි වන්නේ එයට පවතින මහජන සහභාගිත්වය උපරිම කිරීම මගිනි. නිලධාරීන්ගේ පුහුණුව වැඩි දියුණු කළ යුතුය. ආයතනයේ තොරතුරු නිලධාරියාට පමණක් සම්මන්ත්‍රණ මගින් යම් දැනුවත් කිරීමක් සිදු කර ඇත. එබැවින් ආයතනයේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය කළ යුතුය. ආයතනයකට එක් තොරතුරු නිලධාරියකුට වඩා පත් කළ යුතුය. තොරතුරක් ඉල්ලුම් කළ විට එම තොරතුරු සැපයීමට එක් නිලධාරියකු නොව නිලධාරීන් කීපදෙනෙකු පත්කළ යුතුය. ආයතනික තොරතුරු සැපයීමේ සම්පූර්ණ බලය තොරතුරු නිලධාරියකුට ලබා දිය යුතුය. තොරතුරු නිලධාරියාට තොරතුරු සැපයීමට ඉහළ නිලධාරීන්ගෙන් විමසීමට අවශ්‍ය නොවන ආකාරයෙන් විධිවිධාන සැපයිය යුතුය. පරිපාලනය සමඟ පවතින දුරස්ථභාවය නිසා තොරතුරු ඉල්ලුම් කිරීමට ජනතාව විසින් මැලිකමක් දක්වයි. එබැවින් ජනතාවට සමීප වූ පරිපාලන ක්‍රමයක් ඇති කළ යුතුය. තොරතුරු පනත මගින් ආයතනික තොරතුරු වෙබ් අඩවි මගින් ප්‍රදර්ශනය කළ යුතු බව දක්වා තිබුණ ද, තවමත් එය සක්‍රීයව ක්‍රියාත්මක නොවෙයි. එබැවින් එය සක්‍රීය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය. පනත මගින් පෞද්ගලික අංශයේ තොරතුරු ලබා දීමට ඉඩකඩ හිමිකර දිය යුතුය. මන්ද පාරිභෝගිකයන් ලෙස තමා පරිභෝජනය කරනු ලබන භාණ්ඩ සහ සේවාවන් හි අඩංගුවන ද්‍රව්‍ය, ප්‍රමිතිය යනාදිය පිළිබඳ දැනගැනීමට ජනතාවට අයිතියක් පැවතිය යුතුය.

**සමුද්දේශ**


Gihan Gunathilaka, (2014). Right to Information: A Study for Advocates-(eds). Sri Lanka Press Institute Publication, Colombo 05.

Jaspal Singh, (2016). Right to Information Act: A Study about Awareness. International Research Journal of Commerce Arts and Science. 7 (5).

Kumar, P.S.G., (2004). Information & Communication. B.R. publications. Vol 8: Paper IX of UGC Model Curriculum Hardcover. pp.28-47.

Kumara, M.T.T.R., (2019). Right to Information Act: A Case Study on Sri Lanka. General Sir John Kotelawala Defense University, Sri Lanka. KDU Library. Available on http://ir.kdu.ac.lk/handle/345/2056-

Nigam Shalu. (2015). The Right to Information Act: Ten Years of Transparency or a Decade of Ambiguity. SSRN International Journal,10 (03): pp.1-13.

Paul, Samuel., (2003). Right to Information on Candidates: How Will the Voters Know? Economic and Political Weekly. Vol.38, No.15. pp.1447-1449.

Pinto Jayawardena K., (2019). Reflection on Sri Lank's RTI Act & RTI Regime. A publication of the RTI Commission of Sri Lanka.

Right to Information Act, No.12 of 2016, Parliament of the Democratic Socialist Republic of Sri Lanka, Published as a Supplement to Part II of the Gazette of the Democratic Socialist Republic of Sri Lanka.

Saujan, Iqbal., (2022). The Right to Information Act and its Implementation in Sri Lanka: An Empirical Analysis. Available at SSRN: https://ssrn.com/abstract=4159376 or http://dx.doi.org/10.2139/ssrn.4159376

**ආඛ්‍යාන narrations**
**Volume 10 | Issue 01 | January-June 2025 | Article 02**
**ISSN 2478-0642**

Open Access, Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies, Sabaragamuwa University of Sri Lanka
Submit your academic papers to director@cikcs.sab.ac.lk
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

---

# තත්කාලීන විචාරකයා කොළඹ යුගයේ දෙවැනි පරපුරේ කවිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාව්‍ය විචාරයෙහි ප්‍රාමාණිකත්වය පිළිබඳ අධ්‍යයනයක්

**බී.එම්.බී.ජී. තාරුෂිකා ලක්ෂානි ජයරත්න,** සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය,
lakshanibm97@gmail.com

**Received:** 31 December 2023 / **Revised:** 14 June 2024 / **Accepted:** 10 July 2024

**සාරසංක්ෂේපය**

සාම්ප්‍රදායික සිංහල පද්‍ය සාහිත්‍යයේ නව මං විවර කළ යුගයක් ලෙස කොළඹ සාහිත්‍ය යුගය හඳුනාගත හැකි වේ. එතෙක් පැවැති පණ්ඩිත ප්‍රිය, විදග්ධ කාව්‍ය සම්ප්‍රදාය විචල්‍යතාවට ලක් කරමින් ජන ජීවිතය පිළිබඳ සිතුම් පැතුම් දන්නා නිර්ව්‍යාජ කාව්‍ය රීතියක් මෙකල බිහි වන්නට විය. කොළඹ යුගයේ කවිය පළමු පරපුර සහ දෙවන පරපුර ලෙස පරම්පරා දිවිත්වයක් ඔස්සේ හඳුනා ගැනේ. පළමු පරපුර තත්කාලීන සමාජ සංදර්භය පිළිබඳ අවධානය යොමු කළ අතර, දෙවන පරපුර ඉන් ආභාසය ලබමින් විවිධ තේමා ඔස්සේ කාව්‍යකරණයේ යෙදෙමින් ජන ජීවිතය හා ඒකාබද්ධ විය. මෙම කාව්‍යය නිර්මාණ තත්කාලීන බොහෝ විචාරකයන් සාධනීය විචාරයකට ලක් කර නොමැත. කොළඹ යුගයේ දෙවන පරපුරේ කවිය සම්බන්ධ ව තත්කාලීන විචාරකයාගේ කාව්‍ය විචාරය කවරාකාරවේ ද යන ගැටලුව මුල් කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේ අරමුණ වූයේ, තත්කාලීන විචාරකයා කොළඹ යුගයේ දෙවන පරපුරේ කවිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාව්‍ය විචාරයෙහි ප්‍රාමාණිකත්වය විමසීමයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි ගුණාත්මක දත්ත සහ තොරතුරු පුස්තකාලය භාවිතයෙන් සහ අන්තර්ජාලය පරිශීලනයෙන් සපයා ගන්නට වුණි. ගුණාත්මක දත්ත උපයෝගී කොට ගනිමින් සිදු කළ මෙම පර්යේෂණය ඔස්සේ කොළඹ යුගයේ දෙවන කවි පරපුර පිළිබඳ තත්කාලීන විචාරකයා ඒකාකාරී මතයක් දරන බව ගම්‍යමාන විය. විශේෂයෙන් මෙහි දී ආරිය

රාජකරුණා, එදිරිවීර සරච්චන්ද්‍ර, කුලතිලක කුමාරසිංහ, ගුණදාස අමරසේකර වැනි තත් යුගයේ විචාරකයින් කොළඹ දෙවන කවි පරපුරේ කවිය පිළිබඳ සිදු කළ විචාර පිළිබඳ සෘජු අවධානයක් යොමු කරන්නට වුණි. මොවුන් කරුණු කිහිපයක් තේමා කොට ගනිමින් කාව්‍ය විචාරය කර ඇති අතර ම එම සැම කරුණක් ම පාහේ කාව්‍යකරණයේ නිශේධනීය බව ප්‍රකට කරවයි. එහෙත් මෙහි දී නිර්මාණකරු කාව්‍යකරණ ශක්‍යතාවෙන් අනූන වූවත්, විචාරකයාගේ දෘෂ්ටිය ඒ මත නොපිහිටා ඇත්තේ නම් එය ප්‍රාමාණික නොවන බව දක්වා ඇත. ඒ අනුව කොළඹ යුගයේ දෙවන පරපුරෙහි කාව්‍ය නිර්මාණ හා සම්බන්ධව ඉදිරිපත්ව ඇති තත්කාලීන විචාර සියල්ල ම පාහේ නිශේධනීය නොවන බවත්, ඇතැම් අවස්ථාවල දී එක් කවියක් හෝ දෙකක් මත පිහිටා එම යුගයේ සමස්ත කවිය නිශේධනීය මට්ටමක පවතිනවා යැයි සැලකීම යුක්ති සහගත නොවන බව මෙම පර්යේෂණය ඔස්සේ අනාවරණය විය.

**ප්‍රමුඛ පද:** *කොළඹ යුගයේ දෙවන කවි පරපුර, කාව්‍ය විචාරය, ප්‍රාමාණිකත්වය*

## හැඳින්වීම

සාහිත්‍ය විචාරය වූ කලී කිසියම් සාහිත්‍ය කෘතියක අර්ථය හා රසය ගැඹුරින් උකහා ගැනීමේ සියුම් වින්දන ශක්තියකින් යුත් විද්වතුන් විසින් එකී කෘතිවල නිර්මාණ ශක්‍යතා සහ සාර්ථක අසාර්ථක බව අරබයා නිර්මාණ හේතු යුක්ති දක්වමින් ඉදිරිපත් කරනු ලබන තර්කානුකූල ප්‍රකාශනයකි. එනම්, කෘතියක් විශ්ලේෂණය කොට එහි තත්ත්වය නිර්ණය කිරීමත්, එමඟින් රුචිකත්වය නිවැරදි කිරීමත්ය. එමෙන් ම විචාරකයා දියුණු සාහිත්‍ය ඥානයකින් හෙබි ජීවිතාවබෝධයෙන් මුහුකුරා ගිය චිරන්තන හා අද්‍යතන විවිධ සාහිත්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුත් පරිණත රසිකයෙකි. මෙසේ විචාරයට ලක් වන මානව චිත්ත සන්තානය ගැඹුරින් ස්පර්ශ කළ හැකි සුවිශේෂී කලා මාධ්‍යයක් ලෙස කවිය හඳුනාගත හැකි වේ. මෙම කවිය පෙර අපර දෙදිග විචාරකයන්ගේ නොමඳ අවධානයට ලක් වූ කලා කෘතියකි. මෙසේ බොහෝ විචාරකයන්ගේ අවධානයට ලක් වූ කවිය හුදු නිර්මාණ කාර්යයට පමණක් ලඝු නොකොට ඒ අරභයා සිදු කෙරුණු විචාර කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ම වේ. කිසියම් වූ නිර්මාණයක් පැහැදිලිව ඇගැයීමකට ලක්වන්නේ විචාරකයාගේ මැදිහත් වීමෙනි. විචාරකයා අදාළ සාහිත්‍ය කෘතියට ප්‍රති අර්ථකථනයක් ලබාදෙමින් සහෘද ප්‍රජාව සමඟ බෙදා හදා ගැනීමක් සිදුකරයි. එච්.එම් කුඩලිගම, පී.බී. අල්විස් පෙරේරා, මීමන ප්‍රේමතිලක, විමලරත්න කුමාරගම, සාගර පලන්සූරිය, බී.එච් අමරසේන වැනි නිර්මාණකරුවන්ගේ පද්‍ය නිර්මාණ සහ එම නිර්මාණ විචාරයට ලක් කළ ආරිය රාජකරුණා, එදිරිවීර සරච්චන්ද්‍ර, කුලතිලක කුමාරසිංහ, ගුණදාස අමරසේකර වැනි තත් යුගයේ විචාරකයන්ගේ විචාර කෙරෙහි අවධානය යොමු කිරීම සහ එම විචාරවල ස්වයං අර්ථකථන අධ්‍යයනය කිරීම ද වැදගත් වේ.

**සාහිත්‍ය විමර්ශනය**

මෙම පර්යේෂණය සඳහා උපයුක්ත කොට ගන්නා ප්‍රාථමික මූලාශ්‍රය සේ සැලකෙන විචාර කෘති කිහිපයක් පහත පරිදි සාහිත්‍ය විමර්ෂණය ඔස්සේ සම්පිණ්ඩනය කොට දැක්විය හැකි වේ.

***ගුණදාස අමරසේකර, සිංහල කාව්‍ය සම්ප්‍රදාය***

අල්විස් පෙරේරා, මීමන ප්‍රේමතිලක, කේයස් ආදි කවීන්ගේ නිර්මාණවලට විෂය වී ඇත්තේ තමා අවට හාත්පස ලෝකයයි. එහි දී එම යථාර්ථවාදී ලෝකය ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා ඔවුන් අනුදත් කාව්‍ය සංකල්ප තේමා ඔස්සේ එම අභිප්‍රාය නිවැරදිව ඉටු වූවේ ද යන්න ගැටලු සහගත බව දක්වා ඇත. ඔවුන්ට අවට ලෝකය ගැඹුරු අත්දැකීම් මඟින් චිත්‍රණය කිරීමට හැකි වී ද? අත්දැකීමෙන් තොර වූ සරුව පිත්තල සමනල ලොවක් මැවීම නොවේ ද ඔවුන් අතින් සිදු වූයේ? ආදි ලෙස මෙම කෘතියේ සඳහන් කොට ඇත. එමෙන් ම මෙම කවිය වාර්තාමය ස්වරූපයක් ගත් හෙයින් මිරිකීමට - ඇඳා ගැනීමට - රසයක් නොමැති බව ද කෘතියෙහි සඳහන් වේ. එබැවින් මෙම විචාර කෘතිය පර්යේෂණය සඳහා පූර්වාදර්ශයක් සේ උපයෝගි කරගත හැකි වේ.

***ආරිය රාජකරුණා, නූතන සිංහල කාව්‍ය 2***

කොළඹ දෙවන පරපුරේ කවීන්ගේ නිර්මාණවලින් සියයට අනූවක් සලකා බලන විට ඒවා රස ජනනයෙන් තොර වූ වාර්තා ස්වරූපයක් ගත් අර්ථ ධ්වනි, ශබ්ද ධ්වනි යන දෙකෙන් ම වියුක්ත වූ පද්‍ය බන්ධනයක් බව මෙහි දක්වා ඇත.

***මාර්ටින් වික්‍රමසිංහ, නව පද්‍ය සිංහලය***

රෝමාන්තික කවියේ හරයට මෙන් ම රවීන්ද්‍රනාත් තාගෝර් වැනි පෙරදිග කවීන්ගේ සිතිවිලි යන දෙඅංශය වෙත ම ප්‍රවේශ වෙමින් කොළඹ දෙවන පරපුරේ කවීන් කාව්‍යකරණයෙහි යෙදී ඇති බව සඳහන් කොට ඇත.

***එදිරිවීර සරච්චන්ද්‍ර, කල්පනාලෝකය***

කොළඹ යුගයේ දෙවන පරපුරේ කවිය පිළිබඳ සාධනීය සාකච්ඡාවක් සිදුකර තිබුණ ද බොහෝ අවස්ථාවල කවිය කාව්‍යමය සංයමයෙන් තොර මෙහි දක්වා ඇත.

මේ ආකාරයට කොළඹ යුගයේ දෙවන කවි පරපුරට අයත් කාව්‍ය නිර්මාණ අළලා සම්පාදනය කෙරුණු විචාර කෘති ඔස්සේ පර්යේෂණය සඳහා උපයෝගී වන දත්ත තොරතුරු සපයා ගත හැකි

වුවත් එම කවියේ සාධනීය බව සාකච්ඡා කොට ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. එකී ඌනතාව පූරණය කිරීම මෙම පර්යේෂණය මඟින් සිදු කෙරී ඇත.

පර්යේෂණ අරමුණු

- තත්කාලීන විචාරකයා කොළඹ යුගයේ දෙවන පරපුරේ කවිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාව්‍ය විචාරයෙහි ප්‍රාමාණිකත්වය විමසීම.
- තත්කාලීන විචාරකයා කාව්‍ය විචාරයෙහි ලා උපයෝගී කොට ගත් විචාර ප්‍රවේශ අධ්‍යයනය.
- කොළඹ යුගයේ දෙවන පරපුරේ කවි පරපුරේ කවියාගේ කාව්‍ය ප්‍රතිභාව අධ්‍යයනය.
- තත් යුගයේ කවියා සහෘද ප්‍රජාව අරබයා සිදු කර ඇති සමාජ යථාර්ථ ප්‍රතිනිර්මාණය පිළිබඳ විමසීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

තත්කාලීන විචාරකයා කොළඹ යුගයේ දෙවැනි පරපුරේ කවිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාව්‍ය විචාරයෙහි ප්‍රාමාණිකත්වය පිළිබඳ අධ්‍යයනයක් යන මැයින් සිදු කළ මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය උපයුක්ත කොට ගන්නට විය. එමෙන් ම පර්යේෂණය සඳහා අවැසි දත්ත හා තොරතුරු රැස් කිරීමේ දී පුස්තකාල භාවිතය සහ අන්තර්ජාල භාවිතය යන පර්යේෂණ විධික්‍රම ද්වය භාවිත කොටගෙන ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

කවිය වූ කලී මානව චිත්ත සන්තානය ගැඹුරින් ස්පර්ශ කළ හැකි සුවිශේෂී වූ කලා මාධ්‍යයකි. එමෙන් ම මිනිස් සන්තානයේ පාරිශුද්ධිය සමඟ එක්ව ගමන් කරන සම්භාවනීය වූ චින්තන විශේෂයක් වශයෙන් ද හඳුනාගත හැකි වේ. "වාක්‍යං රසාත්මකං කාව්‍යයන්" (කුමාරසිංහ, 1988, 09) යනුවෙන් රසය ආත්මය කොටගත් වාක්‍යය කාව්‍ය වන්නේ යැයි සුප්‍රකට සංස්කෘත කාව්‍යාචාර්යවරයකු වන විශ්වනාථ පණ්ඩිතුමා පවසා ඇත. රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍ය වන්නේ යැයි පශ්චාත් කාලීන සංස්කෘත ආචාර්යවරයකු වන ජගන්නාථ පණ්ඩිවරයා පැවසී ය.

මේ ආකාරයෙන් කවිය පිළිබඳ ඉදිරිපත්ව ඇති යථෝක්ත නිර්වචනවලින් විද්‍යමාන වන්නේ කවිය වූ කලී නිර්මාණාත්මක ව්‍යාපාරයක් බවයි. කවිය ගද්‍ය සාහිත්‍ය කෘතියකට සාපේක්ෂව අල්ප වචන මාලාවකින් සමන්විත වුව ද ක්ෂණිකව එක එල්ලේ ම ජනතා හදවතට සන්නිවේදනය වන ප්‍රබල හැඟීමක් දැනවීමෙහි ලා මහත් වූ සමත් බවක් දක්වයි. කවිය ජීවිතයට සෞභාග්‍ය සහ රමණීය

වින්දනයක් ලබා දෙන මාධ්‍යයක් ලෙස ද හඳුනාගත හැකි වේ. කවියා තමා විඳි අත්දැකීමක් සහෘද චිත්ත සන්තානයෙහි පුනර් - නිර්මාණය කිරීමට නම් උත්පාදක ශක්තියෙන් අනූන විය යුතු බව බොහෝ විචාරකයන්ගේ මතයයි. එහෙත් වර්තමානයේ නිර්මාණය වන කාව්‍ය නිර්මාණ පිළිබඳ අවධානය යොමු කරන විට දී උත්පාදක ශක්තියෙන් හෙබි කවීන් දුර්ලභ බව වැටහේ. රුද්‍රට නම් කාව්‍යාචාර්යවරයා දක්වන පරිදි කවියෙක් තුළ මූලිකව පිහිටිය යුතු ලක්ෂණ ත්‍රිත්වයකි. ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය සහ සතත අභ්‍යාසය ලෙස ඒවා හඳුනාගත හැකි ය. අභිනවගුප්ත නම් කාව්‍යාචාර්යවරයා දක්වා ඇත්තේ අපූරු වස්තු නිර්මාණය කිරීමේ හැකියාව කවිය බවයි.

අපූර්වත්වයෙන් සහ අර්ථාන්විත භාවයෙන් පිරි සාර්ථක කාව්‍ය නිර්මාණයක් නිසැකව ම විචාරකයාගේ අවධානයට ලක්විය යුතු මය. සාහිත්‍ය කෘතියකින් හුදෙක් රස වින්දනය පමණක් නොලැබ  එය විචාරයට ලක් කිරීමෙන් එහි සාර්ථක හෝ අසාර්ථක බව කෙරෙහි නිගමනයකට එළඹිය හැකි වේ. සාහිත්‍ය කෘතියක අර්ථය හා රසය ගැඹුරින් උකහා ගැනීමේ සියුම් වින්දන ශක්තියකින් යුත් විද්වතුන් විසින් සාහිත්‍ය කෘතිවල නිර්මාණ ශක්‍යතා හා සාර්ථක, අසාර්ථක බව අරබයා හේතු යුක්ති දක්වමින් ඉදිරිපත් කරනු ලබන තර්කානුකූල ප්‍රකාශනය සාහිත්‍ය විචාරය හෙවත් සාහිත්‍ය විවේචනයයි.

සාහිත්‍ය විචාරකයා වූ කලී හුදෙක් සාහිත්‍ය රස විඳින්නෙක් පමණක් නොවේ, සාහිත්‍යාවබෝධයෙන් ද රස වින්දනය ඉක්මවා ගිය තැනැත්තෙකි. විචාරකයෙක් සතුවිය යුතු ගුණාංග පිළිබඳ අදහස් දක්වා ඇති විමල් දිසානායක, විචාරකයා සතු විය යුතු ගුණාංග කිහිපයක් දක්වා ඇත්තේය. එනම් වින්දන ශක්තිය, බහුශ්‍රැතභාවය, භාෂා නිපුණත්වය, තුලනාත්මක විග්‍රහ ශක්තිය, ආත්ම විශ්ලේෂණ ශක්තිය, අදහස් නිරවුල්ව ඉදිරිපත් කිරීම සහ සමාජ, සංස්කෘතිය පිළිබඳ යථාවබෝධයයි. සාහිත්‍ය විචාරයට එළැඹීමට පූර්වයෙන් විචාරකයා අදාළ සාහිත්‍ය කෘතිය සියුම් වූත් ,සංකීර්ණ වූත්, ගැඹුරු කියවීමකට ලක් කළ යුතු වේ. එහි දී අදාළ විස්තරකථන විශ්ලේෂණය කොට, අර්ථකථනය කොට සහෘද ඥාන මණ්ඩලය සුපෝෂණය කළ යුතුය. එබැවින් විචාරකයා කිසිවිටෙකත් සාහිත්‍ය කෘතියක පවතින සාධනීය බව කෙරෙහි ම පමණක් අවධානය යොමු නොකොට, එහි නිශේධනීය සාධක කෙරෙහි ද අවධානය ලබාදිය යුතුය. එහෙත් මෙම විචාරය සාධාරණ, මැදිහත්, අපක්ෂපාතී බවින් යුක්ත විය යුතුය. මෙවැනි වූ විචාර ඔස්සේ කියැවිය හැකි සාහිත්‍යය නිර්මාණ කෘති සහෘද ප්‍රජාවට ද මනා අවබෝධයකින් යුතුව පරිශීලනය කළ හැකි වේ.

**කොළඹ යුගයේ කවිය**

කොළඹ යුගය ලෙස සාහිත්‍යධරයන් දක්වා ඇත්තේ 1915 කාල වකවානුවේ සිට වර්තමානය දක්වා කාල පරිච්ඡේදයයි. පැරණි කාව්‍ය මාර්ගය අනුදත් එළඹෙන පරම්පරාවේ අනුප්‍රාප්තිකයන් ලෙස කොළඹ කවිය ආරම්භ වන්නේ කාව්‍ය විප්ලවයක පෙර නිමිති පළ කරමිනි. මෙහි දී විශේෂයෙන් කාව්‍ය භාෂාව පිළිබඳ අවධානය යොමු කරන විට දී ඉතාමත් සරල බස් වහරකින් කවිය පෝෂණය කිරීමට මෙකල කවියන් සමත්ව තිබූ බව පැහැදිලි වේ. ජන ජීවිතය පිළිබඳ සිතුම් පැතුම් දන්නා කොළඹ කවීන් පණ්ඩිත ප්‍රිය ගැඹුරු බස් වහර හා අනවශ්‍ය බාහිර සැරසිලි ඉවත් කොට තනාගත් කාව්‍ය රීතිය බොහෝ දුරට නිර්ව්‍යාජ එකක් විය. (රංජිත් සිරිවර්ධන, 1990, 49)

මේ ආකාරයට කථා ව්‍යවහාරයේ පවතින භාෂාව පදනම් කොටගෙන මටසිලුටු කාව්‍ය භාෂාවක් නිපදවීමේ ගෞරවය කොළඹ කවියට හිමි වේ. එහි දී මෙරට උගත් යැයි සම්මත පාර්ශ්වය වෙත පමණක් සීමා වී පැවැති සිංහල කාව්‍ය පොදු ජනයා අතරට රැගෙන ඒමේ ගෞරවය හිමිවන්නේ ද කොළඹ කවියටයි. (රාජකරුණා, 1962, 244-245)

පැවතියා වූ කාව්‍ය සම්ප්‍රදාය අත්හැර දමා ඊට හාත්පස වෙනත් කාව්‍ය දර්ශනයක් අනුදත් කොළඹ කවි පරපුර හඳුනා ගැනීමේ දී ප්‍රචලිත වර්ගීකරණයක් පවතී. එනම් කොළඹ යුගයේ ප්‍රථම භාගයට අයත් කවීන් සහ දෙවන භාගයට අයත් කවීන් වශයෙනි. ඒ ඒ කවීන් කාව්‍ය ක්ෂේත්‍රයට පිළිපන් කාලවකවානුව මෙන් ම ඔවුන්ගේ නිර්මාණවල වස්තුවිෂය සේ ම කාව්‍ය භාෂාව පිළිබඳ ද පූර්ව හැඟීමක් මෙම වර්ගීකරණය ඔස්සේ ලබාගත හැකි වේ. කොළඹ අවධියේ කවින්ගේ පද්‍ය රචනා, වස්තුවිෂය, සන්දර්භය, ආකෘතිය සහ භාෂාව ආදී කරුණු පදනම් කොටගෙන නැවත කොළඹ කවිය කොටස් තුනක් ඔස්සේ හඳුනා ගත හැකිය.

- කොළඹ යුගයේ වැඩිහිටි කවීන්ගේ පද්‍ය රචනා
- කොළඹ යුගයේ තරුණ කවීන්ගේ පද්‍ය රචනා
- හෙළ හවුලේ කවින්ගේ පද්‍ය රචනා (සුනිල් සෙනවි, 2000, 20)

කොළඹ යුගයේ ප්‍රථම සහ ද්විතීය භාගය නියෝජනය කළ කවීන් පිළිබඳ විමසා බැලීමේ දී පැරැණි කවි සමයට නොපටහැනි වූ නව කාව්‍ය නිර්මාණයෙහි ලා සමත්කම් දැක්වූ කවීන් අතර බෙන්තොට ඇල්බට් සිල්වා, පියදාස සිරිසේන, ආනන්ද රාජකරුණා, ජේ. පී. ප්‍රේමතිලක, ජී.එච් පෙරේරා ආදීහු පෙරමුණ ගත්හ. තරුණ කවි පරපුර නියෝජනය කළ කවීන් අතර අල්විස් පෙරේරා, සාගර පලන්සූරිය, මීමන ප්‍රේමතිලක, විමලරත්න කුමාරගම, එච්.එම්. කුඩලිගම ආදීන් හඳුනාගත හැකිය. මෙම කවි

පරම්පරා ද්විත්වය එකිනෙකට විසම වූ කාව්‍ය අරමුණු පෙරදැරි කර ගනිමින් නිර්මාණකරණයේ යෙදී ඇත.

කොළඹ යුගයේ මුල් පරපුර අධිරාජ්‍යවාදී ආක්‍රමණ මඟින් සුන්බුන්ව ගිය ජාත්‍යාලය, දේශාභිමානය, සංස්කෘතිය නඟා සිටුවීම අරමුණු කොට ගනිමින් සිය කාව්‍ය නිර්මාණ බිහි කරන්නට විය. දෙවන කවි පරපුර ඇතැම් නිර්මාණ ඔස්සේ ප්‍රේමය තේමා කරගත්ත ද බොහෝ විට අක්‍රමිකතාවට පත්ව තිබූ සමාජ, ආර්ථික, දේශපාලන සංරචක ඔස්සේ පීඩාවට පත් ජන ජීවිත නැවත යහපත් ආකාරයකින් නඟා සිටුවීම අරමුණු කොටගත් කාව්‍ය නිර්මාණ බිහිකරන්නට විය.

දෙවන කවි පරපුර නියෝජනය කළ කවීන්ගේ නිර්මාණ ඔස්සේ ඔවුන් අත්විඳි සමාජ, ආර්ථික, සන්දර්භය විවරණය කරගත හැකි වේ. එමෙන් ම ඒ ඒ කවියන් අනුදත් කාව්‍ය මාර්ග සහ ශක්‍යතා එකිනෙක වෙනස් මඟක් ගෙන ඇත. ඒ අනුව කොළඹ යුගයේ දෙවන කවීන්ගේ කාව්‍ය නිර්මාණවලින් තත්කාලීන සමාජය අවබෝධ කරගත හැකි අතර ම, වැඩිහිටි කවීන් පැවැති සාම්ප්‍රදායික කවිය අභියෝගයට ලක් කළ ආකාරය ද හඳුනාගත හැකි වේ.

**කොළඹ යුගයේ දෙවැනි කවි පරපුර කාව්‍ය විචාරය කිරීමෙහි ලා අනුදත් විචාරයෙහි ප්‍රාමාණිකත්වය**

කොළඹ යුගයේ දෙවන කවි පරපුරෙහි කවිය සහ කවියා පිළිබඳ බොහෝ දෙනාගේ අවධානයට ලක්ව ඇත. මෙහි දී එකිනෙකා අනුදත් කාව්‍ය විචාර ප්‍රවේශ සහ සංකල්ප බොහෝ විසමරූපී ස්වභාවයක් දරයි. කොළඹ දෙවන පරපුරෙහි කවිය විචාරයට ලක් කළ තත්කාලීන විචාරකයන් අතරෙහි ගුණදාස අමරසේකර, ආරිය රාජකරුණා, එදිරිවීර සරච්චන්ද්‍ර සහ කුලතිලක කුමාරසිංහ වැන්නවුන් ප්‍රමුඛත්වයෙහි ලා හඳුනාගත හැකි වේ. මෙම විචාරකයන් කොළඹ යුගයේ කවිය විචාරයට ලක් කර ඇත්තේ ඒකාකාරී ස්වරූපයකිනි. එසේ විචාරයට ලක් කිරීමේ දී ඔවුන් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පමණක් පහත පරිදි සංක්ෂිප්තව හඳුනා ගත හැකි වේ.

- ගැමිවහර උපයෝගී කොටගත්ත ද ව්‍යක්ත කාව්‍යමය ස්වරූපයක් නොදැරීම.
- කාව්‍යමය ස්වරූපයක් නොදැරීම.
- කවියා වාර්තාමය ස්වරූපයක් අනුගමනය කර තිබීම.
- ගතානුගතික උපමා රූපක භාවිතය.
- නීරස කවි සිතිවිලි ඉස්මතු කරලීම.
- අත්දැකීම්වලින් තොර සරුව පිත්තල සමනල ලොවක් මැවීම.
- අනවශ්‍ය විස්තර කථන කවියට එක් කොට තිබීම.

- හැඟීම් අවුස්සන සුළු බොළඳ කියුම් කවියට එක් කිරීම.
- සිව්පදය දූෂණය කිරීම.
- ගැඹුරු වූත්, අර්ථාන්විත වූත් කාව්‍ය සංකල්ප ඉදිරිපත් කර නොතිබීම.
- මනුෂ්‍යත්වය පිළිබඳ කලකිරුණු ස්වභාවයක් කවිවලින් ප්‍රකට වීම.

මේ ආකාරයට කොළඹ යුගයේ කවිය විචාරයට ලක් කළ විචාරකයන්ගේ අදහස් සම්පිණ්ඩනය කොට දැක්විය හැකිය. මෙම විචාර ප්‍රවේශවල යුක්ති සහගත බව සහ කාව්‍ය විචාරකයන්ගේ සංකල්පවල ප්‍රාමාණිකත්වය විමසා බැලිය යුතු වේ.

***අත්දැකීම්වලින් තොර සරුව පිත්තල සමනල ලොවක් මවා තිබීම***

අල්විස් පෙරේරා, මීමන ප්‍රේමතිලක, කේයස් ආදි කවීන්ගේ නිර්මාණවලට විෂය වී ඇත්තේ තමා අවට හාත්පස ලෝකයයි. එහි දී එම යථාර්ථවාදී ලෝකය ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා ඔවුන් අනුදත් කාව්‍ය සංකල්ප තේමා ඔස්සේ එම අභිප්‍රාය නිවැරදිව ඉටු වූවේ ද යන්න ගැටලු සහගත බව බොහෝ විචාරකයන්ගේ මතයයි. ඔවුන්ට අවට ලෝකය ගැඹුරු අත්දැකීම් මඟින් චිත්‍රණය කිරීමට හැකි වී ද? අත්දැකීමෙන් තොර වූ සරුව පිත්තල සමනල ලොවක් මැවීම නොවේ ද ඔවුන් අතින් සිදුවූයේ? මේ කවීන්ගේ නිර්මාණවලින් සියයට අනූවක්ම එලෙසම ය. (අමරසේකර, 1996, 174)

ගුණදාස අමරසේකර කොළඹ දෙවන පරපුරෙහි සමස්ත කවිය පිළිබඳ දක්වන්නේ මෙවැනි වූ අදහසකි. කොළඹ යුගයේ මෙම කවි පරපුරේ බොහෝ දෙනෙක් හුදු දේශීය කාව්‍ය සම්ප්‍රදාය පමණක් ගුරුකොට ගත්තෝ නොවෙති. මෙම යුගයේ බෙහෙවින් ම ආභාසය ලැබුවේ බටහිර රෝමාන්තික කවි වෙතින් සහ තාගෝර් බඳු පෙරදිග කවියන් වෙතිණි. එබැවින් කොළඹ කවිය සැමවිට ම අත්දැකීම්වලින් තොර සමනල ලොවක් මවනවා යැයි සඳහන් කිරීම කෙතරම් යුක්ති සහගත වන්නේ ද යන්න නැවත වරක් විමසිය යුතු වූවකි.

> තෙල් පොඳ හිඳී ගිය පහනක අඳුරු බර
> කෙළවර නැඟී යයි එළියක් නොගිය දුර
> මරණය මුණගැහෙන්නට මොහොතකට පෙර
> ලෙඩෙකුට තිබේ හොඳ සුවයක මුහුණු වර
> (කුඩලිගම, 1954)

මේ ආකාරයට කුඩලිගම කවියාගේ කාව්‍ය දර්ශනයට අනුව ලෝක ශක්තිය හමුවේ මානවයාගේ ක්ෂුද්‍රභාවය මෙන් ම සියලු දේ අනිත්‍ය බව සහ එම ධර්මතා ස්වභාවධර්මය ඔස්සේ විවරණය කිරීමට සමත්ව ඇත. එසේ ම ජීවිතය නිෂ්ඵල එකක් යයි දර්ශනාත්මකව උපන් කලකිරීම ද ඔවුන්ගෙන්

විද්‍යමාන වෙයි. මේ අනුව කවියාගේ ලෝකය සහ යථාර්ථ ලෝකය අතර පවතින වෙනස හඳුනාගත් කුඩලිගම රෝමාන්තික කවියේ හරයට මෙන් ම රවීන්ද්‍රනාත් තාගෝර් වැනි පෙරදිග කවීන්ගේ සිතිවිලි යන දෙඅංශය වෙත ම ප්‍රවේශ වෙමින් කාව්‍යකරණයෙහි යෙදී ඇත. (වික්‍රමසිංහ, 1962, 105)

ඒ අනුව විචාරකයන් ඉදිරිපත් කළ අත්දැකීම් රහිත සමනල ලොවක් මැවීම යන කාරණය මෙහි දී කුඩලිගම බන්ඩණය කර ඇත. ගැඹුරු ජීවන පරිඥානයක් අනුදත් ඔහුගේ මෙම පැදි පෙළ සහ අනෙක් කාව්‍ය කෘති පමණක් නොව, කොළඹ යුගයේ අනෙක් කවීන්ගේ කාව්‍ය නිර්මාණ ද බොහෝ විට ගැඹුරු වූත්, සංකීර්ණ වූත් අත්දැකීම්වලින් සන්නද්ධ වේ. හුදෙක් අත්දැකීම්වලින් තොර යන කාරණය මත පමණක් පදනම් වෙමින් කාව්‍ය මිනුමට ලක් කරන්නේ නම් දේශීය සාහිත්‍ය ශානර රැසක් වෙත මෙම නිශේධනීය සාධකය ආරෝපණය විය යුතුය. මන්දයත් බොහෝ ශානර විදේශීය සාහිත්‍යය ආභාසයට ගෙන තිබීමයි. එබැවින් ඇතැම් විට එක් කවියක් හෝ දෙකක් මත පිහිටා ගෙන කෙරෙන මෙවැනි සමස්ත නිගමනවලට කොළඹ කවියේ දෙවැනි පරපුර ම ඇඳ ගත්තේ නම් එය යුක්ති සහගත නොවන බවත්, හුදු සමන විනෝදකාමී ලොවක් පමණක් නොව ගැඹුරු ජීවන දර්ශනයත් ඒ ඔස්සේ විද්‍යමාන කරන ආකාරයත් ඉහත සඳහන් කළා වැනි වූ කාව්‍ය ඔස්සේ ප්‍රකට කෙරෙනු ඇත.

***කවියා වාර්තාමය ස්වරූපයක් අනුගමනය කරයි***

කොළඹ යුගයේ දෙවැනි කවි පරපුර නිර්මිත කවි කෙරෙහි එල්ල වන චෝදනාවක් ලෙස මෙය දැක්විය හැකි වේ. මෙහි දී බොහෝ කවි එකිනෙක පෙළට කිසියම් වූ සංසිද්ධියක් හෝ පුද්ගල චරිතයක් පිළිබඳ විවරණය කර ඇති නම් එවැනි අවස්ථාවලට විචාරකයන් වාර්තාමය කාව්‍ය ලක්ෂණය ලෙසින් නම් කර ඇත. කවිය වාර්තාමය ස්වරූපයක් ගත් හෙයින් මිරිකීමට - ඇඳා ගැනීමට - රසයක් නැත. (රාජකරුණා, 1962, 23)

අසලක නොවේ ඇත්තේ දොස්තර ගෙදර
තුන් ගව්වකට ඇතය කුච්නිත් වතුර
හිම මැද මෙගම හා ළඟ පාසල අතර
සැතපුම් දහතුනයි පවතින දුරු කතර

බලා සිටිද්දීම දරුවෙක් අසල හිටී
මැලේරියා උණ මතු වී ගැහුනු හැටී
පිලේ තිබුණු වියළී ගිය පිදුරු මිටී
පැදුර වුණා ඔහු හට සැතපුමට වැටී

(සිරිවර්ධන සහ එස් විජේසූරිය, 1987, 100)

විමලරත්න කුමාරගමගේ "කවුද ගෙදර" පද්‍ය රචනාවෙහි පද්‍ය කීපයක් උක්ත පරිදි වේ. මෙම කාව්‍ය නිර්මාණය පිළිබඳ ආරිය රාජකරුණා දක්වා ඇත්තේ මෙවන් අදහසකි. කවියා වාර්තාමය ස්වරූපය අනුගමනය කොට ඇති අයුරු මේ පද්‍ය කියවීමෙන් පැහැදිලි වේ. දුගී ජනතාවගේ දුක්බර ජීවිතය කලාත්මකව කාව්‍යයට නඟා ඇත (රාජකරුණා, 1962, 118).

එහෙත් මෙම පැති පෙළ පිළිබඳ සංකීර්ණ අධ්‍යයනයක යෙදෙන විට මෙය හුදෙක් දුගී ජනතාවගේ දුක්බර ජීවිතය විවරණය කිරීම පමණක් නොව තත් යුගයේ පැවති පන්ති විසමතාව කෙරෙහි ද ගැඹුරු කියවීමක් දක්වා ඇත. දරිද්‍ර බව හේතුවෙන් පීඩා විඳින දුක්ඛිත ජීවිතවල යථාර්ථවාදී විවරණයක් ද මේ ඔස්සේ සිදු කර ඇත. ජීවන දර්ශනය පිළිබඳ පුළුල් කියවීමක් සහිත කවියකු ලෙස කුමාරගමගේ හඳුනාගත හැකි වුවත්, ඔහුගේ සෑම කවියකින් ම ගැමි දුගී ජීවන පැවැත්ම පමණක් යථාර්ථවාදීව ඉදිරිපත් වන්නේ යැයි සැලකීම නොවටී. මන්දයත් උක්ත සඳහන් කවුද ගෙදර පැදි පෙළෙහි ඔහු භාවිත සංකේත කිසිවිටෙක විචාරකයාගේ අවධානයට ලක්ව නොමැත. මේ කවීන්ගේ නිර්මාණවලින් සියයට අනූවක් සලකා බලන විට ඒවා රස ජනනයෙන් තොර වූ වාර්තා ස්වරූපයක් ගත් අර්ථ ධ්වනි, ශබ්ද ධ්වනි යන දෙකෙන් ම වියුක්ත වූ පද්‍ය බන්ධනයක් බව පෙනේ (අමරසේකර, 1996, 174).

ගුණදාස අමරසේකර ද උක්ත ආකාරයෙන් කොළඹ කවිය හුදු වාර්තාකථනයක් පමණක් බව පෙන්වා දී ඇත. විමලරත්න කුමාරගමගේ කව්ද ගෙදර පැදි පෙළ හුදු වාර්තාකරණ ස්වභාවයෙන් යුක්ත යැයි දෝෂ දර්ශනයට ලක් කිරීමට සහ විවේචනයට ලක් කිරීමට පූර්වයෙන් තත් යුගයේ අවශ්‍යතාව පිළිබඳ ද අවධානය යොමු කළ යුතු වේ. මන්දයත් ඒකාකාරී වස්තුවිෂය ඔස්සේ සහ සාම්ප්‍රදායික කාව්‍ය බන්ධනයෙන් හෙම්බත්ව සිටි සහෘද ප්‍රජාවගේ චින්තනය නඟා සිටුවිය යුත්තේ ඉතාමත් සරල සහ පිළිගත හැකි කාව්‍ය නිර්මාණ ඔස්සේය. වාර්තාගත ස්වරූපයෙන් තිබීම හේතුවෙන් තත්කාලීන සමාජය පිළිබඳත්, කවියාගේ සරල බස් වහර භාවිතයත් පිළිබඳ අවබෝධ කරගත හැකි වේ. එබැවින් කොළඹ යුගයේ කවිය හුදු වාර්තාකරණයක් යැයි සලකමින් විවේචනයට ලක් කිරීම යුක්ති සහගත නොවේ.

***කවියා මනුෂ්‍ය සමාජය කෙරෙහි කලකිරීමකට පත්වී සිටී, එහෙයින් සිහින ලෝකයක ඉපදීමට පතයි. (රාජකරුණා1962, 46),***

කොළඹ යුගයේ දෙවැනි කවි පරපුරෙහි කවීන් සිය කවිය සඳහා උපයුක්ත කොටගත් ප්‍රධාන තේමා ත්‍රිත්වයකි. මනුෂ්‍ය ජීවිතය, සොබාදහම සහ ප්‍රේමය ලෙස එම තේමා ප්‍රවර්ග ගත කළ හැකි වේ. ඒ අතරෙහි ද මනුෂ්‍ය ස්වභාව පිළිබඳ වැඩි අවධානයක් යොමුව ඇත.

කැදර මිනිස් ඇස නොපවන තරම දුර
සැඟවුණු ස්වභාවික රසයෙහි නොදුටු පෙර
(කුඩලිගම, 1954, 06)

ගඟ බඩ දර ගහක් ගල් වැටියක් විතර
තෙතමනයක් නොදුටු බොල් මිනිසුන් අතර
(කුඩලිගම, 1954, 12)

ඉම නැති අහිංසක ගුණයෙහි නපුර කියා
ගුණමකු පවිටු ලෝකය මැද දෙ ඇස පියා
(කුඩලිගම, 1954, 23)

මේ ආකාරයට විචාරකයන් කොළඹ යුගයේ කවින් මනුෂ්‍ය ගති ස්වභාවය විවරණය කළ ආකාරය පිළිබඳ එච්.එම්. කුඩලිගම කවියාගේ පද්‍ය නිර්මාණ ආශ්‍රයෙන් විමසිය හැකි වේ. ඇතැම් විචාරකයන්ට අනුව කොළඹ කවීන් හුවා දැක්වූයේ මනුෂ්‍යත්වය ගැන කලකිරුණවුන් ලෙසය. කොපමණ කළකිරුණ ද යත් කුරුල්ලන්ගේ අහිංසක බව කීමට ගොස් මිනිසාට බැන නොවැදී ඒ කාර්යය කිරීමට ඔවුහු අපොහොසත් වූහ (සුනිල් සෙනවි, 2000, 74).

කොළඹ යුගයේ දෙවැනි කවි පරපුර නිර්මාණය කළ පද්‍ය විචාරයට ලක් කළ විචාරකයකු වන ආරිය රාජකරුණා එම කාව්‍ය පිළිබඳ ඉදිරිපත් කර ඇති අදහසෙහි යුක්ති සහගත බව එච්. එම් කුඩලිගම කවියාගේ කාව්‍ය නිර්මාණ ඔස්සේ විමසා බැලීමට පුළුවන. යථෝක්ථ කවි පිළිබඳ අවධානය යොමු කරන විට දී ප්‍රකට වනුයේ කුඩලිගම හුදෙක් මනුෂ්‍යත්වය පිළිබඳ හෝ මනුෂ්‍යයන් විෂයෙහි කළකිරුණු පුද්ගලයෙක් නොවන බවයි. එම කාව්‍ය නිර්මාණ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක යෙදෙන්නෙකුට අවබෝධ වන්නේ මෙම කවීන් මනුෂ්‍යයා තුළ පවතින නොමිනිස් ගති ස්වභාව පිළිබඳ අප්‍රසාදයකට පත්ව සිටි බවයි. ඔවුන් තරයේ ප්‍රතික්ෂේප කොට ඇත්තේ මනුෂ්‍යත්වය නොව නොමිනිස් ගති ගුණයි. මිනිසා තවත් මිනිසෙක් අරභයා සිදු කරන වංචනික ක්‍රියා, ඔවුන් සතුව පවතින අධම ගතිගුණ, රළු දැඩි වචන භාවිතය, අධර්මය වැනි පුද්ගලයාගේ පහත් ක්‍රියා කලාප මෙම යුගයේ කවියන් සිය කාව්‍ය නිර්මාණ ඔස්සේ ඍජුව ප්‍රතික්ෂේප කිරීමටත්, විවේචනය කිරීමටත් පෙළඹී ඇත.

කාව්‍ය විචාරකයන් මෙම ප්‍රවණතාව නිශේධනය කොට සලකා විවේචනයට ලක් කළ ද තත් යුගයේ කවිවල දැකගත හැකිව තිබූ සාධනීය ලක්ෂණයක් ලෙස මෙය හඳුනාගත හැකි වේ. එමෙන් ම එවැනි වූ ගතිගුණ සහිත පුද්ගලයා ද කවිය ඔස්සේ නිර්මාණ පරිශීලනය කරන්නෙකු වේ නම් එවැනි ගති ගුණවලින් නිරායාසයෙන් ම ඉවත්ව කටයුතු කිරීමට ද වග බලා ගනු ඇත. එබැවින් කවියෙන් සිය නිර්මාණ ඔස්සේ ඉදිරිපත් කරන නොමනා මනුෂ්‍ය ස්වභාව විවරණය කිරීම නිශේධනීය සාධකයක්

ලෙස නොව සාධනීය සමාජ සාධකයක් ලෙස සැලකිය හැකිය. ඒ ඔස්සේ කවිය පරිහරණය කරන පරමාදර්ශී සහෘද ප්‍රජාවක් ගොඩනැංවීමට ද පුළුවන.

***කාව්‍යයක, කලා නිර්මාණයක සංයමයක් තිබිය යුතුය***

කොළඹ යුගයේ දෙවන කවි පරපුරෙහි කාව්‍ය නිර්මාණ විචාරයට බඳුන් කළ විචාරකයකු ලෙස එදිරිවීර සරච්චන්ද්‍ර හඳුනාගත හැකි වේ. මොහු තත් යුගයේ කාව්‍ය නිර්මාණ කෙරෙහි එල්ල කරන චෝදනාව වනුයේ එම කාව්‍ය කිසිදු සංයමයකින් තොරව ඉදිරිපත් කළ ඒවා බවයි. එමෙන් ම ඉන් ජනිත කරන රසයේ ද කිසියම් වූ විචල්‍යතාවක් පවතින බවයි. මේ බව ඔහු කාව්‍ය නිර්මාණ දිවිත්වයක් ඇසුරු කොටගෙන විමසා ඇත. එහි දී සරච්චන්ද්‍ර උපයෝගී කොට ගනුයේ නූතන අප්‍රකට ගැමියෙකු විසින් නිර්මාණය කරන ලද යශෝධරා කවි සහ ප්‍රසිද්ධ කවියකු වන හික්කඩුවේ අමරසේන පබැඳි යශෝදරා කවි වේ. මෙහි දී අප්‍රකට ගැමියකු රචනා කළ යශෝධරා කවි පිළිබඳ සරච්චන්ද්‍ර දක්වනුයේ මෙවැනි අදහසකි.

මෙම පද්‍ය පන්තියෙහි යශෝදරා දේවිය කිසිදු තැනක තම දුක ගැන විලාප නොකියයි. ඈ තම ශෝකය මැඬ පවත්වාගෙන ස්වාමියාගේ සැපතම පතයි. තමා ගැන නොසිතා තම හිමියාගේ ද, දරුවාගේ ද උවමනාකම් ප්‍රධාන තැනහි ලා සලකන ගැමි ස්ත්‍රියකගේ අවංක ප්‍රේමය මේ පද්‍යයෙන් හෙළිවෙයි. (සරච්චන්ද්‍ර, 1587, 75)

> එහෙත් මෙම යශෝධරාව පිළිබඳ ම හික්කඩුවේ අමරසේන කවියා දක්වා ඇත්තේ ඉතාමත් වෙනස් දෘෂ්ටියකි.
>
> පෙරමින් කඳුළු කිරි දරුවෙකු අතේ　　දරා<br>
> පෙරළා නොගොස් පෙම්බර මව්පියන්　　කරා<br>
> දර දඬු ගැහැණු අතපය හාමතේ　　දිරා<br>
> නරකාදියකි හිමියනි අද යසෝද　　ර
>
> කුමරකු සමග තෙමි තෙමි කඳුලැලි　　වැස්සේ<br>
> බිම පෙරළෙමින් ඉකි බිඳ ඇඬුවට　　පස්සේ<br>
> මම හිමි සඳුනි ගිය අවුරුදු හය　　තිස්සේ<br>
> මෙමම පඩි පෙළෙන්නේ නැහැ තව එළියට　　බැස්සේ<br>
> (සරච්චන්ද්‍ර, 1587, 77)

මේ හික්කඩුවේ අමරසේන කවියා යශෝධරා නම් චරිතය ප්‍රතිනිර්මාණය කළ ආකාරයයි. මෙහි දී අප්‍රකට කවියෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ යශෝධරාව සහ මෙම කවියේ නිරූපිත යශෝධරාව එක් ස්ත්‍රී චරිතයක් ලෙස සිතීමට පවා අපහසු වන තරම් එකිනෙකට වෙනස් කොට ඇත.

සිංහල සාහිත්‍යය ඔස්සේ උත්කර්ෂයට නංවා ඇති යශෝධරාව පරමාදර්ශී ස්ත්‍රී චරිතයකි. ඇයි සියලු කැපකිරීම් කොට තම හිමිගේ ඒකායන පරමාර්ථයට සහය වූ තැනැත්තියකි. පරමාදර්ශී ස්ත්‍රී චරිතයක් නිසා කිසිදු සාහිත්‍ය නිර්මාණයක ඇගේ යථාර්ථවත් චිත්ත විවරණය සිදු නොවී නැත. ඇය කෙරෙහි ශෝකයක් නොඉපදෙන අතර කරුණා රසය පමණක් ම ජනිත කොට ඇත. එහෙත් අමරසේන කවියා මෙම පරමාදර්ශී ස්ත්‍රිය හුදු ප්‍රායෝගික සාමාන්‍ය තලයෙහි ලා ප්‍රතිනිර්මාණය කොට ඇත. මේ යථාර්ථ විවරණයය; ස්වාමියා හැරගිය ස්ත්‍රියගේ ප්‍රකෘති හැසිරීමයි මෙවන් හැසිරීමක් සහෘද ප්‍රජාව පවා යශෝධරාවගෙන් අපේක්ෂා නොකරයි. සහෘදයාට අප්‍රිය වූ ශෝකය මෙහි දී යථාර්ථයත් සමඟ එකට එක්කොට ඇත. එබැවින් මෙහි දී කිසි විටෙකත් කොළඹ යුගයේ කවියා රසයෙහි වෙනසක් හෝ එම ස්ත්‍රී චරිත නිරූපණයේ වෙනසක් සිදු කර නොමැත. එහෙත් විචාරකයා අපේක්ෂිත පරමාදර්ශී ස්ත්‍රියගේ භූමිකාව විවරණය වී නොමැත. ඒ අනුව හුදෙක් කොළඹ කවියා විෂයෙහි පමණක් විවේචන එල්ල කොට ඇති සාහිත්‍ය විචාරකයා තමන් අපේක්ෂිත ආකාරයේ ම රස නිෂ්පත්තියක් සහිත සාහිත්‍යය නිර්මාණයක් සිදු නොවූවෙන් එය විවේචනයට ලක් කිරීම යුක්ති සහගත වන්නේ ද යන්න පිළිබඳ සැලකිය යුතු වේ.

**නිගමනය**

කවිය ගද්‍ය සාහිත්‍ය කෘතියකට සාපේක්ෂව අල්ප වචන මාලාවකින් සමන්විත වුව ද ක්ෂණිකව එක එල්ලේ ම ජනතා හදවතට සන්නිවේදනය වන ප්‍රබල හැඟීමක් දැනවීමෙහි ලා සමත් බවක් දක්වයි. මෙහි දී කොළඹ යුගයේ දෙවන කවි පරපුරේ කවිය පිළිබඳ තත්කාලීන විචාරකයාගේ විචාරයෙහි ප්‍රාමාණිකත්වය පිළිබඳ දක්වා ඇත. කොළඹ යුගයේ දෙවන පරපුර නියෝජිත කවීන් වූයේ පී.බී. අල්විස් පෙරේරා, සාගර පලන්සූරිය, විමලරත්න කුමාරගම, මීමන ප්‍රේමතිලක වැනි කවීන් වේ. මොවුන්ගේ කාව්‍ය නිර්මාණ විචාරයට ලක් කර ඇත්තේ ආරිය රාජකරුණා, එදිරිවීර සරච්චන්ද්‍ර, කුලතිලක කුමාරසිංහ, ගුණදාස අමරසේකර වැනි විචාරකයන් වේ. මෙම විචාර පිළිබඳ අවධානය යොමු කරන විට දී සෑම විචාරකයෙක් ම පාහේ කොළඹ කවිය පිළිබඳ දක්වා ඇත්තේ සාධනීය මට්ටමේ ආකල්පයක් නොවේ. එම විචාර සමස්තයක් ලෙස ගෙන විමසීමේ දී හුදු නිශේධනාර්ථයක් පමණක් එමඟින් ගම්‍යමාන වේ. එහි දී ඔවුන් දක්වා ඇත්තේ කාව්‍යකරණයට නුසුදුසු භාෂාවක් භාවිතය, ගතානුගතික උපමා රූපක භාවිතය, කවිය වාර්තාමය ස්වරූපයක් දැරීම, නීරස කවි සිතුවිලි ඉස්මතු කිරීම ආදි ප්‍රවණතා ඔවුන්ගේ කවියෙන් ඉස්මතු වන බවයි. ඒ බව ගැඹුරු අධ්‍යයනයක යෙදෙන විට දී අනාවරණය වන්නේ යුගයේ අවශ්‍යතාව මත ඇතැම් භාෂා ව්‍යවහාර භාවිතය කාව්‍ය රසය වෙනස් නොවී පැවතියත් විචාරකයාගේ දෘෂ්ටිය වෙනස් වීමයි. එබැවින් මෙහි දී හුදෙක් එක් කවියක් හෝ දෙකක් මත පිහිටා සමස්ත කවි පිළිබඳ නිගමනය හේතුවෙන් ඇතැම් විචාර ඍජුව

ප්‍රතික්ෂේප කිරීම සිදු කළ හැකි වේ. ඒ අනුව තත්කාලීන විචාරකයා කොළඹ යුගයේ දෙවන පරපුරෙහි කවිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ විචාරය එම කාව්‍ය විචාරයට ප්‍රාමාණික වන්නේ යැයි සැලකීම යුක්ති සහගත නොවේ.

**සමුද්දේශ**


අමරසේකර, ගුණදාස. අලියා සහ අන්ධයෝ. ගම්පහ: සරසවි ප්‍රකාශකයෝ, 1966.

- සිංහල කාව්‍ය සම්ප්‍රදාය. බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ, 1966.

කුඩලිගම, එච්.එම්. කුණාටුව. කුරුණෑගල: ඊ. එම්. දයානන්ද 1948.

කුමාරසිංහ, කුලතිලක. නූතන කාව්‍ය විමර්ශන ලේඛන ප්‍රථම භාගය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයා 2001.

- නූතන කාව්‍ය විමර්ශන ලේඛන ද්විතීය භාගය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2002.

දනන්සූරිය, ජිනදාස. කලාත්මක පරිකල්පනය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005.

රාජකරුණා, ආරිය. නූතන සිංහල කාව්‍ය 2. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2004.

- සම්ප්‍රදාය හා සිහින ලෝකය. කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1968.

වික්‍රමසිංහ, මාර්ටින්. නව පද්‍ය සිංහලය. මහරගම: සමන් මුද්‍රණාලය,1962.

විමලරත්න කුමාරගමගේ කෘති එකතුව (සංස්) සුසිල් සිරිවර්ධන සහ එස් විජේසූරිය. කොළඹ: සුසිල් සිරිවර්ධන ප්‍රකාශන, 1987.

සරච්චන්ද්‍ර, එදිරිවීර. කල්පනා ලෝකය. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1987.

සෙනවි, හිනිදුම සුනිල්. කොළඹ කවිය සහ එච්. එම්. කුඩලිගම. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ, 2000.

ආඛ්‍යානnarrations
Volume 10 | Issue 01 | January-June 2025 | Article 03
ISSN 2478-0642

Open Access, Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies, Sabaragamuwa University of Sri Lanka
Submit your academic papers to director@cikcs.sab.ac.lk
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

---

# ශ්‍රී ලංකාවේ ඡන්ද චර්යාව කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බලපෑම

**කේ.බී.සී. මධුෂාන්,** දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, mkandabadage@sjp.ac.lk

**එච්.ඒ.එන්. ප්‍රියදර්ශනි,**දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, nilupriyadarshani@sjp.ac.lk

**Received:** 08 January 2024 / **Revised:** 10 June 2024 / **Accepted:** 20 June 2024

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණ පත්‍රිකාව හරහා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක දේශපාලන සහභාගිත්වයේ ගතිකත්වය පැහැදිලි කිරීම අරමුණු කරගනිමින් දේශපාලන සමාජානුයෝජනය සහ ඡන්ද හැසිරීම අතර ඇති සංකීර්ණ සම්බන්ධය ගැන සොයා බලයි. පර්යේෂණ ගැටලුව කේන්ද්‍රගත වන්නේ ඡන්දදායක හැසිරීම් කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බහුවිධ බලපෑම් අවබෝධ කර ගැනීම වටාය. එනම්, ශ්‍රී ලංකාවේ ඡන්දදායක චර්යාව කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බලපෑම කෙබඳු ද යන්නයි. මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ සන්දර්භය තුළ දේශපාලන සමාජානුයෝජනය පුද්ගලයන්ගේ ආකල්ප සහ ක්‍රියාවන්ට බලපෑම් කරන විවිධ මාර්ග විමර්ශනය කිරීම සහ විශ්ලේෂණය කිරීමයි. දේශපාලන සමාජානුයෝජනය, පුද්ගලයන් දේශපාලන දැනුම සහ සාරධර්ම අනුබද්ධයෙන් ලබා ගන්නා ක්‍රියාවලිය මෙම අධ්‍යයනයේ මූලික අංගයක් ලෙස ක්‍රියා කරයි. දේශපාලන සහභාගාත්වය හැඩගැස්වීමට පවුල, අධ්‍යාපනය, මාධ්‍ය සහ වෙනත් සමාජ ආයතන දායක වන්නේ කෙසේ ද යන්න තේරුම් ගැනීමට පර්යේෂණය මඟින් උත්සාහ කළ අතර, ඒ සඳහා නුවරඑළිය සඳතැන්න ග්‍රාම නිලධාරී වසමට අයත් මුළු ජනගහනයෙන් *(අවුරුදු 20 ට) වැඩි* ස්තරානුභූත නියදුම් ක්‍රමය භාවිත කර 10% ක් වූ දත්තදායකයින්ගේ තොරතුරු මත පර්යේෂණය සිදු කරනු ලැබීය. මෙහි දී සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්තදායකයින්ගෙන් දත්ත ලබා

ගන්නා ලදී. ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණවල දී ඡන්දදායකයින් තම තීරණ ගැනීමේ ක්‍රියාවලින්ට බලපාන සමාජ සාධක පිළිබඳව අධ්‍යයනය කරමින් එම සමාජ සාධකවල ගතිකත්වය අවබෝධ කරගැනීම මෙම පර්යේෂණය මඟින් සිදු විය. ප්‍රජාතන්තරවාදී භූ දර්ශනය හැඩගැස්වීමේ දී දේශපාලන සමාජානුයෝජනයේ භූමිකාව සහ ඡන්දදායකයින්ගේ හැසිරීම් කෙරෙහි එහි සෘජු බලපෑමක් පවතින අතර ඡන්දදායකයින්ගේ තීරණ මෙහෙයවන සාධක අතර පවුල, අධ්‍යාපන ආයතන, වෘත්තීය සමිති හා ආගමික සංවිධාන සෘජු හා ගැඹුරු බලපෑමක් කරන බව දැක්විය හැකිය.

**ප්‍රමුඛ පද:** *ඡන්ද චර්යාව, දේශපාලන සමාජානුයෝජනය, දේශපාලන සහභාගිත්වය, මැතිවරණ*

**හැඳින්වීම**

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක බහුවිධ හා ගතික සංසිද්ධියක් වන ඡන්දදායකයාගේ හැසිරීම, මැතිවරණ ප්‍රතිඵල හැඩගස්වන සහ ජනතාවගේ සාමූහික කැමැත්ත පිළිබිඹු කරන්නකි. ඡන්දදායකයාගේ හැසිරීම මැතිවරණ ක්‍රියාවලිය තුළ පුද්ගලයන් විසින් ප්‍රදර්ශනය කරන ලද ක්‍රියා, තීරණ අතර සහසම්බන්ධතාවයක් පවති. අපේක්ෂකයින් තෝරා ගැනීම, ඡන්ද දායකයින්ගේ පැමිණීම සහ දේශපාලන සහභාගිත්වය දක්වා වූ ක්‍රියාකාරකම් පරාසයක් එයට ඇතුළත් වේ. මෙම සංකීර්ණ සංසිද්ධිය අවබෝධ කර ගැනීම සඳහා විද්වතුන් විවිධ මානයන් වෙත යොමු වී ඇති අතර, ඡන්දදායකයින්ගේ තේරීම්වලට බලපාන මූලික සාධක සහ ප්‍රජා සහභාගිත්වයේ විකාසන ස්වභාවය ගවේෂණය කරයි. දේශපාලන විද්‍යාඥයින් බොහෝ විට දේශපාලන සමාජානුයෝජනය සංකල්පය වෙත යොමු වන්නේ ඡන්දදායකයාගේ හැසිරීම්වල මූලයන් පැහැදිලි කිරීමටය. දේශපාලන සමාජානුයෝජනය යනු මූලික වශයෙන් පවුල, අධ්‍යාපන ආයතන සහ සමාජ ආයතනවලින් දේශපාලන දැනුම, සාරධර්ම සහ ආකල්ප ලබා ගන්නා ජීවිත කාලය පුරාවට සිදු වන ක්‍රියාවලියයි (Easton, 1965; Almond & Verba, 1963). මෙම ක්‍රියාවලිය පුද්ගල දේශපාලන අනන්‍යතාවයන් හැඩගැස්වීමේ දී සහ ඒ අනුව මැතිවරණ ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ හැසිරීම්වල ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. තව ද, ඡන්දදායක හැසිරීම් පිළිබඳ අධ්‍යයනය සමාජීය සහ සන්දර්භීය සාධක ඇතුළත් පුද්ගල අභිප්‍රේරණයෙන් ඔබ්බට විහිදේ. ඡන්දදායකයින් තමන්ම සොයා ගන්නා ආර්ථික, සංස්කෘතික සහ සමාජ පරිසරය ඔවුන්ගේ තේරීම් කෙරෙහි සැලකිය යුතු ලෙස බලපායි (Downs, 1957; Campbell et al., 1960). අපි ඡන්දදායකයින්ගේ හැසිරීම් ගවේෂණයක යෙදෙන විට, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සහභාගිවන්නන් පිළිබඳ සියුම් අවබෝධයක් ලබා දෙමින් සමාජ සාධකවල සංකීර්ණ අන්තර්ක්‍රියාකාරිත්වය හෙළිදරව් කිරීම අත්‍යවශ්‍ය වේ. ස්ථාපිත න්‍යායන් සහ සමකාලීනව පවතින දේශපාලන අදහස් මඟින් මෙම පර්යේෂණය ගතික දේශපාලන සමාජයක් තුළ ඡන්දදායක හැසිරීම්වලට බලපාන ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමට උත්සාහ කරයි.

ඡන්දදායක චර්යාව යනු නියෝජිතයන් තෝරා පත්කර ගැනීමේ ක්‍රියාවලියේ දී ඡන්දදායකයාගේ සහභාගිත්වය, ඡන්ද භාවිතය හා ඡන්ද වරණය සඳහා බලපානු ලබන බාහිර හා අභ්‍යන්තර සාධක සමස්තයෙහි එකතුව වේ (හඳරාගම, 2013). බොහෝ විද්‍යාඥයින්, පර්යේෂකයන් විවිධ න්‍යායන් ආකෘති භාවිතා කරමින් ඡන්දදායක චර්යාව විස්තර කිරීමට උත්සාහ කරයි. එහෙයින් ඡන්දදායක චර්යාව පිළිබඳව විවිධ අදහස්ල විවිධ නොගැළපීම් පවතී. ඡන්ද චර්යාවල දේශපාලන සමාජානුයෝජනයේ දී වැදගත් ස්ථානයක් ගනී. මක්නිසාද යත් ඡන්ද බලය යනු පුද්ගලයා, සමාජය සහ දේශපාලනය යන ආයතන තුන අතර අන්තර්ක්‍රියාකාරිත්වයන් පිළිබඳව තෙරෙතුරු ලබාගත හැකි පොහොසත්ම මූලාශ්‍රයක් වන බැවිනි (Lowi et al, 2004). සමාජානුයෝජනය යන්නෙන් සරලව අර්ථකථනය කරන්නේ මිනිසා සමාජයට අනුගත වීම වන අතර, දේශපාලන සමාජානුයෝජනය යනු මිනිසා දේශපාලන සමාජයට අනුගත වීමේ ක්‍රියාවලියයි. ග්‍රීක මහා දාර්ශනික ඇරිස්ටෝටල්ට අනුව සෑම පුද්ගලයෙකුම දේශපාලන සත්ත්වයෙකු වන අතරල එහෙයින් ඕනෑම පුද්ගලයෙකු පවතින දේශපාලන සමාජයට අනුගත වීම සිදු වේ. එය විධිමත් හෝ අවිධිමත් විය හැකිය. දේශපාලන සමාජානුයෝජනයේ ප්‍රධාන කාරකයන් වශයෙන් පවුල, පාසල, දේශපාලන පක්ෂ, දේශපාලන සංවිධාන ප්‍රධාන තැනක් ගනියි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජනතාවගේ ඉතා වැදගත් අයිතියක් වශයෙන් ඡන්දය සැලකේ. ප්‍රජාන්ත්‍රවාදී රාමුව තුළ හිඳිමින් ජනතාවට තමන් කැමති පාලකයින් පත් කර ගැනීමටත් සහ සිය මතය ප්‍රකාශ කිරීමට සඳහා සර්වසාධාරණ මැතිවරණ රාමුවක් තිබිය යුතුය. ඒ තුළ ඡන්දදායකයාගේ කාර්යභාරය ඉතා සුවිශේෂී වේ. එහෙයින් ඡන්දදායකයින් තම ඡන්දය ප්‍රකාශ කිරීමේ දී විශේෂයෙන්ම ඡන්දදායකයින්ගේ චර්යාව සකස් වීම කෙරෙහි බලපාන සාධක මොනවාද යන්න පිළිබඳව විමර්ශනය කිරීම වඩාත් කාලෝචිතය. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් වන ලංකාවේ ඡන්දදායකයින්ගේ දේශපාලන චර්යාව සකස් වීම සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීම විධිමත් දේශපාලන අවබෝධයක් සහිත සමාජයක් ගොඩනැගීමට මහෝපාකාරී වනු ඇත.

දේශපාලන සමාජානුයෝජනය සහ ඡන්දදායකයාගේ හැසිරීම අතර සහසම්බන්ධය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල ගතිකත්වය අවබෝධ කර ගැනීමේ ප්‍රධාන සම්බන්ධයක් වේ. ඡන්දදායකයන් සමාජයක් තුළ ගොඩනගා ඇති අදහස් මිනිසාගේ දේශපාලන හැසිරීම් හැඩගැස්වීමේ මූලික කාර්යභාරයක් ඉටු කරයි. පුද්ගලයන් කිසියම් දේශසීමාවක් තුළ දේශපාලන බලය හැසිරවීමේ දී පවුල, අධ්‍යාපනික ආයතන සහ සමාජ ආයතනවල බලපෑම් ඔවුන්ගේ දේශපාලන අනන්‍යතාවයන් හැඩගැස්වීමට උපකාරී වෙයි (Norris, 2002). ඒ අනුව නියෝජිතයින්ගේ පැවැත්ම තීරණය වීමෙහිලා මැතිවරණ හරහා පුද්ගලයන් විසින් සිදු කරනු ලබන බලපෑමට මෙම සමාජානුයෝජනය බෙහෙවින්ම ඉවහල් වී ඇත (Barnes & Kaase, 1979; Jennings & Niemi, 1968). ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වයට යටින් පවතින යන්ත්‍රණයන් ගැඹුරින් අවබෝධ කර ගැනීමට දායක වෙමින්, දේශපාලන සමාජානුයෝජනය සහ

ඡන්දදායක හැසිරීම් අතර ඇති සංකීර්ණ සම්බන්ධතා තේරුම් ගැනීමට මෙම අධ්‍යයනය උත්සාහ කරයි. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ ඡන්දදායක චර්යාව කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බලපෑම කෙබඳු ද යන්නයි.

**සාහිත්‍ය විමර්ශනය**

දේශපාලන සමාජානුයෝජනය, පුද්ගලයන් තම දේශපාලන විශ්වාසයන් සහ හැසිරීම් හැඩගස්වන දැනුම, ආකල්ප සහ වටිනාකම් ලබා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල ගතිකත්වය අවබෝධ කර ගැනීම සඳහා තීරණාත්මක කාචයකි. මෙම සාහිත්‍ය විමර්ශනය තුළ පුද්ගලයන්ගේ දේශපාලන අදහස් ගොඩනැගීමට බලපාන සංකීර්ණ සමාජ සාධක පිළිබඳව අනාවරණය කර ගැනීමටත්, පසුව ඔවුන්ගේ මැතිවරණ සහභාගිත්වයට එම දේශපාලන සමාජානුයෝජනය කොතරම් බලපෑමක් කරන්නේ ද යන්න ඉලක්ක කර ගනිමින්, ඡන්දදායක හැසිරීම් කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බලපෑම වටා පවතින දැනුම් සම්භාරය අධ්‍යයනය කරයි. දේශපාලන පද්ධති, පක්ෂ සහ අපේක්ෂකයින් පිළිබඳ පුරවැසියන්ගේ දැනුම සැකසීමේ දී එහි කාර්යභාරය අවධාරණය කරයි. දේශපාලන සමාජානුයෝජනය සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය අතර ඇති සංකීර්ණ සම්බන්ධතා අවබෝධ කර ගැනීම සඳහා මෙම මුල් බලපෑම් පුද්ගල ජීවිත පුරාවටම හේතු වන ආකාරය අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙහි දී දේශපාලන ආකල්ප, විශ්වාසයන් සහ අනුබද්ධයන් වර්ධනය කිරීම කෙරෙහි පවුලල අධ්‍යාපනික සහ මාධ්‍ය පදනම් වූ සමාජානුයෝජනයේ බලපෑම පරීක්ෂා කර ඇති ප්‍රධාන අධ්‍යයනයන් සමීක්ෂණය කරයි. සාහිත්‍යය විවේචනාත්මකව ඇගයීම මගින්, මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ වර්තමාන අවබෝධයේ හිඩැස් හඳුනා ගැනීම සහ දේශපාලන සමාජානුයෝජනයේ නිශ්චිත සූක්ෂ්මතා සහ ඡන්ද හැසිරීම කෙරෙහි එහි බලපෑම පිළිබඳ ගවේෂණාත්මක පරීක්ෂණයකට මග පෑදීමයි. එසේ කිරීමෙන්, දේශපාලන සමාජානුයෝජනය සහ ප්‍රජාතන්ත්‍රවාදී මැදිහත්වීම අතර ඇති සංකීර්ණ අන්තර්ක්‍රියාකාරිත්වය පිළිබඳ වඩාත් පුළුල් අවබෝධයක් සඳහා දායක වීමට එය උත්සාහ කරයි.

ඩේවිඩ් ඕ සියර්ස්, ලියෝනි හඩි සහ රොබට් ජර්විස් (David O' Sears" Leonie Huddy and Robert Jervis) විසින් සිදු කරන ලද "පවුල් සමාජගත කිරීම සහ තරුණයින් අතර දේශපාලන දැනුම ලබා ගැනීම" (Family Socialization and the Acquisition of Political Knowledge among Youth, 1974) යන මූලික අධ්‍යයනයේ දී, මාපිය සමාජගත කිරීම සහ දරුවන්ගේ දේශපාලන දිශානතිය අතර ඇති සංකීර්ණ සම්බන්ධතා ඉතා සූක්ෂ්ම ලෙස ගවේෂණය කර ඇත. දේශපාලන සමාජගත කිරීමේ ප්‍රධාන නියෝජිතයන් ලෙස සේවය කරමින්, දේශපාලන විශ්වාසයන් සහ වටිනාකම් තම දරුවන්ට සම්ප්‍රේෂණය කිරීමේ දී දෙමාපියන්ගේ කාර්යභාරය පිළිබඳව විමර්ශනය

කෙරේ. සමීක්ෂණ සහ කල්පවත්නා විශ්ලේෂණවල එකතුවක් හරහා, දරුවන්ගේ දේශපාලන විශ්වාසයන්, ආකල්ප සහ හැසිරීම්වල සංකීර්ණ වර්ධනය කෙරෙහි දෙමාපියන්ගේ දේශපාලන ආකල්පවල බලපෑම කතුවරුන් හඳුනා ගනී. දරුවන් බොහෝ විට තම දෙමාපියන්ගේ දේශපාලන හැසිරීම් හා අදහස් අනුගමනය කරන බව අධ්‍යයනයෙන් පැහැදිලි වන අතර, කේන්ද්‍රීය සමාජගත කිරීමේ නියෝජිතයෙකු ලෙස පවුල් ඒකකයේ ප්‍රධාන භූමිකාව අවධාරණය කරයි. මීට අමතරව, කතුවරුන් මෙම සම්ප්‍රේෂණයට පහසුකම් සපයන යාන්ත්‍රණ, සන්නිවේදන රටා, පවුල තුළ දේශපාලන සාකච්ඡා සහ දේශපාලන ක්‍රියාකාරකම්වල දෙමාපියන්ගේ මැදිහත්වීමේ ප්‍රමාණය වැනි සාධක පරීක්ෂා කරයි. මෙම සොයාගැනීම් පවුලේ බලපෑම සහ දේශපාලන අනන්‍යතාවයේ හැඩගැස්ම අතර ඇති සූක්ෂ්ම අන්තර්ක්‍රියාකාරිත්වය පිළිබඳ අගනා අවබෝධයක් ලබා දෙන අතර, දේශපාලන සමාජකරණයේ සංකීර්ණ ක්‍රියාවලියට පවුල් ඒකකය තුළින් සිදුවන බලපෑම පැහැදිලි කරයි (Jakubowski, 2021).

“පාසල් තුළ සිවිල් අධ්‍යාපනය සහ දේශපාලන සහභාගිත්වය මත එහි බලපෑම”, (Civic Education in Schools and Its Impact on Political Participation) Judith Torney-Purta) (2002) විසින් කරන ලද පර්යේෂණය හරහා අධ්‍යාපන ආයතනවලින් ලබාදෙන දේශපාලන දැනුවත්භාවය සහ දේශපාලන සමාජගත කිරීම ගැන සොයා බලයි. මෙම පර්යේෂණය මගින් පාසල් තුළ සිවිල් අධ්‍යාපන වැඩසටහන්වල කාර්යභාරය සහ පුද්ගලයන්ගේ දේශපාලන සහභාගිත්වය හැඩගැස්වීම කෙරෙහි ඒවායේ ගැඹුරු බලපෑම විමර්ශනය කරයි. Torney-Purta ශිෂ්‍යයන් අතර දේශපාලන මැදිහත්වීම් පෝෂණය කිරීම සඳහා සිවිල් අධ්‍යාපනයේ සඵලතාවය හඳුනාගැනීම සඳහා සමීක්ෂණ ක්‍රමය උපයෝගී කරගනිමින් පුළුල් ප්‍රවේශයක් භාවිතා කරයි. මෙම අධ්‍යයනය මඟින් සිවිල් අධ්‍යාපනය සහ ඒවා සඳහා භාවිත කරන ක්‍රම ගවේෂණය කරනවා පමණක් නොව, මෙම අධ්‍යාපනික මැදිහත්වීම් සිසුන්ගේ ආකල්ප, දැනුම සහ පසුව දේශපාලන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම කෙරෙහි බලපාන ආකාරය තක්සේරු කරයි. මෙම පර්යේෂණය මඟින් සිවිල් අධ්‍යාපනය සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළ වගකිවයුත්තන් සහ සක්‍රියවම දේශපාලනයේ නියලෙන්නන් අතර පවතින සම්බන්ධතාවය පිළිබිඹු කරන අතරල රටක සාක්ෂරතාවයෙන් හෙබි පුරවැසියන් බිහිකිරීමට අධ්‍යාපන ආයතනවලට පවතින වගකීම පිළිබඳ වටිනා අවබෝධයක් සපයයි (Print, 2009).

සුසාන් ඔල්සැක් (Susan Olzak) විසින් රචිත “වාර්ගික අනන්‍යතාවය සහ දේශපාලන සමාජගත කිරීම: සුළුතර ප්‍රජාවන් පිළිබඳ අධ්‍යයනය”, (Ethnic Identity and Political Socialization: A Study of Minority Communities) වාර්ගික අනන්‍යතාවය සහ සුළුතර ප්‍රජාවන් තුළ දේශපාලන සමාජගත කිරීමේ ක්‍රියාවලිය අතර ඇති සංකීර්ණ සම්බන්ධතාවය පිළිබඳව මෙම අධ්‍යයනය මඟින්

අවධානය යොමු කර ඇත. ඔල්සැක්ගේ පර්යේෂණය පුද්ගලයන්ගේ ජනවාර්ගික අනන්‍යතාවයේ සන්දර්භය තුළ පුද්ගලයන්ගේ දේශපාලන ආකල්ප සහ චර්යාවන් හැඩගස්වන සූක්ෂ්ම ගතිකත්වයන් පිළිබඳව සොයා බලයි. ක්ෂේත්‍ර සමීක්ෂණ  භාවිතා කරමින් සුළුතර කණ්ඩායම් සාමාජිකයින් අතර දේශපාලන අනන්‍යතාවයන් ගොඩනැගීමට බලපෑම් කරමින්, දේශපාලන සමාජකරණය සමඟ සංස්කෘතික හා වාර්ගික මානයන් ඡේදනය වන ආකාරය අධ්‍යයනයෙන් හෙළිදරව් කරයි. ප්‍රජාව, පවුල සහ සංස්කෘතික ආයතනවල කාර්යභාරය ගවේෂණය කිරීම තුළින් Olzak සුළුතර ජනගහණයන් තුළ දේශපාලන සමාජකරණ ක්‍රියාවලියේ මතුවන සුවිශේෂී අභියෝග සහ අවස්ථාවන් පිළිබඳව ආලෝකය විහිදුවමින්, ජනවාර්ගික අනන්‍යතාව දේශපාලන විශ්වාසයන් සමඟ ගැටගැසෙන යන්ත්‍රණයන් පිළිබඳ වටිනා අවබෝධයක් සපයයි. විශේෂයෙන්ම විවිධ සහ සංස්කෘතික වශයෙන් පොහොසත් සුළුතර ප්‍රජාවන්ගේ සන්දර්භය තුළ දේශපාලන අනන්‍යතාවය හැඩගැස්වීමේ බහුවිධ බලපෑම් පිළිබඳ අපගේ අවබෝධයට මෙම අධ්‍යයනය සැලකිය යුතු ලෙස දායක වේ (French et al., 2013).

එච්.ඒ.අයි. චින්තනී විසින් 2015 දී ශ්‍රී ලංකාවේ ඡන්දදායක චර්යාව සහ රූපවාහිනී මාධ්‍ය පිළිබඳව සිදුකර ඇති පර්යේෂණය මඟින් ඡන්දදායක චර්යාව කෙරෙහි ජනමාධ්‍යවල බලපෑම පිළිබිඹු වේ. වර්තමානයේ දී ඕනෑම රූපවාහිනී මාධ්‍යයක් කුමන හෝ දේශපාලන පක්ෂයකට වක්‍රාකාරයෙන් හෝ සහාය පලකිරීමක් දැකිය හැකි බව ද ඇයගේ අදහස විය. මැතිවරණයේ දී ඡන්දය දැමීම පැය නමයකට සීමා වුවත් ඡන්දදායකයාගේ ඡන්දය දැමීම සඳහා රූපවාහිනී මාධ්‍ය විසින් ලබා දෙන අවධිමත් දැනුම ප්‍රබල වන බව මෙම අධ්‍යයනය තුළින් හෙළි කරනු ලබයි. ජනමාධ්‍ය ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය. ඒවා නම් විද්‍යුත්, මුද්‍රිත හා නව මාධ්‍යයයි. මුළු මහත් දේශපාලන ක්‍රියාවලියම තීරණය කරනු ලබන මැතිවරණ සඳහා මෙම ජනමාධ්‍ය බොහෝ සෙයින්ම බලපාන බව මෙම අධ්‍යයනය තුළින් තවදුරටත් හෙළි කරයි. මිනිසා සන්නිවේදන සත්ත්වයෙක් වන අතරල සන්නිවේදනයෙන් තොරව මිනිසාට ජීවිතයක් නැත. ජනමාධ්‍ය යනු මිනිසා සතු මෙම සන්නිවේදන අවශ්‍යතාව උදෙසා කැපවූවක් වශයෙන් පෙන්වා දිය හැකිය.  ඒ අනුව විමසීමේ දී මාධ්‍ය යනු මිනිසාට එදිනෙදා ජීවිතයේ දී වැදගත් වන තොරතුරු විසුරුවා හරිනු ලබන මාර්ගයයි. එමෙන්ම මිනිසා උපතින්ම දේශපාලන සත්ත්වයෙක් හෙයින් ඔහුගේ ජීවිතයේ සෑම අංශයක්ම දේශපාලනය සමඟ බැඳී පවතී. මිනිසාගේ සන්නිවේදන අවශ්‍යතාව පදනම් කරගෙන බිහි වූ ජනමාධ්‍ය උක්ත දේශපාලන ඕනෑ එපාකම් සංතෘප්ත කරලීමෙහිලා කැපී පෙනෙන ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරයි. යම් රටක සන්නිවේදකයන් ලෙස හෝ ග්‍රාහකයන් ලෙස සිටින සියලු ජන කොටස්වලට සන්නිවේදන මාර්ග සඳහා නිදහසේ යොමු වීමට ඇති හැකියාවෙහි අප ප්‍රජාතන්ත්‍රවාදය තුළ පැවතිය යුතු යැයි අදහස් කරනු ලබන බොහෝ

ලක්ෂණ රැඳී පවතී (රොවෙල්, 2003). ඒ අනුව ඡන්දදායක චර්යාව කෙරෙහි බලපාන ලද එක් සාධකයක් වන ජනමාධ්‍ය පිළිබඳව මෙම අධ්‍යයනය තුළින් පුළුල් දැනුමක් ලබාගත හැකිය.

පුද්ගල පෞරුෂය කෙරෙහි ප්‍රාථමික සමාජානුයෝජනයේ බලපෑම පිළිබඳව එම්.ඒ.එම්. සඳමාලි විසින් 2019 දී සිදු කරන ලද අධ්‍යයනය තුළ සමාජය තුළ පවතින පවුල, අධ්‍යාපනය, ආර්ථිකය, දේශපාලනය, ආගම, නීතිය යනාදි සංස්ථා එකිනෙකට සම්බන්ධ වන බවත් එක් සංස්ථාවක බිඳවැටීම අනෙකුත් සංස්ථාවන් කෙරෙහි බලපාන බවත් අවධාරණය කර ඇත. මෙහි දී පවුල් සංස්ථාව පුද්ගල සමාජානුයෝජනයේ දී කෙසේ බලපා ඇත්ද යන්න පිළිබඳව පුළුල්ව අධ්‍යයනය කර තිබේ. මෙහි දී ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් පුද්ගල පෞරුෂය ඉහළ නැංවෙන ආකාරයත් ඒ තුළින් සමාජ ප්‍රගමනයට සියලු දෙනා දායක කර ගන්නා ආකාරය පිළිබඳවත් මෙමඟින් අධ්‍යයනය කර ඇත. ටැල්කොට් පාර්සන්ස් (Talcott Parsons) නම් සමාජ විද්‍යාඥයා පවසන ආකාරයට සමාජයේ බලපවත්වනු ලබන යම් යම් සාරධර්ම, ආකල්ප, අගනාකම්, පිළිබඳ ඉගෙනගෙන ඒවා තමාගේ චරිතය තුළ අභ්‍යන්තරීකරණය කර ගැනීම සමාජානුයෝජනයයි (සුබසිංහ, 2013). පෞරුෂ වර්ධනයට කුඩා කළ සිටම පවුලෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් බවත්, එය නිසි පරිදි සිදු නොවුණහොත් අපගාමී ක්‍රියාවන්ට පුද්ගලයන් යොමුවන බවත් මෙම අධ්‍යයනය මගින් තහවුරු කර තිබේ. සමාජයේ අන්තර්සබඳතා පවත්වාගෙන යාමට මෙම සමාජානුයොජන ක්‍රියාවලිය ඉතා වැදගත් බවත්, මෙම සමාජානුයෝජන ක්‍රියාවලිය සංස්කෘතියෙන් සංකෘතියට වෙනස් වන බව ද පෙන්වා දී ඇත. පෙරදිග සමාජයන්වල දරුවන් සමාජානුයෝජනය කිරීමේ දී ඉතා දීර්ඝ කාලයක් මව පියා පවුල සමඟ ජීවත්වන බවත්, බාහිර සමාජයන්වල එය වෙනස් බව ද තහවුරු කර ඇත. කිසියම් සමාජයක ජීවත් වීමේ දී එම සමාජයේ සිරිත් විරිත් සාරධර්ම නීති රීති පිළිබඳව දැනගත යුතුය. එය මූලික වශයෙන් ඉගෙන්වීම සිදු කරන්නේ පවුල තුළිනි. ළදරුවකු මෙලොව එළිය දුටු මොහොතේ සිටම ඔහු තුළ සහජාසයක් නොපවතින හෙයින් ස්වභාවික සත්ත්වයෙකු ලෙස ජීවත් වේ. තම මවගේ හා සෙසු සාමාජිකයන්ගේ යම් යම් ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවික මිනිසෙකු ලෙස උපත ලබන දරුවා සාමාජික මිනිසෙකු බවට පරිවර්තනය වේ. මෙම තත්ත්වය සමාජ විද්‍යාවේ ස්වභාවික මිනිසා සහ සමාජීය මිනිසා ලෙස අර්ථ දැක්වේ. මිනිසා කේන්ද්‍ර කොට ගත් මෙම සමාජානුයෝජනය ක්‍රියාවලිය එක් පරම්පරාවක සිට තවත් පරම්පරාවකට සංස්කෘතිය සමාජානුයෝජනය හරහා ආරෝපණය වන අතර පුද්ගලයා සමාජමය වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාවන් ඇති කර ගැනීමක් සිදු වේ. සමාජානුයෝජනය යනු දෙයාකාර ක්‍රියාදාමයකි. එනම් සංස්කෘතියේ අන්තර්ගතය තුළ පවතින ඉගෙනීමේ ක්‍රියාවලිය මඟින් පෞරුෂත්වය දියුණුකර ගැනීම, එම සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට ව්‍යාප්ත කරවීමේ ක්‍රියාදාමයට එක් වීමයි (රත්නපාල, 1986). පවතින දේශපාලන ක්‍රියාවලියට පුද්ගලයා සම්බන්ධ වීමේ දී පවුල තුළින් ලැබෙන දේශපාලන දැනුම ද ඉතා වැදගත්ය.

එහෙයින් දේශපාලන සමාජානුයෝජනයේ දී පවුල තුළින් ලැබෙන දායකත්වය පිළිබඳව අධ්‍යයනය සඳහා මෙම පර්යේෂණය වැදගත් වේ.

බී.ඒ. නිලූකා විජේබණ්ඩාර විසින් 2018 දී සිදු කරන ලද නූතන ශ්‍රී ලංකා සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හා මානව සම්බන්ධතා රටාවන්ගේ වෙනස්වීම පිළිබඳව අධ්‍යයනයේ දී විශ්වීය සංකල්පයක් වන පවුල සමාජයේ පැවැත්ම තීරණය කරන ප්‍රධානම සාධකය බව පෙන්වා දී ඇත. පුද්ගලයාට සමාජ පැවැත්ම තහවුරු කරන සමාජ ව්‍යුහයේ කුඩාම ඒකකය පවුල වුවත් එයට සමාජයෙන් ලැබෙන්නේ වැදගත් තැනකි. එයට හේතුව ලෙස ඇය පෙන්වා දෙන්නේ පුද්ගලයින්ගේ කායික, මානසික, සමාජීය සහ භෞතික අවශ්‍යතා සපුරා ගැනීමට පවුල දායකවන බැවිනි. පවුලටම ආවේණික වූ මෙහෙවරක් පවතින බවත් එය පවුලේ කෘත්‍යයන් හා පවුලේ මෙහෙවරයි. පවුල නැමැති සංස්ථාව කලින් කලට සාරධර්ම හා ධර්මතාවන්ගේ වෙනස් විම මත වෙනස්වන බව ද මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. නාගරීකරණයල කාර්මීකරණය හා නවීකරණය හේතුවෙන් පවුල් සංස්ථාව යම් වෙනසකට භාජනය වී ඇති බවත් පෙන්වා දෙන මෙම අධ්‍යයනය 20 වන සියවසේ දී ලංකාවේ ඇති වූ දේශපාලන, අධ්‍යාපන, සමාජීය හා සංස්කෘතික විපර්යාසයන්, විවෘත ආර්ථිකයේ බලපෑමත් නිසා මෙරට සමාජ ක්‍රමය ද විශාල වෙනසකට පරිවර්තනය වූ බවත් එම නිසා සංකීර්ණ පවුල් ස්වභාවයන් හේතුවෙන් පවුලේ සාමාජිකයින් අතර ඇති සබඳතාවන් ද වෙනස් වී ඇති බවත් අනාවරණය කර තිබේ. විශේෂයෙන්ම මව පවුල තුළින් බැහැරව මැද පෙරදිග රටවල ගෘහ සේවිකාවක් ලෙස සේවය සඳහා යෑම දරුවන්ගේ පැවැත්ම කෙරෙහි දැඩි නිශේධනාත්මක බලපෑම් ඇති කිරීමට සමත් වී ඇති බව සමාජ විද්‍යාත්මක පර්යේෂණයන්ගෙන් සනාථ වී ඇත. මිනිසාගේ ස්වභාවික චිත්තවේගී පදනම කරගත් හැසිරීම ප්‍රකාශ වීමට සාපේක්ෂව වැඩි ඉඩකඩක් පුද්ගලයා අයත්වන පවුල තුළ දී ඔහුට ලැබේ. මේ නිසා පවුලක් තුළ ඊට අයත් සියලු සාමාජිකයන් පොදුවේ පදිංචිව සිටීම ඔවුන්ගේ කායික හා මානසික පෝෂණයට ද හේතු වේ.

**පර්යේෂණ අරමුණු**

***ප්‍රධාන අරමුණ***

ශ්‍රී ලංකාවේ ඡන්ද චර්යාව කෙරෙහි බලපාන දේශපාලන සමාජානුයෝජනයේ කාරකයන් පිළිබඳව අධ්‍යයනය කිරීම.

*උප අරමුණු*

- ඡන්දදායක චර්යාව හා දේශපාලන සමාජානුයෝජනය අතර පවත්නා සම්බන්ධතාව පරීක්ෂා කිරීම.
- දේශපාලන සමාජානුයෝජනය යනු කුමක් ද සහ එහි ප්‍රධාන කාරකයන් අධ්‍යයනය කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සඳතැන්න ග්‍රාමනිලධාරී වසම තෝරා ගැනුණි. මෙම අධ්‍යයනය සඳහා වන නියැදිය තෝරාගැනීමේ දී, අධ්‍යයනයේ සංගහණය වන ග්‍රාම නිලධාරී වසමේ 2900 ක් වන ජන සංඛ්‍යාව එහි වයස අවුරුදු 20 ට වැඩි ඡන්ද බලය හිමි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම නියෝජනය වන සේ 10% ක දත්ත දායක සංඛ්‍යාවක් තෝරාගන්නා ලදී. ඒ අනුව ජනසංඛ්‍යාව 1410 කි. ඉන් 10% ක ප්‍රතිශතයක් අපේක්ෂිත නියැදිය විය.

අපේක්ෂිත නියැදිය $1410 \times \frac{10}{100}$

$= 141$

අවසාන වශයෙන් 141 දෙනෙකුගෙන් යුත් දත්තදායක සංඛ්‍යාවක් නියැදිය වශයෙන් තෝරා ගැනුණු අතර, දත්ත දායකයින් 141 සම්පූර්ණ වන සේ දත්ත රැස්කිරීම සඳහා හිමබෝල නියැදුම් ක්‍රමය උපයුක්ත කර ගන්නා ලදී.

ඉහත නියැදියට අනුව තොරතුරු ලබාගැනීමේ දී ප්‍රශ්නමාලා සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය වැනි සමාජ විද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කෙරිණ. මෙහි දී සෑම දත්තදායකයෙකුටම විවෘත ප්‍රශ්න මාලාවක් ලබා දෙන ලදී. එමගින් ලැබුණු දත්ත මත පදනම්ව මෙම පර්යේෂණය සිදු කරන ලදී.

දත්ත එක්රැස් කිරීමේ දී ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා ආදී රාජකාරිමය ලේඛන අධ්‍යයනය කරන ලදී. ඊට අමතරව න්‍යායාත්මක තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල ලිපි සහ පුවත්පත් ලිපි ආදී ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් පර්යේෂණයට අදාළ තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. ලබා ගත් දත්ත විශ්ලේෂණය සඳහා SPSS මෘදුකාංගය භාවිතා කරන ලදී. එම විශ්ලේෂිත දත්ත, සංඛ්‍යා, ප්‍රතිශත, දත්ත වගු සහ ප්‍රස්තාර සටහන් භාවිතා කරමින් දත්ත නිරූපණය කරන ලදී.

ඈත අතීතයේ මායා රටට අයත්යැයි සැලකුණු නුවරඑළිය දිස්ත්‍රික්කයට 1818 කැරැල්ලේ දී වැදගත් ස්ථානයක් හිමිව ඇත. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ සිටම ආණ්ඩුකාරවරුන්ගේ අවධානය යොමු වූ නුවරඑළියෙහි ජනවර්ග විවිධත්වයෙන් සහ රටේ ආර්ථිකය සමෘද්ධිමත් කරන සංචාරකයන්ගෙන් පිරි නගරයක් බවට අද එය පත්ව තිබේ. ඒ අනුව දිනෙක් දින විවිධ ජනතාවන් සමඟ සම්බන්ධතා පවත්වන නුවරඑළි ජනතාවගේ දේශපාලන සමාජානුයෝජනය සහ මැතිවරණවල දී ඡන්දදායක චර්යාව සකස් වීමට එය බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම කාලෝචිතය. එබැවින් නුවරඑළිය සඳතැන්න ග්‍රාම සේවා වසම ආශ්‍රයෙන් ඡන්දදායක චර්යාව කෙරෙහි දේශපාලන සමාජානුයෝජනයේ බලපෑම මූලික අරමුණ කරගනිමින් මෙම සමීක්ෂණය සිදු කරන ලදී. එහි දී ප්‍රතිචාරකයන්ගෙන් විශාල තොරතුරු ප්‍රමාණයක් මේ සම්බන්ධව ලබාගත් අතර මූලික තොරතුරු වශයෙන් ඔහුගේ හෝ ඇයගේ වයස් පරතරය, ස්ත්‍රී පුරුෂභාවය, සිවිල් තත්ත්වය, අධ්‍යාපනය මෙන්ම රැකියාව පිළිබඳ තොරතුරු සපයා ගත් අතර ඔහු හෝ ඇය දේශපාලනය පිළිබඳ උනන්දු වන ආකාරය, එසේම ඡන්දය භාවිත කරන ආකාරය, ඔවුන්ගේ ඡන්දදායක චර්යාව, ඡන්දය ප්‍රකාශ කරන්නේ ද යන වග, එමෙන් ම ඡන්දය ප්‍රකාශ කිරීමෙන් බලාපොරොත්තු වන දේවල් මෙන්ම ඡන්දය භාවිත කිරීමේ දී මූලිකත්වය දෙන කරුණු පිළිබඳව විමසා තොරතුරු එක් රැස් කර ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

**සොයාගැනීම් සහ ප්‍රතිඵල**

මෙම පර්යේෂණය සඳහා යොදාගත් දත්තදායකයින්ගේ මූලික තොරතුරු පහත වගු අංක 01 හි සඳහන් වේ. ඒ අනුව අධ්‍යයනය සඳහා දත්තදායකයින් 141 ක් යොදාගත් අතර ඔවුන්ගෙන් ලද තොරතුරු මත මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය.

වගු අංක 01: ප්‍රතිචාරකයාගේ මූලික තොරතුරු

| වයස | | ස්ත්‍රී/ පුරුෂ භාවය | | අධ්‍යාපන මට්ටම | | | | වෘත්තිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 20-59 | 60ට වැඩි | ස්ත්‍රී | පුරුෂ | 1-5 දක්වා | 6 - 9 දක්වා | අ.පො.ස. (සා/පෙළ) දක්වා | අ.පො.ස. (උ/පෙළ) හෝ ඊට වැඩි | කම්කරු | රජයේ රැකියා | පෞද්ගලික රැකියා |
| 136 | 5 | 70 | 71 | 67 | 31 | 43 | 8 | 111 | 12 | 18 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

මෙම ග්‍රාමසේවා වසම තුළ සමස්ත ජනගහනය 2970 කි. එම ජනගහනය වයස් සීමාවන්ට අදාළව පහත වගු අංක 02 හි සඳහන් පරිදි පෙළගැස්විය හැකිය.

වගු අංක 02. වයස් මට්ටම් අනුව ජනගහනය

| | |
|---|---|
| 0-5 | 490 |
| 6-19 | 1070 |
| 20-59 | 1358 |
| 60 ට වැඩි | 52 |
| එකතුව | 2970 |


මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

වගු අංක 03. ජනවර්ග අනුව පවුල් සංඛ්‍යාව

| පවුල් ගණන | සාමාජිකයින් ගණන |
|---|---|
| සිංහල | 1110 |
| ශ්‍රී ලාංකික දෙමළ | 50 |
| ඉන්දියානු දෙමළ | 1480 |
| මුස්ලිම් | 330 |
| එකතුව | 2970 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

ඉහත වගු අංක 02 ට අනුව වැඩිම ජනගහනය සිටින්නේ 20 -59 ත් අතර වයස් කාණ්ඩයේය. එය සමස්ත ජනගහනයෙන් 45% කි. අඩුම පිරිසක් සිටින්නේ වයසක පිරිස අතරය. එනම් වයස අවුරුදු 60ට වැඩි පිරිස මුළු ජනගහනයෙන් 17% කි. මෙම ග්‍රාමසේවා වසම තුළ සිංහල, ශ්‍රී ලාංකික දෙමළ, ඉන්දියානු දෙමළ, ඉන්දියානු දෙමළ සහ මුස්ලිම් ලෙස විවිධ ජනවර්ගවලට අයත් පවුල් සිටින අතර ඒ පිළිබඳ තොරතුරු ඉහත වගු අංක 03 හි දැක්වේ.




රූප සටහන් 01. ජනවර්ග අනුව පවුල් සංඛ්‍යාව

මෙම ග්‍රාමසේවා වසම තුළ වැඩිම ජනවර්ගය ඉන්දියානු ද්‍රවිඩ වන අතර එය මුළු ජනගහනයෙන් 49% ක් වේ. සිංහල ජනවර්ගට හිමි වන්නේ දෙවන ස්ථානයයි. මේ ප්‍රදේශය තුළ බහුතරය වන්නේ සුළුතර ජනවර්ගයි. සිංහල ජනවර්ගය හැරුණු විට මෙම ප්‍රදේශයේ 63% ක් සිටින්නේ සුළු ජනවර්ග බව ඉහත රූප සටහන් 01 ට අනුව පැහැදිලි වේ.

මෙම ග්‍රාමසේවා වසමේ ජනතාව තම එදිනෙදා ජීවිකාව ගෙනයාමට කුලී වැඩ කරන අතර, ඊට අමතරව එළවලු වගාවන් සිදු කරති. තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට බොහෝ වෙහෙසෙන ජනතාවක් සිටින මෙම ප්‍රදේශය තුළ සමාජීය, ආර්ථික වශයෙන් ගැටලු රාශියක් දැකිය හැකිය. වගාවන් සිදු කරන වතු හිමියන් විසින් දිනකට රුපියල් 1200-1500 අතර මුදලක් ලබා දෙමින් සාමාන්‍ය ජනතාවගේ ශ්‍රමය ලබා ගනිති. වගාකරුවන්ට ප්‍රමාණවත් පොහොර නොලැබීම, සහනදායි ණය පහසුකම් නොලැබෙන බවත් අධ්‍යයනය තුළින් තහවුරු විය. ඇතැමුන් තම නිවෙස් තවාතැන් පහසුකම් මත ලබා දෙමින් යම් මුදලක් උපයා ගනි. මෙම ග්‍රාමසේවා වසමේ වැඩි කොටසක් වැවිලි කම්කරුවන්ය. දලු නෙළීම වැනි කුලී රැකියාවන් ද ඔවුන් විසින් සිදු කරති. සමස්තයක් වශයෙන් ගත් විට දුප්පත් ජීවිතයක් ගෙවන බහුතරයක් සිටින මෙම ප්‍රදේශයේ අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පවතී. එනිසා රටේ පවතින දේශපාලන ක්‍රියාවලිය පිළිබඳව මෙම ජනතාවට ඇත්තේ අවිධිමත් අවබෝධයකි.

සඳතැන්න ග්‍රාමසේවා වසමේ ග්‍රාමීය ජනතාව විද්‍යුත් මාධ්‍ය වශයෙන් රූපවාහිනිය නැරඹීමට වඩාත් ප්‍රිය කරති. ඔවුන් රටේ දේශපාලනය පිළිබඳව අවිධිමත් දැනුම ලබාගන්නා ප්‍රධාන මාධ්‍ය රූපවාහිනියයි. ඊට අමතරව පුවත්පත් හා ජංගම දුරකතන මාර්ගයෙන් මෙන්ම සමාජ මාධ්‍ය භාවිතයෙන් ජනතාව දේශපාලන දැනුම ලබා ගනිති. මෙම ජනතාවගේ දේශපාලන චර්යාවට ප්‍රබල බලපෑමක් සිදු කරන්නේ ජනමාධ්‍යයයි.


මෙම ග්‍රාමසේවා වසම තුළ ජනතාවගෙන් බොහෝ දෙනා සෑම මැතිවරණයක දීම ඡන්දය භාවිත කර ඇති බව තහවුරු විය. තවදුරටත් ඇතැමුන් එකම දේශපාලන පක්ෂයකට පමණක් ඡන්දය දීමක් සිදු කර තිබුණි. ඔවුන් ප්‍රකාශ කරන්නේ තම පරම්පරාවෙන්ම තනි දේශපාලන පක්ෂයකට පමණක් ඡන්දය ලබා දුන් හෙයින් තමන් ද එලෙසම සිදු කරන බවයි. තම පවුල් පරිසරයෙන් ලැබෙන බලපෑම හේතුවෙන් එම දේශපාලන පක්ෂවලට ඡන්දය ලබා දෙන බවත් ඔවුන්ගේ අදහස විය. මැතිවරණ කාලය තුළ ජනමාධ්‍ය තුළින් මැතිවරණය පිළිබඳව දේශපාලන කතිකාවත් ඇති කිරීම, ඡන්ද පත්‍රිකා පිළිබඳව යම් අවබෝධයක් ලබාදීම, ඉදිරිපත්වන අපේක්ෂකයන්ගේ නම් සහ ලකුණු ඉදිරිපත් කරමින් වෙළෙඳ දැන්වීම ප්‍රචාරණය කිරීම යනාදි දේශපාලන දැනුම ලැබීම වැදගත්යැයි දත්තදායකයින් බොහෝ දෙනාගේ අදහස විය. ඇතැමුන් සමාජ මාධ්‍ය ද භාවිතයෙන් දේශපාලන දැනුම අවධිමත්

ආකාරයට ලබාගනියි. මෙම ජනතාව බහුතරයක් ද්‍රවිඩ නිසා ද්‍රවිඩ නායකයින්ගේ අදහස්වලට ප්‍රමුඛත්වයක් හිමිවන බව පැහැදිලි විය.

වගු අංක 04. ඡන්දදායකයින්ගේ දේශපාලන සහභාගීත්වය

| | පිළිතුර | | |
|---|---|---|---|
| | ඔව් | නැත | තරමක් |
| සෑම මැතිවරණයකදීම ඔබ ඡන්දය පාවිච්චි කර තිබේද? | 89 | 32 | 20 |
| ඔබ එක් දේශපාලන පක්ෂයකට පමණක් ඡන්දය භාවිතා කරන්නෙක් ද? | 76 | 47 | 18 |
| ඔබ ඡන්දය භාවිතා කරන්නේ පවුලේ දේශපාලන මතය අනුවද? | 86 | 31 | 24 |
| ඔබ ඡන්දය පාවිච්චි කිරීමේදී ජනමාධ්‍ය බලපානවාද? | 96 | 8 | 37 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)




රූප සටහන 2. ඡන්දදායකයින්ගේ දේශපාලන සහභාගීත්වය

ඉහත රූප සටහනට අනුව ජනමාධ්‍යවල බලපෑම ඡන්දදායකයින්ට සෘජුවම බලපා ඇති බව තහවුරු වේ. එය 68% ක් නිශ්චිතවම ප්‍රකාශ කර ඇත. ජනමාධ්‍ය එලෙස බලනොපාන බව ප්‍රකාශ කරන්නේ ඉතාම අවම ප්‍රමාණයක් පමණි. ඔවුන්ගෙන් ඇතැමුන්ට රූපවාහිනි නැත. ඇතැමුන්ට ඒවා නැරඹීමට කැමැත්තක් නොමැති තරමය. ඔවුන් උදෑසනම කුලී රස්සාවට ගොස් නිවසට පැමිණෙන්නේ අඳුරු වැටීමත් සමඟය. මොවුන්ට පුවත්පතක් කියවීමට පවා කාලය ඇත්තේ අවම වශයෙනි. එනිසා ඔවුන්ගේ දේශපාලනය පිළිබඳව පවතින දැනුම අවබෝධය ඉතා පහළ මට්ටමක පවතී. එනිසා 6% කගේ අදහස වූයේ එවැනි බලපෑමක් හෝ ඡන්දය යම් පක්ෂයකට දැමීම සඳහා පෙළඹවීමක් ජනමාධ්‍ය මඟින් සිදු නොකරන බවත්ය. 26% කගේ මතය නිශ්චිත නොවුණි. එහෙත් ඔවුන් අතරින් පවා හැඟවෙන්නේ ජනමාධ්‍ය යම් ආකාරයකට ඡන්දදායක චර්යාව සකස් වීම සඳහා බලපාන බවයි. තව ද ඡන්දය ප්‍රකාශ කිරීමේ දී පවුලේ දේශපාලනය යම් ආකාරයකට බලපෑමක් සිදු කරන බව 76

දෙනෙකුගේ අදහස විය. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් විට 53% කි. පවුලේ දේශපාලනය බලනොපාන බවත්, ඡන්දය ප්‍රකාශ කරන්නේ තමන්ට යම් සහනදායි ප්‍රතිපත්ති සකස් කරන්නේ නම් පමණක් බවත්ල 14% ක් වූ දත්ත දායකයින්ගේ අදහසයි. ඔවුන් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ මැතිවරණ කාලවල දී වඩාත් ජනතාව වෙනුවෙන් සේවාවක් කරාවි යැයි විශ්වාස කරන අයට තම ඡන්දය ප්‍රකාශ කරන බවයි.


සෑම මැතිවරණයක දීම තම ඡන්දය පාවිච්චි කිරීමේ ප්‍රවණතාවයක් මෙම ජනතාව අතර පවතී. එනම් 63% කගේ අදහස වන්නේ සෑම මැතිවරණයක දීම තම ඡන්දය පාවිච්චි කරන බවයි. ග්‍රාමීය ජනතාවගේ ඡන්දය එකම පක්ෂයක් සඳහා ලබාදෙන්නේ ද යන්න පර්යේෂණය තුළ සොයා බලන ලදී. මෙම දත්තදායකයින්ගෙන් 54% ක් තම ඡන්දය ලබාදෙන්නේ එකම දේශපාලන පක්ෂයකටය. පාරම්පරික දේශපාලනය මේ සඳහා බලපා තිබේ. නමුත් 33% ක් එම මතයට එකඟ නොවූණි. ඔවුන් පෙන්වා දෙන්නේ එකම පක්ෂයක් ගැන කිසිදු විටක කල්පනා නොකරන බවත්, කාලීන අවස්ථා මත තම ඡන්දය ප්‍රකාශ කරන බවත්ය.

සෑම මැතිවරණයක දීම ඡන්දය භාවිතා කිරීමට දැඩි උනන්දුවක් දක්වන මෙම ග්‍රාමීය වැසියන්ගේ ඡන්දදායක චර්යාව කෙරෙහි විවිධ සාධක බලපානු ලබයි. ඒ තුළ පවුල, දේශපාලන පක්ෂ (පක්ෂ නායකයින් ඇතුළුව), ජනමාධ්‍ය, ආගම, ජනවර්ගය, ස්ත්‍රී පුරුෂභාවය,ල වයස් සීමාව, අධ්‍යාපනය යනාදී සාධක මත ඒවා තීරණය වන බව නිගමනය කළ හැකිය. මෙම ග්‍රාමනිලධාරී වසම තුළ ජීවත්වන ඡන්දදායකයන්ගේ ඡන්ද චර්යාව කෙරෙහි ඉහත සාධක කෙසේ බලපා ඇත් ද යන්න වගු අංක 5 ට අනුව පැහැදිලි වේ.

වගු අංක 05. ඡන්දදායක චර්යාව කෙරෙහි බලපාන සාධක

| | පිළිතුරු |
|---|---|
| පවුල් පසුබිම | 76 |
| දේශපාලන පක්ෂ | 17 |
| ජනමාධ්‍ය | 12 |
| ආගම | 9 |
| ජනවර්ගය | 14 |
| ස්ත්‍රී පුරුෂභාවය | 5 |
| අධ්‍යාපනය | 4 |
| වෘත්තීය සමිති හෝ වෙනත් | 4 |
| එකතුව | 141 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)




රූප සටහන 03. ඡන්දදායක චර්යාව කෙරෙහි බලපාන සාධක

මැතිවරණයක දී තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පවුල් දේශපාලනයේ බලපෑමක් සිදු කරන බව 53%කගේ අදහස විය. එනම් තම පවුලේ බිරිද, ස්වාමියා හෝ පවුලේ ඥාතීන්ගේ දේශපාලන මතය බොහෝ සෙයින්ම තමන්ගේ ඡන්දය භාවිත කිරීමේ දී යම් ආකාරයකට බලපාන බව මොවුන්ගේ අදහස විය. බොහෝ වේලාවට පවුලේ පියාගේ ආභාසය අන් සාමාජිකයින්ට තදින්ම බලපා තිබේ. එමෙන්ම පවුලේ සාමාජිකයින් යම් දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීම උදෙසා රැස්වීම් පවත්වන බවත්, එනිසා තමන් විරුද්ධවාදී අදහස් දැක්වුවත් අදාළ මැතිවරණයේ දී තම ඥාතීත්වය සලකා ඡන්දය දීමට සිදුවන බව බොහෝ අයගේ අදහස විය. එසේම පවුලේ අන් සාමාජිකයින්ට ඇතැම් මන්ත්‍රීවරුන් රැකිරක්ෂා ලබා දී තිබූ හෙයින් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් එම පක්ෂයට ම ඡන්දය ප්‍රකාශ කිරීමට සිදුවන බව මොවුන්ගේ අදහස විය.

එමෙන්ම දේශපාලන පක්ෂ විසින් ජනතාවට අවධිමත් දේශපාලන දැනුමක් ලබාදෙන බවත්, එම අවිධිමත් දේශපාලන දැනුම ඡන්දය ලබා දීමට ඇතැම් විට දිරිගන්වන බවත්, දත්තදායකයින්ගෙන් 12% කගේ අදහස විය. මොවුන්ට අනුව මැතිවරණ කාලසීමාවේ දී රැස්වීම් විශාල ප්‍රමාණයක් පවත්වන බවත්, සෑම අවස්ථාවක දීම මැතිවරණ පොරොන්දු ලබාදෙන බවත්, ඒවා ඉටු කරනවාදැයි බැලීමටත්, ඇතැම් අය ඡන්දය ප්‍රකාශ කරති. එමෙන්ම එම රැස්වීම්වල දී ගොවිතැන් සඳහා අවශ්‍ය උපකරණ ලබාදෙන බවත් පැහැදිලි විය. පාරවල් සකස් කිරීම් වැනි සුබසාධන කටයුතු මේ කාලවල දී බොහෝ විට සිදුවන බවත්, ඒවා සම්පූර්ණ කර ගම් දියුණු කිරීමට බලය අවශ්‍ය බවත්, ඒ සඳහා අපේක්ෂකයින් නිරන්තරයෙන්ම ජනතාවගෙන් ඡන්දය ඉල්ලා සිටින බවත් ජනතාවගේ අදහස විය. ආකර්ෂණීය ප්‍රතිපත්ති ඉදිරිපත් කරමින්, දුප්පත්කම පිළිබඳව වඩාත් කථාබහට ලක්කරන බවත් ජනතාවගේ අදහස

විය. බහුතරයක් වූ ද්‍රවිඩ ජනතාවක් ජීවත්වන මෙම ප්‍රදේශයේ ඔවුන් ඉතා අවම මුදලකට තම ශ්‍රමය ලබා දෙති. එනිසා සෑම මැතිවරණයක දීම මෙන්ම අපේක්ෂකයින් ප්‍රකාශ කරන්නේ ශ්‍රමයට වටිනාකමක් ලබා දෙන බවත්, ඒ සඳහා දෛනික වැටුප වැඩි කිරීම උදෙසා නිරන්තරයෙන්ම කැපවන බවත්ය. එබැවින් ඒ කෙරෙහි අවධානය යොමු කරමින් ග්‍රාමීය ජනතාව ඡන්දය ප්‍රකාශ කරති.

ග්‍රාමීය ජනතාව තම ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ඒ සඳහා ජනමාධ්‍ය යම් ආකාරයකට බලපෑම් එල්ල කරන බව තහවුරු විය. මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද දත්තදායකයින් 141 අතුරින් 12 දෙනෙකු පමණක් ප්‍රකාශ කළේ ජනමාධ්‍ය යම් ආකාරයකට බලපෑමක් එල්ල කරන බවයි. එය 9%ක ප්‍රතිශතයකි. බහුතර ජනතාවක් රටේ සිදුවන දෑ පිළිබඳව දැනගන්නේ විද්‍යුත් මාධ්‍ය මඟිනි. එහි දී රූපවාහිනිය ප්‍රධාන වේ. ඇතැම් රූපවාහිනී මාධ්‍ය ඍජුවම දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය කරන බවත්, ඇතැම් මාධ්‍ය වක්‍රාකාරව ජනමතය වෙනස් කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී. රූපවාහිනිය භාවිතයෙන් ඇතැම් අපේක්ෂකයින් විශාල වියදමක් සිදු කරමින් තම මැතිවරණ ප්‍රචාරණයන් සිදු කරන බවත්, ග්‍රාමීය ජනතාව නිතරම ඒවා දකින හෙයින් ඡන්දය දීමට පෙළඹෙන බවත් හෙළි විය. මන්දයත් මෙම ජනතාව සමාජ මාධ්‍යවලට වඩා, අවධානය ලබා දී ඇත්තේ රූපවාහිනියටය. එනිසා ඇතැම් ජනප්‍රිය පුද්ගලයින් හඳුනාගැනීමටත්, ආකර්ෂණීය නායකයන් නිර්මාණය කිරීමටත් රූපවාහිනිය කැපවෙන බවත් ඇතැම් පිරිස්ගේ අදහස විය. එසේම ගුවන් විදුලියට සීමිත පිරිසක් ඇහුම්කම් දෙති. වඩාත් ඍජුවම ජනතා මතය වෙනස් කිරීමට රූපවාහිනිය ප්‍රධාන වන බව 9%ක් ප්‍රකාශ කරන ලදී.

ජනතාව තම ඡන්දය භාවිත කිරීමේ දී ආගම යම් ආකාරයකට බලපෑම් කරන බව සමස්ත දත්තදායකයින්ගෙන් 6% ක් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 10%ක් ප්‍රකාශ කළේ ජනවර්ගය ද මේ සඳහා බලපාන බවයි. විශේෂයෙන්ම පල්සල, පල්ලිය, කෝවිල යන දේවස්ථානවල ආගමික නායකයින් තම තමන්ගේ ජනවර්ගය සහ ආගම නියෝජනය කරන දේශපාලන පක්ෂ අපේක්ෂකයින්ව ප්‍රවර්ධනය කරන බවත්, එය ඍජුවම සිදු නොවුණත් වක්‍රාකාරව සිදුවන බව, මොවුන්ගේ අදහස විය. තම තමන්ගේ ජනවර්ගය නියෝජනය කරන අපේක්ෂකයින් වෙත ඡන්දය දැමිය යුතුයැයි මොවුන් සිතන අතර, එකම ජනවර්ගයෙන් කිහිප දෙනෙකු අපේක්ෂකයින්ව සිටින විට වඩාත් තමන්ට සමීප හා තමන් වෙනුවෙන් පෙනී සිටින අපේක්ෂකයින්ට ඡන්දය දැමීම සාමාන්‍යයෙන් සිදු වේ. තව ද අධ්‍යාපනය පිළිබඳවත් සලකා බලා අපේක්ෂකයින්ට ඡන්දය ප්‍රකාශ කරන බව ඉතා සුළු පිරිසක් ප්‍රකාශ කරන ලදී. එනම් 2% ක් තරම් වූ සීමිත පිරිසක් පමණි. ඒ අනුව අධ්‍යාපනය ඡන්දදායක චර්යාව සඳහා බලපා ඇත්තේ ඉතාම සීමිත ආකාරයටය. දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති පිළිබඳව හෝ අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් මත ඡන්දය දැමීමට බොහෝ දෙනා කටයුතු කරන්නේ නැත. කුමන හෝ වාසි සහගත තත්ත්වයක් මත ඡන්දය දැමීමට මෙම ජනතාව පෙළඹෙති. එමෙන්ම මෙම ග්‍රාමය තුළ


ජනතාවගෙන් සැදුම්ලත් විවිධ කුඩා ප්‍රමාණයේ සංවිධාන ඇත. සමිති සමාගම්වල නිලතල දරන්නේ යම් සමාජ පිළිගැනීමක් ඇති පිරිස්ය. ඔවුන්ගෙන් ඇතැම් දෙනා මැතිවරණ කාලවල දී යම් යම් දේපාලන පක්ෂවල ක්‍රියාකාරීන් ලෙස කටයුතු කරයි. එනිසා එම පිරිස් මෙම ජනතාවගේ ඡන්දය දැම්ම සඳහා වඩාත් උනන්දු වන බව 2% කගේ අදහසයි. මේ අනුව අවම ප්‍රමාණයකට හෝ වෘත්තීය සමිති සමාගම් ද ජනතාවගේ ඡන්දය දැමීම සදහා යම් බලපෑමක් සිදුකර ඇති බව පැහැදිලිය.

මෙම අධ්‍යයන පර්යේෂණය තුළ දී සොයා බැලූ තවත් කාරණයක් වූයේ මෙම ග්‍රාමීය ජනතාව තම ඡන්දය භාවිතා කොට ඉන් අපේක්ෂා කරන්නේ කුමක් ද යන්නයි. දත්තදායකයින් අතුරින් 29 දෙනෙකු හෙවත් 21% ක් ප්‍රකාශ කරනු ලැබුවේ තම ඡන්දය ලබා දෙන්නේ රැකියා බලාපොරොත්තුවෙන් බවයි. එමෙන්ම 43% ක් ඡන්දය භාවිත කර ඇත්තේ සමෘද්ධිය ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. එමෙන්ම නිවාස ආධාර, ගොවිතැන් උපකරණ යනාදි කුමන හෝ ද්‍රව්‍ය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ද මෙම ජනතාවගෙන් 26% ක් තම ඡන්දය භාවිතා කොට ඇත. මැතිවරණ අපේක්ෂකයන්ගේ ප්‍රතිපත්ති සලකා බලා යහපත් පාලනයක් උදාකර ගැනීමටත්, තම දරුවන්ට යහපත් අනාගතයක් ගොඩනැගීම උදෙසා තම ඡන්දය භාවිත කරනු ලැබූවේ 10% ක් වැනි සීමිත ප්‍රමාණයක් පමණි.

| ජනතාව තම ඡන්දය භාවිතා කොට ඉන් අපේක්ෂා කරන්නේ? | පිළිතුරු |
|---|---|
| රැකියාවක් ලබා ගැනීම | 29 |
| සමෘද්ධිය ලබාගැනීම | 61 |
| ආධාර ලබාගැනීම | 37 |
| යහපත් පාලනයක් උදෙසා | 14 |
| එකතුව | 141 |

වගු අංක 06. ජනතාව තම ඡන්දය ලබාදීමෙන් අපේක්ෂා කරනු ලබන අරමුණු

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)




රූප සටහන 04. ජනතාව තම ඡන්දය ලබාදීමෙන් අපේක්ෂා කරනු ලබන අරමුණු

ඉහත කරුණු කාරණා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ ග්‍රාමීය ජනතාව තවමත් පක්ෂ ප්‍රතිපත්තිය යනාදිය සලකා බලමින් රටේ ඉදිරිය බලා දේශපාලනයට තම ඡන්දය එක් කරනු ලබන්නේ

සීමිත ප්‍රමාණයක් වන බවයි. බොහෝ පිරිසක් තවමත් තමන්ගේ පෞද්ගලික වාසි උදෙසා පමණක් ඡන්දය දේශපාලනයට එක් කරන බව දැකිය හැකිය.

**නිගමන සහ යෝජනා**

මෙම පර්යේෂණය සඳහා යොදාගත් දත්තදායකයින්ගේ තොරතුරු මත එළඹි නිගමනය වන්නේ ඡන්දදායක චර්යාව කෙරෙහි විවිධ සාධක බලපාන අතර, එහෙත් ඒවා සෑම අයෙකුටම පොදු නොවන බවයි. ස්ත්‍රීපුරුෂභාවය, වයස් සීමාව, රැකියාව, වාසය කරන ප්‍රදේශය, දේශපාලන පක්ෂ, ආගම, පවුල් පසුබිම, අධ්‍යාපනය, මනෝමූලික සාධක, අනුකම්පාව යනාදී සාධක මත ඒවා තීරණය වන බව නිගමනය කළ හැකිය. කෙසේ වෙතත් ග්‍රාමීය ඡන්දදායක චර්යාව කෙරෙහි දේශපාලන සමාජානුයෝජනය සෘජුවම බලපාන බවත්, ජනමාධ්‍ය ප්‍රධාන කොටගත් අවිධිමත් දේශපාලන දැනුම මගින් ඡන්දදායකයින් තම පෞද්ගලික අවශ්‍යතා මත දේශපාලනයට සම්බන්ධවන බවත්, තව ද පොරොන්දු දේශපාලනය මත තවමත් ඡන්දදායකයින්ව රවටා ඡන්දය ලබා ගැනීමට අපේක්ෂකයින්ට හැකියාව පවතින බවත්, ඒ සඳහා ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය බොහෝ සෙයින්ම උපකාරී කරගන්නා බවත්ල දේශපාලන සාක්ෂරතාවය ග්‍රාමීය ජනතාව තුළ වර්ධනය වී නොමැති බවත් මෙම අධ්‍යයනය තුළින් තහවුරු විය.

ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාවලිය තුළ ග්‍රාමීය ජනතාවගේ දේශපාලන සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම උදෙසා මූලිකවම අධ්‍යාපන සාක්ෂරතාවය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. පාසල් පද්ධතිය තුළ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප ඉගෙන්වීම මඟින් නිදහස, අයිතිවාසිකම්, යහපාලනය, නීතියේ ආධිපත්‍ය යන සංකල්ප පිළිබඳව උනන්දුවත් ඔවුන් තුළ ඇති කරන අතරම, එමගින් පෞරුෂත්වය ගොඩනැගේ. පුවත්පත්ල සඟරා යනාදිය පිළිබඳව උනන්දුවක් ඇති කරමින් කාලීන දේශපාලන සංසිද්ධි පිළිබඳව ඔවුන්ගේ අවධානයට යොමු කිරීම ඉතා කාලෝචිතයග ප්‍රජාතන්ත්‍රවාදය තුළ මැතිවරණයන්හි වැදගත්කම මෙන්ම ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ග්‍රාමසේවා වසම් මඟින් හෝ සිදු කළ යුතුය. නියෝජන ක්‍රම පිළිබඳව ගම් මට්ටමින් විවිධ දේශන හා ක්‍රියාකාරකම් සිදු කිරීම, දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති එළිදැක්වෙන වැඩසටහන්, සියලු පක්ෂ හා අපේක්ෂකයන් එකම වේදිකාවකට ගෙන විත් එය පුළුල් ජනමාධ්‍ය ප්‍රචාරණයක් තුළ පුරවැසියන්ට ඇසිමට සැලැස්විය යුතුයග මැතිවරණ පිළිබඳව පුළුල් කතිකාවතක් රට තුළ ඇති කළ යුතුය. දේශපාලනය පිළිබඳව උනන්දුවක් පෙරට වඩා පවතින මෙම කාල වකවානුව තුළ ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් පුරවැසියන්ට ලබා දිය යුතුය.

**සමුද්දේශ**

අලුත්පටබැඳි, වී. (2009). ජනමත හැරවුම. කර්තෘ ප්‍රකාශන-.

කරුණානායක, එන්. (2000). සන්නිවේදනයට පදනම. කොළඹ, සදීපා පොත්හල.

රත්නපාල, එන්. (1986). සමාජ විද්‍යාවේ මූලධර්ම. කොළඹල සීමසහිත ලේක් හවුස් ප්‍රින්ටර්ස් පබ්ලිෂර්ස්.

සුබසිංහ, ඩබ්. (2014). සමාජ විද්‍යාත්මක භාවිතයන්. රනාල, දකුණු ආසියානු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය.

හඳරාගම, එස්. (2013). දේශපාලන සමාජ විද්‍යාව. කොළඹ, සමීර ප්‍රකාශන.

Almond, G. A., & Verba, S. (1963). *The Civic Culture: Political Attitudes and Democracy in Five Nations*. Princeton University Press.

Ball, A.R. (1994). *Modern Political and Government*, London: Macmillan Press Ltd.

Ball, A.R. and Petters, G. (2005). *Modern Political and Governmnt*, Palgrave Macmillan, New York.

Easton, D. (1965). *A Framework for Political Analysis*. Prentice-Hall.

French, S. E., Coleman, B. R., & DiLorenzo, M. L. (2013). *Linking racial identity, ethnic identity, and racial-ethnic socialization: A tale of three race-ethnicities. Identity*, *13*(1), 1–45. https://doi.org/10.1080/15283488.2012.747438

Lowi, T.J., & G, B. (2004). *American Government power and Purpose*, New York: W.W. Norton and Company.

Norris, P. (2002). Democratic Phoenix: Reinventing Political Activism. Cambridge, UK: Cambridge University Press.

Print, M. (2009). *Connecting youth political participation and civic education in Schools. Civic Education and Youth Political Participation*, 123–142. https://doi.org/10.1163/9789460910258_008

Squir, P. & Lindsay, J. (1997). *Dynamics of Democracy*, London: Brown and Benchmark Publishers.

ආඛ්‍යානnarrations
Volume 10 | Issue 01 | January-June 2025 | Article 04
ISSN 2478-0642

Open Access, Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies, Sabaragamuwa University of Sri Lanka
Submit your academic papers to director@cikcs.sab.ac.lk
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

# 2019 වර්ෂයේදී ශ්‍රී ලාංකේය නාගරික බිත්ති අවකාශ සැරසූ වීදි සිතුවම් ප්‍රවාහය පිළිබඳ විශ්ලේෂණාත්මක පසුවිපරමක්

**මනෝරංජන හේරත්,** මූර්ති කලා අධ්‍යයනාංශය, දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, manoranjanaherath@gmail.com

**Received:** 30 August 2024 / **Revised:** 03 October 2024 / **Accepted:** 11 October 2024

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණය 2019 ජනාධිපතිවරණයෙන් පසුව ශ්‍රී ලංකාවේ නගරාශ්‍රිත අවකාශවල දැඩිව පැතිරුණු වීදි සිතුවම් ප්‍රවාහය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයකි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ජයග්‍රහණයෙන් පසු, එක්තරා ජාතික හා සංස්කෘතික උද්දාමයකින් ආරම්භ වූ මෙම සිතුවම් ප්‍රවාහයට කෙටි කාලයකින්ම විශාල ජන සහභාගිත්වයක් ලැබුණු අතර, විවිධ වයස් සහ සමාජ කාණ්ඩවලට හා කලාකාර ප්‍රවර්ගයන්ට අයත් පුද්ගලයින් ආකර්ෂණය විය. මෙම වීදි සිතුවම්, දේශපාලන උද්දාමයක පසුබිමක යටිතලයකින් බිහි වුවත්, ඒවා සමාජීය, ජාතික, ආගමික සහ සංස්කෘතික අදහස්වල විචිත්‍ර සම්මිශ්‍රණයකි. විශේෂයෙන්ම, සිංහල-බෞද්ධ අනන්‍යතාව, යුද ජයග්‍රහණය, ජාතික වීරත්වය, සහජීවනය, සහ විචාරාත්මක සන්නිවේදන ආදී විෂයයන් මේ චිත්‍රවලින් ප්‍රකාශ විය. කලා නිර්මාණවල අන්තර්ගතය සහ ක්‍රියාත්මක වීමෙහි ඇති විධිමත් බවක් නොතිබුණු අතර, එය ස්වෙච්ඡාත්මක සහ අනියත් ලෙස සකස් වූ ජනප්‍රිය කලා ප්‍රවණතාවක් ලෙස පැමිණිය හැකිය. පර්යේෂණය පෙන්වා දෙන්නේ, මෙම සිතුවම් ප්‍රවාහය සමාජයේ පීඩනය, බලාපොරොත්තු, සහ විශේෂයෙන් තාරුණ්‍යයේ නිදහස් ප්‍රකාශන අවශ්‍යතාවය පිළිබඳව දැඩි සන්නිවේදන ක්‍රියාවලියක් වී ඇති බවය. එය ශ්‍රී ලාංකීය ජනගහනයේ දේශපාලනික සංවේදනයන්, සංස්කෘතික හැඳුනුම්කිරීම් සහ නායකත්වයට ඇති විශ්වාසයේ ව්‍යාකූලතාවයන් ප්‍රතිනිදර්ශනය කළ දෘශ්‍ය-මාධ්‍යමය අභිව්‍යක්තියක් ලෙස දැක්විය හැකිය. අවසානයේ, මෙම සිතුවම් රැල්ලේ ඇති නිර්මාණාත්මක භාවය, එහි තීව්‍ර සන්නිවේදන ශක්තිය, සහ

එමගින් මතු වූ සමාජීය ප්‍රතිචාර, නව කලා විග්‍රහයකට හා සංස්කෘතික විශ්ලේෂණයකට පදනමක් වන අතර, එය නූතන ශ්‍රී ලාංකීය දේශපාලන සන්නිවේදන පර්යේෂණයන් සඳහා වැදගත් සාධකයකි.

**ප්‍රමුඛ පද:** *වීදි සිතුවම්, ජනප්‍රිය කලා, සිංහල-බෞද්ධ අනන්‍යතාව, දෘශ්‍ය පරිසරය*

## හැඳින්වීම

2019 වර්ෂයේ නොවැම්බර් මස 18 දින පැවැති ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ මහතා ජයග්‍රහණය ලැබූ අතර, ඉන් අනතුරුව එකී උද්දාමය ද සමග විවිධ කණ්ඩායම් එක්ව නගරාශ්‍රිත වීදිවල සිතුවම් ඇඳීම ආරම්භ කළහ. එකී ප්‍රවණතාවය මාස 05ක පමණ කාලයක් ක්‍රියාත්මක වී අවසන් වූයේය. මෙහි දී මේ හා විවිධ පුද්ගල කණ්ඩායම් ඒකරාශී වූ අතර නොයෙක් තේමා ඇසුරින් විවිධ නගරවල වීදි බිත්ති සිත්තම් කරන්නට යෙදුණි. මෙම නිමැවුම්වල නෂ්ටාවශේෂ මේ වන විටත් (2024 මැයි) නගරාශ්‍රිතව අපට දැකගත හැකි ය. මෙකී නිර්මාණ ක්‍රියාවලිය, නොමැතිනම් වීදි චිත්‍ර ප්‍රවාහය ආරම්භ වීමට බලපෑ හේතු එකී පසුබිම හා එම නිර්මාණ භාවිතය සම්බන්ධයෙන් අප මෙමගින් සාකච්ඡා කරන්නෙමු. එම නිර්මාණයන්ගේ සමාජ සහ දේශපාලන දෘෂ්ටිවාදය එම ක්‍රියාවලියේ නිමග්න වූ කලා ශිල්පීන්ගේ තත් විෂයීය දැනුම හා ඒ පිළිබඳ වූ විචාර අදහස් සමබන්ධයෙන් ද අප විමසා බලන්නෙමු. එසේම මෙම සිතුවම් ප්‍රවාහය හා එහි භාවිතය කෙතරම් දුරට අද දවසේ දී පසුවිපරමකට තරම් වැදගත් වේද යන්න සාකච්ඡාවට බඳුන් වේ.

## පර්යේෂණ ප්‍රශ්නය සහ අරමුණු

වීදි බිත්ති සිත්තම් ප්‍රවාහයේ සමාජ සහ දේශපාලන දෘෂ්ටිවාදය එම ක්‍රියාවලියේ නිමග්න වූ කලා ශිල්පීන්ගේ තත්විෂයීය දැනුම හා ඒ පිළිබඳ වූ විචාර අදහස් කවරේද? යන්න පර්යේෂණ ප්‍රශ්නය වේ.

මෙම වීදි චිත්‍ර ප්‍රවාහය සම්බන්ධයෙන් විවිධ අදහස් ප්‍රකාශ කිරීම් හා ඊට තිබූ ප්‍රතිචාර විවිධ පුවත්පත් හා සමාජ මාධ්‍ය ජාලාවල ඉදිරිපත් විය. එහෙත් ඒ සම්බන්ධයෙන් කරන ලද විධිමත් විමසුම් අපට හමුවන්නේ නැති තරම්ය. එහෙයින් ඒ පිළිබඳව යළි සොයාබැලීම මෙහි මුඛ්‍ය අරමුණකි. මෙම චිත්‍ර රැල්ල පිළිබඳ දක්වන ලද විවිධ අදහස් යළි සලකා බලමින් මෙකී නිර්මාණකරනයේ, ප්‍රවේශය සහ එහි භාවිතය කෙතරම් දුරට සවිඥානික ද යන්න සොයාබැලීමක් තව අපේක්ෂාවකි. මෙම නිර්මාණ කිසියම් අරමුණක් හෝ දෘෂ්ටිවාදයක් මත පදනම්ව ක්‍රියාත්මක වූයේ ද යන්න විමසීමත් මෙහි දී සිදුවේ. මෙම නිර්මාණවලට දායකත්වය දැක්වූ ශිල්පීන්ගේ කලා කුසලතාවය දැනුම හා ඒවායේ තත්ත්ව/නිර්මාණාත්මක ප්‍රකාශනය පිළිබඳ විමසීම ද අරමුණු කෙරේ.

**පසු විපරමේ වැදගත්කම**

මීට වසර පහකට පමණ පෙර ශ්‍රී ලාංකේය සමාජයේ විශේෂ අවධානයකට ලක් වූ නගර තාප්පවල චිත්‍ර ඇඳීමේ කෙටිකාලීන ප්‍රවාහය අප යළි සලකා බලන්නේ ඇයි? යන්න ගැටලු සහගත විය හැකිය. මක්නිසා ද එය අද දවසේ කිසිවකුගේ අවධානයට හෝ සාකච්ඡාවකට බඳුන් නොවන අමතකව ගිය අතීත ක්‍රියාවලියක් වන බැවිනි. එකී ක්‍රියාවලියේ මූලික පදනම් දැමූ ජනාධිපතිවරයා එම සමාජය විසින්ම 2022 අප්‍රේල් ජන අරගලය මගින් පන්නා දැමීම ද මෙහි දී අප සිහිපත්කර ගත යුතුය. එය විටෙක අප සමාජයේ අරුම වෙනස්වීම් හා පදනම් පිළිබඳ ප්‍රශ්න කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකේය සමාජයේ ජන විඥානය ඔවුනගේ හැසිරීම් රටා හා ප්‍රතික්‍රියා විමසීමෙහි ලා මෙම සිතුවම් ප්‍රවාහය ඉතා වැදගත් සාධක රැසක් අප වෙත ලබා දෙයි. එය අප ජන සමාජයේ සිතුම් පැතුම් පිළිබඳ විශ්ලේෂණයට ඉතා වැදගත්වන සාධක බව පෙනී යයි. ජනතා කල්පනාවන් අපේක්ෂා හා ඔවුනගේ දැක්ම පිළිබඳව සොයා බැලීමේ අගනා දෘශ්‍ය පදීත ලෙස මේවා සලකා බැලිය හැකිය.

එකල චිත්‍ර කලාවේ නව ප්‍රබෝධයක් ලෙස ඇතමුන් අරුත් ගන්වන ලද මෙම වීදි චිත්‍ර ප්‍රවාහය; ඉතා ඉහළින් ඇගයූ මෙම කලා ධාරාවල අද දවසේ දී යළි විමසීමත්ල ප්‍රශ්න කිරීමත් ඉතා වැදගත් වේ. ඒ මන්ද මෙම කලාව සැබෑ ලෙස ම පෙනී සිටියේ කවර අරමුණක් වෙනුවෙන්දැයි යන ප්‍රශ්නකාරී තත්ත්වය නිසාවෙනි. එමගින් තත් විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රගමනය උදෙසා මෙහි බලපෑම කෙසේදැයි විමසීමට හැකි වේ.

**සාකච්ඡාව**

වර්ෂ 2019 දී ශ්‍රී ලංකාවේ පැවැති ජනාධිපතිවරණයෙන් බලයට පත් වූයේ ගෝඨාභය රාජපක්ෂ මහතාය. නිර්පාක්ෂික අපේක්ෂකයකු ලෙස බහුතර වැඩි ඡන්දයෙන් ඔහු ජයගත් අතර ඉන් අනතුරුව දිවයිනේ බොහෝ නගරවල විවිධාකාරයේ සිතුවම් ඇඳීමේ ප්‍රවණතාවය ඇරඹිණි. එහිලා බොහෝ තරුණ ප්‍රජාවගේ දායකත්වය හිමි වූ අතර එම ක්‍රියාවලිය මාස පහක පමණ කාලයකින් අවසන් විය. මෙම වීදි සිතුවම් ප්‍රවාහය ඉතා ජනප්‍රිය වූ අතර විවිධ අනුග්‍රාහකයන්, සහය දක්වන්නන් හා විවිධ වයස් කාණ්ඩවල ජනයා ඊට එකතු විය. මෙම පසුවිපරම ඇසුරින් අප සාකච්ඡා කරනුයේ මෙම "චිත්‍ර ප්‍රවාහයේ" ප්‍රභවය පසුබිම, භාවිතය හා විකාසනය හා එහි අද දවසේ තත්වය සම්බන්ධයෙනි.

මෙහි දී එකී සිතුවම් මගින් කවර නම් අර්ථ නිෂ්පාදනය කළේ ද? ඒවා තත්සමාජයට කවර නම් බලපෑමක් කළේ ද? හා එකී නිර්මාණ ප්‍රකාශනවලැති ගුණාත්මක අගය කවරක් ද? යන්න විමසනු ලැබේ. මීට වසර පහකට පෙර බිත්තිවල අන්තර්ගත කළ එකී ප්‍රකාශන වල අවශේෂ අද දවසේ ද දෘශ්‍යමානය. ඒවා ප්‍රභවය වීමට බලපාන ලද හේතු තවදුරටත් වලංගු ද? ඒවා කලා නිර්මාණ ලෙස

තාමත් වැදගත් වන්නේ ද? ඒවා සැබෑ ලෙස ම කලා නිර්මාණ ද? හා එකී නිර්මාණකරණයට දායක වූ සැම මෙය නොසලකා හැර ඇත්තේ ඇයි? යන ප්‍රශ්න මෙහි දී අපගේ පසුවිපරමට හසු වේ.

පූර්ව සඳහන් කරුණු සම්බන්ධයෙන් විමසීමට පෙර මෙකී වීදි චිත්‍ර ප්‍රවාහය කවරනම් ගණයකට අයත්දැයි සොබා බැලිය යුතු වේ. ලෝකයේ මෙවන් ආකාරයේ කලා ව්‍යාපෘති හෝ භාවිතයන් කවරේදැයි හඳුනාගැනීම මගින් අපගේ වීදි සිතුවම් ප්‍රවාහය යනු කවරක්දැයි යන්න විභාග කිරීමට අවැසි දාර්ශනික පදනම අපට හමු වේ. එමගින් අපගේ මෙම කෙටිකාලීන කලා ප්‍රවණතාවයේ සැබෑ මුහුණුවර විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් විග්‍රහකොට ගත හැකිය.

මෙම වීදි චිත්‍ර ප්‍රවාහයේ ආශිර්වාදය හා හෙවනැල්ල වූයේ ගෝඨාභය රාජපක්ෂ නිර්පාක්ෂික නායකත්වය හා එය පිළිගත් සමාජය බව අප දන්නා අතර එවන් හා ඊට වඩා බහුතර ජන අරගලයක් ඔස්සේ ඔහුව එකී ධූරයෙන් ඉවත් කිරීමට පසුකාලීනව (2022 අප්‍රේල්) ජන අරගලයක් ද සිදු කළ බව අපි දනිමු. ශ්‍රී ලාංකේය ප්‍රජාවගේ එකී හැසිරීම් රටාවන් ද තේරුම් ගනිමින් අපගේ ප්‍රස්තුත මාතෘකාව පසුවිපරම් කිරීමට සිදුව තිබේ. එහි දී චිත්‍රය හා චිත්‍ර කලාව යන නිර්මාණය හා විෂය පථයට අදාළව මෙම විමර්ශන කෙරේ. එකල බහුතර ශ්‍රී ලාංකේය ජන සමාජයේ බලාපොරොත්තු පිළිබඳ ෆැන්ටසිය මෙකී සිතුවම් තුළ ගැබ් වූ අතර අප විසින් එම දෘශ්‍ය සන්නිවේදන පඨිතයන් යළි අධ්‍යයනය කරමින් මෙකී සාකච්ඡාව ගොඩනංවනු ලැබේ.

**චිත්‍රය සන්නිවේදන මාධ්‍යයක් ලෙස**

මානවයා සිය අදහස් ප්‍රකාශ කිරීමෙහි ලා ප්‍රබල අවියක් ලෙස චිත්‍රමය සටහන් හා සංකේත නිර්මාණය කළේ ඉතා දිගු ඉතිහාසයක පටන්ය. මෙම නිර්මාණ මගින් විවිධ අදහස් ඉදිරිපත් කරන බවට විද්වතුන් අදහස් දක්වා ඇති අතර, මේවා බොහෝ විට නිමවා ඇත්තේ ඔවුන් ජීවත් වූ පොදු අවකාශවල බව පෙනේ. පූර්ව ඓතිහාසික ගුහා සිතුවම් මීට කදිම නිදසුන් සපයයි.  ඔවුනගේ චාරිත්‍ර හා සම්ප්‍රදායන් එමගින් ඉදිරිපත් කොට ඇත (Doug Bailey, (2010) pp.1-26.).  මෙකී දෘශ්‍ය ප්‍රකාශන ක්‍රම තවදුරටත් සංවර්ධනය වෙමින් අක්ෂර භාවිතය වඩා ප්‍රබල සංනිවේදන මාධ්‍යයක් වූ බව සුමේරියානු කලාව විමසීමේ දී අපට පසක් වේ (Samuel Noah Kramer. (1963). තවදුරටත් ඒවා පෝෂණය වෙමින් මුද්‍රණ ක්‍රම මගින් අදහස් ප්‍රකාශ කළ මිනිසා අද වන විට විද්‍යුත් මාධ්‍ය ඉතා ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස යොදාගෙන ඇත. චිත්‍රපට මගින් වඩාත් උසස් රසවින්දයක් ද සහිත අදහස් ප්‍රකාශනයක යෙදීම මෙහි දී විශේෂත්වයට පත්ව ඇත. මේ ආකාරයෙන් විවිධ ක්‍රම ඇසුරින් මානව සංවර්ධනයේ දියුණුවත් විවිධ ක්‍රම ඇසුරින් අදහස් ප්‍රකාශ කරනු අපිට එකී ගමන් මග විමසීමෙන් හැඳින ගත හැකිය. එහි දී චිත්‍රය නමැති දෘශ්‍ය මාධ්‍යය තවදුරටත් වැදගත් සන්නිවේදන මෙවලමක්

ලෙස නොනැසී පවතිනු පැහැදිලිය. සමකාලීන සමාජයීය මානවයා ද මෙකී දෘශ්‍ය ප්‍රකාශන මාධ්‍යය සිය අදහස් ප්‍රකාශනයෙහි ලා යොදාගත් බව අපගේ වීදි සිතුවම් නිරීක්ෂණයෙන් ද පෙනී යයි.



2024 මැයි මස මනෝරං ජන හේරත් විසින් ඡායාරූපයට නගන ලද
ගම්පහ නගරයේ වීදි සිතුවමක කොටසක්

ශ්‍රී ලාංකේය බිතු සිතුවම් සම්බන්ධයෙන් අපිට දිගු ඉතිහාසයක් පවතින අතර, ඒවා පුරාණ ආගමික කලාංග/ස්ථාන ඇසුරින් හමුවේ. මේවා විවිධ ශෛලීන් ක්‍රමවේද හා තේමාවලට අනුව නිමවා ඇති අතර, ඒ සියල්ල නිමවා ඇත්තේ නිශ්චිත වූ අවකාශයන් තුළය. ඒවා වීදීවල අඳින ලද සිතුවම් නොවන අතර පොදු බැතිමතා හා නරඹන්නා එකතු වන ස්ථානවල නිර්මාණය කොට තිබේ. මේ අතර කුරුටු ගෑ සිතුවම් සටහන් ලෙස අපට හමුවන පැරණිම සාධක සීගිරිය කැටපත් පවුරෙන් හමු වේ. ඒ හැරෙන්නට ශ්‍රී ලාංකේය ආදිවාසීන් විසින් අඳින ලදැයි විශ්වාස කෙරෙන සෙල් සිතුවම් ප්‍රකාශන ද ලාංකේය දෘශ්‍ය ප්‍රකාශන සන්නිවේදනයේ සාධක සටහන් කරයි (Bandaranayaka. (1986).

අපගේ ප්‍රස්තුතය හා බැඳී පවත්නා බිත්ති සිතුවම් සම්බන්ධයෙන් සලකාබැලීමේ දී අපගේ මතකයට නැගෙන අවස්ථා කීපයක් වේ. ශ්‍රී ලංකාවේ පාසල් අභ්‍යන්තර ගොඩනැගිලි සිතුවම්වලින් විචිත්‍ර කිරීමේ මෑතකාලීන ඉතිහාසයක් අපට පවතී. එමගින් විවිධ යහපත් උපදේශන හා පණිවුඩ ලබා දීම අපේක්ෂා කෙරිණි. තවදුරටත් මේවා පාසල් අභ්‍යන්තරයෙන් එළියට අවුත් පාසල් තාප්ප අලංකරණය කරන අයුරු ද සොයාගත හැකිය. රජයේ විවිධ ආයතන හා පෞද්ගලික සමාගම් ද එක්ව මෙවැනි තාප්පවල සිතුවම් ඇඳ ඇති අවස්ථා විය. ඒ සඳහා පාසල් ළමුන්ගේ දායකත්වය බොහෝ විට ලැබිණි. ඒවායේ

මුඛ්‍ය අරමුණ වූයේ ද සමාජය වෙත පණිවිඩ ලබාදීමය. ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ 'ගම් උදාව' සංකල්පය හා සමගාමීව තරග සංවිධානය කරමින් පාසල් ළමුන් සම්බන්ධ කොටගෙන ගම් උදා භූමිවල තාප්පවල සිතුවම් නිර්මාණයට අවස්ථාව ලබා දුන්නේය. එහි දී මෙකී විචිත්‍රවත් සැණකෙළිය අරබයා කලාකරුවන්ගේ දායකත්වය අති ප්‍රබල ලෙස කැපී පෙණුන බව කිව යුතුය. ගම් උදා භූමියේ ඉදිකළ තොරණ නිර්මාණ ජයසිරි සේමගේ කලා ශිල්පියාගේ විශිෂ්ට සැරසිලිමය නිර්මාණ හැකියාව ප්‍රකට කරන ලදී. ඒ හැරෙන්නට විවිධ ආයතන වෙනුවෙන් විවිධ ආයතන වෙනුවෙන් විවිධ ශිල්පීන් විසින් නිර්මාණය කළ ප්‍රචාරක රථ සැලසුම් ද පොදුජනයාගේ කලා රසවින්දනයට ඇවැසි නිර්මාණාත්මක ප්‍රවේශ ලබා දුන්නේය.

වසර 30ක් පමණ ශ්‍රී ලාංකේය සමාජයේ පැවති බිහිසුණු යුද්ධය ප්‍රධාන වශයෙන් (LTTE සංවිධානය හා ශ්‍රී ලාංකේය රාජ්‍ය අතර පැවැති) පසුකාලීන ශ්‍රී ලාංකේය කලාකරුවන්ගේ නිර්මාණ වස්තු විෂයෙහිලා බොහෝ තේමා සැපයීය. ඒවා බොහෝමයක් ජාත්‍යන්තර ව්‍යාපෘතිවල අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටියේය. 90 දශකයේ දී යුද්ධයට එරෙහි සිත්තරු නම් කණ්ඩායම මහ පාරේ ද, දුම්රිය මැදිරිවල ද චිත්‍ර නිර්මාණය කරමින් කොළඹ කේන්ද්‍රීයව සිට ඊට හඬ නගන ලදී. මෙම කණ්ඩායම් විසින් අඳින ලද චිත්‍ර, ස්ථාපන හා වෙනත් නිර්මාණ විධික්‍රම බොහෝවිට පොදු අවකාශ වෙත රැගෙන ආහ. ඒ හැරෙන්නට කොළඹ තෝරාගත් ස්ථානවල විවිධ චිත්‍ර ඇඳීමේ ව්‍යාපෘති ද ක්‍රියාත්මක විය. නගර අලංකාරික අරමුණු කොට ගනිමින් රාජ්‍ය අනුග්‍රාහකත්වය ද සමග මේවා සිදු කළ බව පෙනේ. තව ද ආපනශාලා,සංචාරක ස්ථාන ආශ්‍රයෙන් ද විවිධ චිත්‍රමය ප්‍රකාශන ඉදිරිපත් කොට ඇති බවට සාධක අපට හමු වේ. ඒ හැරෙන්නට දැවැන්ත චිත්‍රපට කටවුට්, බිත්තිපුරා අඳින ලද ප්‍රචාරක දැන්වීම් ආදිය ද මේ සම්බන්ධයෙන් ඉතා ගැඹුරින් සොයා බැලීමේ දී අපට හමු වේ.වෙසක් හා පොසොන් කාලවල දී පොදු නගර අවකාශ වෙත ගෙන ආ තොරන් නිමැවුම් ද එක්තරා ආකාරයක වීදියට එක් වූ ස්ථාපන කලාවකි. මාර්ගයේ ධාවනය වන රථ වාහන සැරසිලි මගින් ද දෘශ්‍ය කලා අංග පොදු ජනයා වෙත ළංකොට ඇත. මේ සියල්ලක්ම පොදු ජනයා බහුලව ගැවසෙන ස්ථාන හා සබැඳි බව මේ අනුව අපට පෙනී යයි.

**නාගරික වීදි සිතුවම් කලාව**

අපගේ වීදි චිත්‍ර ප්‍රවාහය සම්බන්ධයෙන් සාකච්ඡාවකට ප්‍රථම සැබෑ ලෙස ම මෙවන් ආකාරයේ සිතුවම් භාවිතය අන්තර්ගත වනුයේ කිනම් ව්‍යුහයකට යන්න සලකා බැලීම වැදගත්ය. එය කිනම් වර්ගයක්, ශානරයක්,නියෝජනය කරයි ද? යන විමසුමේ දී අපට බිතු සිතුවම් (Wall Paintings), වීදි චිත්‍ර (Street Art), කුරුටු චිත්‍ර (Graffiti Art) හා ජනප්‍රිය කලා (Pop Art) යන කලා භාවිතයන් ගැන

අවධානය යොමු කිරීමට සිදු වේ. මන්ද මේ එකිනෙක අතර යම් බන්ධුතා පෙන්වන බැවිනි. එසේ ම, ඉහත නම් සියල්ලෙන්ම ඇතැමුන් ලාංකේය නාගරික චිත්‍ර රැල්ල හඳුන්වන්නට යෙදුන බැවිනි.

බිතු සිතුවම් යනු ඉතා විධිමත් ක්‍රමවේදයක් අනුව යමින් විෂය සිද්ධාන්තමය දැනුම හා ගුරුකුල සම්ප්‍රදාය අනුගමනය කරමින් බිත්ති තල මත අඳින ලද සිතුවම් වර්ගයකි. ඒවා සැලසුම් සහගත ඉදිරිපත් කිරීම් ලෙස ද හැඳින ගත හැකිය. කුරුටු චිත්‍ර (ගැෆුටි ආට්) යනු සැඟව සිට නීති විරෝධී ලෙස කරනු ලබන සිතුවම්ය. ඒවා තුළ විධිමත්කමක් දැකිය නොහැකි අතර ආවේගශීලී අදහස් ප්‍රකාශන ලෙස ද පෙනී සිටියි. කුරුටු චිත්‍ර (Graffort Art) ගැන සැලකීමේ දී අපට ලංකාවේ විවිධ ස්ථානවල එවන් ලක්ෂණ සහිත කුරුටු සටහන් හමු වූ බවට සාධක වේ. පොදු බස් නැවතුම්පළවල දුම්රිය ස්ථානවල, කැසිකිළි, වැසිකිළිවල තාප්ප හා බංකර්වල ද, ආවේගශීලී හා කැකෑරෙන අදහස් අනවසරයෙන් සටහන් කරන ලද අවස්ථා වේ. මීට දශක කීපයකට පූර්ව එවැනි සාධක අපට හමු වුව ද දැන් එවැනි ආකාරයේ ප්‍රකාශන හමුවන්නේ අල්පවය. නූතන තාක්ෂණයේ දියුණුව ලබාදුන් මුහුණු පොත වැනි සන්නිවේදන ක්‍රම පිරික්සීමේ දී අපට එවන් ආවේගශීලී නිර්මාණ රැසක් හමු වේ. වීදි චිත්‍ර යනු පොදු අවකාශයක දැකිය හැකි කලාවකි. නගරයේ ගොඩනැගිලි බිත්ති, කුලුනු ආදියේ අඳිනු ලැබූ සිතුවම්ය. මේ තුළින් දේශපාලන අදහස්, සමාජ විවරණ හා ගැටුම් සම්බන්ධයෙන් ද ප්‍රකාශනයේ යෙදෙයි. එදිනෙදා නගරයේ ගමන් කරන විවිධ ජනයාගේ නෙත ගැටෙන ප්‍රකාශන ලෙස ගත හැකිය. ලෝකයේ, ජනප්‍රිය කලාව (Pop Art) 1950 දී පමණ වර්ධනය වූ අතර එය කලාගාර ආශ්‍රිතව ඉදිරිපත් විය. එය පාරිභෝජනවාදී සංස්කෘතිය විවේචනය කරනු ලබයි. මෙතෙක් පැවැති සම්ප්‍රදායික කලා ප්‍රවණතාවයට අභියෝග කළ කලාවක් ලෙස හැඳින්විය හැකිය.

මේ අනුව අපගේ සිතුවම් රැල්ල කවර ගණයට අයත්දැයි අපට සලකා බැලිය හැකිය. එය ජනප්‍රිය කලාව නියෝජනය නොකරන අතර බිතුසිතුවම් යන අදහස ද ඊට නොගැළපේ. Graffiti Art ලෙස නම් කිරීමට ද නොහැකිය. එය වඩාත් බන්ධුතා දක්වන්නේ වීදි චිත්‍ර වර්ගයටය. Graffiti කලා ශිල්පීන් මෙන් මෙම ප්‍රවාහයේ සිත්තරු කැකෑරෙන අදහස්වලින් යුක්තව හැඟීම් පිට කළ අය නොවන අතර සංවිධානගත වෙමින් නගර අවකාශවල සිතුවම් කළහ. ඒ සඳහා අදාළ අධිකාරියෙන් අවසර ලබාගත් අතර සහාය ද ඔවුන්ට ලැබුණි. හුදෙක් චිත්‍ර ඇඳීමේ ශිල්පීන් පමණක් නොව (මෙම ක්ෂණික කණ්ඩායම් ගත ප්‍රවාහයේ) ඒවා සංවිධානය කරන්නවුන් ද, අනුග්‍රාහකත්වය ලබාදුන් අය ද, සහයෝගය ලබාදුන් අය ද මුදලක් එකතු කළ අය මෙන් ම ප්‍රචාරණය ලබාදුන් මාධ්‍ය ආයතන ද විය.

වීදි කලාවක් ලෙස මෙය හැසිරුණ බවට අප පෙර දී අදහස් දැක්වූයෙමු. එහෙත් සමාජය වෙත ප්‍රබල අදහසක් ලබා දීමේ අරමුණු මේ සිතුවම් මගින් සිදුවූයේ දැයි කිව නොහැකිය. එහෙත් ඇතැම් කණ්ඩායම්ගත චිත්‍ර ශිල්පීන් සඳහා එවැනි උවමනා තිබූ බව පෙනේ. ජාතියේ මහා බලසම්පන්නකම

සහ ශක්තිය ද ආඩම්බරකම පිළිබඳ සිතිවිලි ද මේ ඇතැම් සිතුවම් මගින් ප්‍රකාශ කිරීම එක්තරා ආකාරයට ඔවුන්ගේ ජාතික හැඟීම පිළිබඳ මුල්බැසගත් අදහස් දෘශ්‍යමය තලයකට රැගෙන ඒමක් ලෙස අපට කල්පනා කළ හැකිය. මෙකී 2019 වීදි සිත්තරු තත් මොහොතේ පැන නැඟී තිබූ සමාජ ගැටලු හෝ අනාගත බේදවාචක හෝ එම මොහොතේ අප මුහුණදෙන අර්බුද හෝ එම සිතුවම් මගින් හඳුනාගෙන සිටි බවක් නොපෙනේ. ඒ අනුව නගර අවකාශ තුළට ඔවුන් රැගෙන ආ බොහෝ තේමා පුරවැසියාගේ බුද්ධිමය කලම්භනයට මං පෑදූ බවක් නොපෙනේ. ඒවා හුදු පුද්ගල ආකල්ප ආශාව හා වින්දනය වැනි පටු විමසුම් තලයක ගොනු වූ නිර්මාණ ප්‍රකාශන රැල්ලක් ලෙස ක්‍රියාත්මක විය.

මේ වන විට (2024) එම නිර්මාණ කළ චිත්‍ර ශිල්පියා ද, ඊට අනුග්‍රාහකත්වය දැක්වූ සමූහයන් ද, එය කලා මාධ්‍යයක් ලෙස උත්කර්ෂවයට පත් කළ මාධ්‍යය ද, එකී ප්‍රවේශය කලාවේ ශුභ නිමිත්තකැයි පැවසූ පිරිස් ද, ඊට ආශිර්වාද කළ දේශපාලන අධිකාරියෙන් ද, මෙම චිත්‍ර පිළිබඳ අවධානය ගිලිහී ගොස් හමාරය. ඒවා ප්‍රබල කලා ප්‍රකාශන ලෙස සමාජගත වූයේ නම් එවැන්නක් සිදුවීමට ඇති ඉඩකඩ අවමය. ඒ අනුව අප හුදෙක් වීදි චිත්‍ර ගණයට මෙය සලකා මෙය සාකච්ඡාවට බඳුන් කළ ද එවැනි සබුද්ධික අරමුණු සහිතව මෙය ප්‍රභවය වී විකාසනය වූ බවක් අපට නොපෙනේ.

මෙකී නිර්මාණ උදෙසා උත්තේජනය සැපයූයේ ගෝඨාභය ජනාධිපතිවරයාගේ පදවි ප්‍රාප්තිය බව අප පෙර ද සඳහන් කළෙමු. මෙම තත්ත්වයට පසු මෙන් නිර්මාණාත්මක රැල්ලක් ඇතිවූයේ ඇයි යන්න විමසීම ද කළ යුතුය. එකී වීමංසනයට අවැසි කරුණු මෙම චිත්‍ර සඳහා පාදක වූ තේමා ඇසුරින් ම අපට හමුවන අතර මෙම සමස්ත චිත්‍ර බහුතරයම එකී විශ්ලේෂණය සඳහා යොදාගත හැකිය. මෙම මොහොත (2019) යනු ඊට පූර්ව දේශපාලන අධිකාරිය මගින් මහත් පීඩනයකට ලක් කළ සමාජයක පුපුරා යාමකි. තම ආශාව හා බලාපොරොත්තුවේ නායකත්වය මෙම ජනපති මගින් ඉටුවේයැයි බහුතර ජනයා අපේක්ෂා කළ මොහොතකි. ඔවුන්ගේ ජාතියේ ගැලවුම්කරුවා ලෙස නව නායකත්වය සලකන ලද පිරිස් විසින් ම මෙය ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස ගෙන ඇති බවක් අපට නිරීක්ෂණය වේ. සෑම විටම මෙන් ශ්‍රී ලාංකේය ජනයා අවිඥානිකව වැළඳගන්නා දේශපාලන නායකත්ව හා ඊට ආසක්ත වීම, හා එකහෙලා අතාර්කිකව පිළිගැනීම යන කාරණා මෙම චිත්‍ර රැලි උම්මාදයට ප්‍රධාන හේතුවකි. එය ප්‍රවාහයක් ලෙස ක්‍රියාත්මක වූ බවට අපට අද දිනයේ දී අර්ථකථනය කිරීමේ හැකියාව ඇත. මෙම වීදි සිතුවම් ප්‍රවාහය හුදෙක් භාවිතයේ දී විධිමත් යොමුවක් පෙන්නුම් නොකළ ද එය ප්‍රවාහයක් ලෙස ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික අවකාශයේ ස්ථාපිත කිරීමේ දී පැහැදිලි සංකල්ප පද්ධතියක් සහ දෘෂ්ටිවාදයක් මත ගොඩනැගුණු නිර්මාණ ප්‍රවාහයක් ලෙස ද පෙනී සිටියි. එසේ ම එය එවකට පැවති ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධ පුද්ගල කාංසාව සහ කාලාන්තරයක් තිස්සේ ඔවුන් මුහුණ

දෙන ලද සංස්කෘතික, සාමාජීය සහ දේශපාලන ගැටුම්වල එක්තරා ප්‍රතිසන්ධාන මෙවලමක් ලෙස ද පෙන්වා දිය හැකිය.

**වීදි චිත්‍ර ප්‍රවාහයේ ප්‍රකාශන තේමා**

බැලූ බැල්මට සොඳුරු හා විචිත්‍ර? ප්‍රවාහයක් ලෙස මාස පහක් පමණ කාලයක් විවිධ නාගරික ස්ථානවල ක්‍රියාත්මක වූ අතර, මෙම චිත්‍රවල විවිධ තේමා අන්තර්ගත විය.

I. බෞද්ධ හා සිංහල ජාතිකත්වය මතු කෙරෙන තේමා හා දෘශ්‍ය සංකේත
II. යුද්ධය, එහි ජයග්‍රහණය හා වීරත්වය මතු කෙරෙන ප්‍රකාශන
III. මිථ්‍යා කතාන්දර හා ජාතියේ වීරත්වය මතු කෙරෙන තේමා
IV. විවිධ සෞන්දර්යාත්මක රූප සංරචන
V. සහයෝගිතාවය කුලුගැන්වෙන ආකාරයේ සිතුවම් සංරචන හා විවිධ ජාතික සංස්කෘති අංග විදහාපාන සිතුවම්
VI. විවේචනාත්මක හා උපහාසාත්මක චිත්‍ර සංරචන
VII. කාටූන් චිත්‍ර, මෝස්තර රටා හා වෙස් මුහුණු
VIII. වෙනත් (මෙහිදී අන්තර්ජාල ඇසුරින් ලබාගන්නා ලද චිත්‍ර, සැරසිලි, ප්‍රකාශන නම් කළ හැකිය)

එදා (2019) බහුතර ජනයාගේ මූලික බලාපොරොත්තුව වූයේ නව නායකත්වය එලදායී රටක් බිහිකරනු ඇති බවය. ඒ සඳහා සුදුසුකම් ලත් චරිතය ලෙස ඔහුව විශ්වාස කරන ලදී.(මෙම මහජන අපේක්ෂාව ශ්‍රී ලාංකේය ජන සමාජය තුල දශක ගණනාවක සිට සිදුවන්නක් බව කල්පනා කළ යුතු වේ.)

යුද සෙන්පතියකු ලෙසින් ද හෙළ ජාතියේ ගැලවුම්කරුවා ලෙසින් ද සලකමින් අඳින ලද සිතුවම් අපට පූර්ව ගොනුවේ අංක එක හා දෙක තේමා යටතට ගත හැකිය. ශ්‍රී ලාංකේය සමාජයේ අයිතිකරුවා සිංහල මහා ජාතියේ විශිෂ්ටත්වය හා උදාරත්වය එම තේමා තුළින් මතුකර දැක්විය. දුටුගැමුණු එළාර රජුගේ යුද්ධය, අවි අමෝරා සිටින 30වසරක බිහිසුණු යුද්ධයෙන් රටට ජයගෙන දුන් වීර සෙබළ රූප, සේම, යුද සෙබළා ප්‍රමුඛ කොටගත් දළදාව රැගෙන යන පෙරහැර වැනි චිත්‍ර අපගේ අදහස විභාග කිරීමේලා ඇති දෘශ්‍යමය පඨිතය. හෙළයේ, සිංහලේ අයිතිය හා විශිෂ්ටත්වය රාවණා රජුගේ රූප ඇසුරින් මතු කරන්නට ද උත්සාහ කළහ. මේ හැරෙන්නට ඒ ඒ ප්‍රදේශවල මෑත කාලීන විශේෂ පුද්ගල චරිත ද චිත්‍ර අතර අන්තර්ගතව තිබුණි. ගම්පහ නගර සිතුවම් අතරැති මහගම සේකරගේ රුව එවැන්නකි. තව ද විවිධ ජනප්‍රිය ක්‍රීඩකයන් ද මේ සිතුවම් අතරට එක් විය. ඒවා ප්‍රාදේශීය වශයෙන් සිය වටිනාකම් හුවා දැක්වීමේ අදහසින් ගෙන එන ලද රූප ප්‍රකාශනය.

ඉතා සුන්දර ආලංකාරික සමාජයක් (සිංහල බෞද්ධ සභ්‍යත්වයකින් යුතු සමාජයක්) පිළිබඳ දෘශ්‍යමය පයිීත ගොඩනැංවීමට මේ තරුණ සිත්තරෝ කටයුතු කළහ. වෙස්මුහුණු රටා, නර්තන ශිල්පීන්, ගහකොළ මෙන් ම විවිධ ආගමික සංකේත ද ඒ අතර අන්තර්ගත විය. එය මෙම ප්‍රවාහය කෙරෙහි ආසක්ත වීමට හේතු වූ අතර බහුතරයකගේ අහිංසක බලාපොරොත්තු පිළිබඳ අදහස ද කුළුගැන්වෙන සුළුය. තැනින් තැන ක්ෂණිකව බුබුළු සේ හටගත් මෙම චිත්‍ර නිර්මාණ කරන සංවිධාන ද ඉතා වේගයෙන් පැතිර ගියේය. මෙම දෘශ්‍ය මාධ්‍ය භාවිත අලංකාරික ක්‍රියාවලිය බහුතර ජනයාට නවමු අත්දැකීමක් වීම ඊට ප්‍රධාන හේතුවක් බව කිව යුතුය.



2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නගන ලද ගම්පහ නගරයේ වීදි සිතුවමක කොටසක්

**වීදි චිත්‍ර නිර්මාණ සඳහා සහභාගි වූවෝ**

මෙම කාර්යයේ (රැල්ල) ඇරඹුමට මුහුණු පොත (Facebook) සමාජ මාධ්‍යය විශේෂ කාර්යක් කරන ලදී. මේ සඳහා විවිධ ශෛලීන්ගෙන් චිත්‍ර අඳිනු ලැබූ චිත්‍ර ශිල්පීන්, ඊට ආශා කළ චිත්‍ර ශිල්පීන්, පුද්ගලයන්, මෙම විෂය උගන්වන ගුරුවරු, එය ඉගෙනගත් පාසල් ළමුන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් හා වෙනත් ප්‍රාදේශීය නිර්මාණකරුවන් එකතු විය. එහිලා සීමාවක් හෝ ප්‍රධාන බාධාවක් නොවිණි. එහෙත් මෙම වීදි කලාවේ ප්‍රමුඛයන් හා ආරම්භකයන් ලෙස කැපී පෙනීමට හා එකී අයිතිය ප්‍රකාශ කිරීමට ද ඇතැමුන් කටයුතු කළ බව කිවයුතුය. මෙහි අපූර්වත්වය වූයේ ඕනෑම කෙනෙකුට මීට

සහභාගි වී චිත්‍ර ශිල්පියකු ලෙස පෙනී සිටීමට ලැබූ අවස්ථාවය. ඒ අනුව බොහෝ චිත්‍ර ශිල්පීන් විවිධ නගර වලින් මෙයට එක් විය.



2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නගන ලද ගම්පහ නගරයේ වීදි සිතුවමක කොටසක්


මේ හරහා චිත්‍ර ශිල්පියා නමැති හිමිකම හා අයිතිය ද ඇතමුන් තහවුරු කොට ගත් අතර එය තත් ක්ෂේත්‍රය කෙරේ යහපත් ලෙස බලපා ඇතැයි කිව නොහැකිය. මේ හේතුව ද සමගින් බිහිවූ තරුණ චිත්‍ර

ශිල්පීන් සංඛ්‍යාව ද අතිවිශාල වූ බව අපට පෙන්වාදිය හැකිය. මෙය මුහුණු පොතේ විවිධ තරුණ අයගේ තරාතිරම් විස්තර සඳහන් පිටු විමසා බැලීමෙන් අපට තහවුරු කළ හැකිය. තත් විෂය සම්බන්ධයෙන් වන ප්‍රමිති පිළිබඳ ඇති මූලික අදහස මෙමගින් ඛණ්ඩනය වී ඇත. වෙනත් කලා විෂයයකට (නර්තනය, සංගීතය) සාපේක්ෂව චිත්‍ර ශිල්පියකු ලෙස සමාජගත වීමට ඇති සරල හා පහසු ක්‍රම පිළිබඳ ප්‍රවේශය ද මින් පෙන්වයි. විෂය වගවීම් හා විෂය ඥානය පිළිබඳ දාර්ශනික පදනම් ද එමගින් අභියෝගයට ලක් වූයේය. එහෙත් වීදි චිත්‍ර යනු සිය ආවේශය ප්‍රකාශ කිරීමේ කලාවක් ලෙස සැලකුවහොත් අප විසින් ගොඩනගන විදග්ධ තර්කය අහෝසි වනු ඇත. මෙම වීදි චිත්‍ර රැල්ල තුළ ආරම්භය සනිටුහන් වන්නේ ද ඉතා ජනප්‍රිය වේදිකාවක වන අතර, ඊට දිවයිනේ සිටි ප්‍රමුඛ විෂය ප්‍රාමාණිකන් හෝ දෘශ්‍ය කලා විශ්වවිද්‍යාල අධ්‍යාපන ආයතන මැදිහත් නොවුණ බව කිව යුතුය. මේ වීදි සිතුවම් රැල්ලේ උපත හා ක්‍රියාත්මක වීමේ මෙන් ම එකී සැලසුම් කෙරෙහි වාරණ ද නොවීය. එය ජනප්‍රිය රැල්ලක් වූයේ එබැවිනි. එය එක්තරා ආකාරයකට උපරිම නිදහස භුක්ති විඳීමකි සහ තාරුණ්‍ය හෝ ශ්‍රී ලාංකේය පුරවැසියා තුළ පැවති කාංසාව විදාරණය කළ අවස්ථාවක් බව අපගේ විශ්වාසයයි.

කෙසේ වුව ද ඉතා පහසුවෙන් මෙම චිත්‍ර ඇඳීමේ කාර්යයට ඕනෑම අයෙකුට මෙන් ම කණ්ඩායම්ගතව හෝ සහය දැක්වීමට හැකි විය. අවශ්‍ය වූයේ ඊට අදාළ අමුද්‍රව්‍ය හෝ උපකරණ රැගෙන යාම පමණි. මෙකී කණ්ඩායම් චිත්‍ර අඳිමින් නගරවල දිවා රෑ ගත කළහ. එකිනෙකා හඳුනාගත්හ. අදහස් හුවමාරු කොට ගත්හ. තම චිත්‍ර සංරචන අවසන් කළ අතරම පසුකාලීනව ඒවා නිමනොකරම ඉන් ඉවත්ව යන අයුරු ද අපට නිරීක්ෂණය වෙයි. මෙය තත් කලා විෂයීය ගැඹුරු වියමනක් නොවන අතරම එකී යෞවනයේ සමාජ සංස්ථාවේ එක් පැතිකඩක් පිළිබඳ විවරණයක් බව අපට පෙන්වා දිය හැකිය. එය තාරුණ්‍යයේ හා පීඩිත ජන මනැසේ නිදහසේ උතුරා ගිය කල්පනාවන්ගේ තාවකාලික කාලඡේදයක් ලෙස අපට අර්ථකථනය කළ හැකිය. මෙම විවිධ වීදි සිතුවම්වල පවත්නා විවිධත්වය, විසමබව මෙන් ම ඒකාකාරී ස්වරූපය ද දක්නට ලැබෙන්නේ ඒ හෙයිනි. අද දවසේ මෙකී නිර්මාණ හුදු රැල්ලක ක්‍රියාවලියක් ලෙස ලඝුවන්නේ ද එබැවිනි. මේවා කිසිදු වගවීමක්, නිර්ණායකයක් සහිතව සංවිධානාත්මක ව්‍යුහයකින් ඉදිරිපත් වූයේ නම් ඇතැම් විට ඒ පිළිබඳ මීට වඩා අප සැලකිලිමත් වේයැයි සිතිය හැකිය. එහෙත් නූතන චිත්‍ර කලාගාරයක්වත් හිමි නැති ශ්‍රී ලංකේය කලා රසිකයාට, මෙවන් විසිරුණු කලා නිර්මාණ ප්‍රවේශ සම්බන්ධයෙන් කිසිදු අනුග්‍රාහකත්වයක් හෝ ආරක්ෂාවක් පවතී යැයි අපට සිතීම අසීරුය. ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රාසාංගික කලාවන්ට සාපේක්ෂව චිත්‍ර කලාවට හිමිව ඇත්තේ අවම අවධානයකි. එය පොදු ජනයාගේ අවධානයට ලක්ව ඇත්තේ අඩු වශයෙනි. පැරණි විහාරයක සිතුවම් රස විඳීමක් හැරුණු කොට කලා ධාරාවේ නේක වෙනස්කම් ඔවුනට දෘශ්‍යමාන වන්නේ අඩුවෙනි. එහෙත් එකී විෂය සම්බන්ධයෙන් විමසනු ලබන පර්යේෂකයෙකුට, විද්‍යාර්ථියෙකුට හෝ රසිකයකුට නූතන තාක්ෂණය ඇසුරින් ඉතා පහසුවෙන් ලෝක දෘශ්‍ය කලාවේ

ගමන් මග විමසීම අතිශය පහසු වී ඇත. නූතන ශ්‍රී ලාංකේය කලා නිර්මාණ හුදු රාජ්‍ය හා පෞද්ගලික කලාගාර ප්‍රදර්ශනවලට සීමා වී ඇති අතර, ඒවා නැරඹීමට පැමිණෙන්නේ ඉතා සුළු පිරිසකි. අප සතුව නූතන කලාගාරයක් හෝ ජාතික කලාගාරයක්වත් මේ වන විට නොමැති අතර, චිත්‍ර අධ්‍යයනය හෝ රසවිඳීම පමණක් නොව එහි වටිනාකම තේරුම් ගැනීමටවත් ඇත්තේ අධ්‍යාපන ආයතන කිහිපයකි.

එසේ ම මෙම ආයතනවලින් විෂය හදාරන විද්‍යාර්ථීන් පවා පසුකාලීනව මෙකී විෂය සම්බන්ධයෙන් ගැඹුරු අධ්‍යයන සිදුකරනු අපට නොපෙනේ. තව ද කොළඹ කේන්ද්‍රියව පවතින මේ පෞද්ගලික කලාගාර අවකාශ වෙත අවුත් ප්‍රදර්ශන කිරීමේ හැකියාව ද සීමාසහිත අතර එකී කලාගාර අධිකාරිත්වය හමුවේ සිය ප්‍රකාශන එළි දැක්වීමට ඇති ඉඩකඩ ඉතා අවමය. කොළඹ, ගාල්ල, නුවර වැනි නාගරික අවකාශ වෙත අවුත් වීදිවල සිතුවම් ප්‍රදර්ශනය කොට අලෙවිකරණ ශිල්පීන් සමූහ අපට හමුවන්නේ මෙවැනි පසුබමකය. මෙකී පසුබිම තුළ 2019 වීදි සිතුවම් රැල්ල තත් විෂයට ඇලුම් කළ ආදරය කළ හා අවස්ථා අහිමි වූ කුඩා, වැඩිහිටි ශිල්පීන්ට ලොකු අවස්ථාවක් ගෙනදුන් බව පෙනී යයි. එය අවස්ථා උදා වීමක් මෙන් ම සිය හැකියාව ප්‍රදර්ශනය කිරීමේ හා උරගා බැලීමේ අවස්ථාවක් ද විය. ගායන හැකියා නර්තන හැකියා ඇති තරුණ තරුණියන් ඉලක්ක කොට පවත්වන විවිධ විද්‍යුත් මාධ්‍ය මගින් සංවිධානය කරන තරු වැඩසටහන් මෙන් සජීවී අත්දැකීමක් මෙගින් ළඟාකරගන්නට චිත්‍රකරණයේ යෙදී සිටි තාරුණ්‍යයට ද ලැබුණි. එය ඔවුනගේ කිසියම් ෆැන්ටසියක මල්ඵල ගැන්වීමක් ද, පීඩනයට මද අස්වැසිල්ලක් ද එක් කළා යැයි අපට කිව හැකිය. ඒ අනුව මෙකී නිර්මාණ කාර්යය සඳහා ශිල්පීන් එක්වූයේ විශේෂ පදනමකින් නොවන බව පැහැදිලිය. විචක්ෂණ දෘෂ්ටියක්, අරමුණක් හෝ ක්‍රමවේද සහිතව ඔවුහු වීදි වෙත අවුත් චිත්‍ර නිර්මාණය නොකළ අතර, ඔවුන්ගේ දැනුම් අවබෝධ සීමාව තුළ හිඳිමින් ඒවා ඉදිරිපත් කරන ලදී. සිය අභිමත රූප නිර්මාණ වීදි චිත්‍ර අතරට ගෙන ඒමේ දී වීරයන් ද, ගහකොළ සතුන් හා රටා ද එක් කළහ. මේ එකිනෙකා ආශා කළ රූප සංරචන ක්‍රමවේද, ශෛලීන් මෙන් ම ඇඳීමේ විවිධ ක්‍රමවේද ද මෙහි දී ඒ සඳහා යොදාගත්හ. මෙය ඔවුන් ඉගෙනගත්, දුටු හෝ ආශා කළ විවිධ ක්‍රමවේද යටතේ උරගා බැලූ චිත්‍ර සමූහයක් ලෙස ද ඉදිරිපත් විය. එය මෙහිලා සහභාගි වූ සැමට විශේෂිත අවස්ථාවක් ද විය. ශ්‍රී ලාංකේය සමකාලීන තාරුණ්‍යයේ ෆැන්ටසියක් ප්‍රකාශනයක යෙදුන තවත් එක් අවස්ථාවක් ලෙස ද මෙය අපට විග්‍රහ කළ හැකිය. මෙහි දී අපට සිතුවම්වල මතුපිට පෙනෙන දෘශ්‍යමය ස්වභාවය සහ එහි භාවිතයේ දී ෆැන්ටසියක ස්වභාවයක් පෙන්නුම් කළ ද එම සමාජ සංස්කෘතික මොහොත සහ එහි මුඛ්‍ය අරමුණු පිළිබඳ විමර්ශනයේ දී එහි ඊට සංකල්පීය ගැඹුරක් සහ කිසියම් කේන්ද්‍රීය යන්ත්‍රණයක් පැවති බව ද පෙනේ.






2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නඟන ලද ගම්පහ නගරයේ වීදි සිතුවම්

ශ්‍රී ලාංකේය වීදි සිතුවම් විවිධ අරමුණු සහිතව ක්‍රියාත්මක වූ බැව් අපට පැහැදිලි අතර මෙම කෙටිකාලීන නිර්මාණ ප්‍රවේශය, දෙස විවිධ ආකාරයෙන් බැලීමේ හැකියාව ඇත.

- මෙය දේශපාලන ක්‍රියාවලියකි.
- වීදි සිතුවම්කරණයේ දැවැන්ත පිබිදීමක් හා ඉදිරිපත් කිරීමකි.
- සමාජයේ යහපත් කල්පිතයක දෘශ්‍යමය හැඩතල සමග මුසු වූ අපූර්ව අවස්ථාවකි.
- තරුණ සිහිනවල ප්‍රතිබිම්බයකි.
- සිංහල ජාතියේ පෞඪත්වය පෙන්වීමට ගත් උත්සාහයකි.
- අවිඥානික අසංවිධාත්මක සාමූහික නිර්මාණ ප්‍රකාශනයකි.
- ජාතීන් අතර සහයෝගිතාවය ඇති කළ ප්‍රතිසන්ධානගත ව්‍යාපෘතියකි.
- චිත්‍ර ශිල්පීන්ට සිය හැකියාවන් පෙන්වීමට ඉඩකඩ ලද මහඟු අවස්ථාවකි.
- නාගරික අවකාශ දෘශ්‍ය දූෂණයට ලක් කළ ක්‍රියාවලියකි.
- මහා ජාතිය විසින් අනෙකා වෙත එල්ල කරන ලද පීඩනය තීව්‍ර කරනු ලබන දෘශ්‍ය වියමනකි.

මේ ආදී ලෙස 2019 වීදි චිත්‍ර අධ්‍යයනය කළ හැකි අතර, එමගින් මෙම චිත්‍ර වල වූ සමාජ දේශපාලන දෘෂ්ටිවාදය හඳුනාගැනීමේ හැකියාව ඇත.



2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නගන ලද ගම්පහ නගරයේ වීදි සිතුවමක කොටසක්



2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නගන ලද කිරිල්ලවල නගරයේ වීදි සිතුවමක කොටසක්

ඉතා භයංකර යුද්ධයකට මුහුණ දුන් ශ්‍රී ලාංකේය ජන මනස තුළ එකී බිහිසුණු අතීතය පිළිබඳ මතක වැළලී නැත. එහි දී එය අවසන් කිරීමේ ගෞරවය හිමි වූයේ සිංහල සොල්දාදුවාටය. (එය සිංහල ජාතිය පැත්තෙන් විමසීමේ දීය) එබැවින් නගර චිත්‍රවල මේ රණකාමී යුද සෙබළා නිරූපිත සිතුවම් විය. එය යුද්ධය ජය ගැනීමේ අභිමානය ද, ජාතියේ වීරත්වය ද මතු කළ අතර අනෙක් පසින් අවසන් වූ ගැටුමක අමිහිරි මතක යළි සමාජගත කරමින් කරනු ලැබූ පීඩනය ද සනිටුහන් කරනු ලැබීය. ජාතියේ ආරක්ෂකයා, ලෙස බහුතරය නව ජනපතිවරයාට දැක්වූ කැමැත්ත ද මෙමගින් ප්‍රකාශ වේ. සිංහල බෞද්ධ ජනයා නිරන්තර මතු කරන්නට හදන මහා ජාතිය පිළිබඳ ප්‍රකාශනය මෙමගින් සංකේතවත් කිරීමට උත්සාහ දැරූ බව ද පෙනේ. එළාර - දුටුගැමුණු ඓතිහාසික කතාව, චිත්‍ර මගින් යළි පොදු අවකාශ තුළ දෘශ්‍යමාන කිරීම ද එකී අදහස තවදුරටත් තීව්‍ර කරනු ලබයි. සිංහල බෞද්ධ ජාතිකත්වය පිළිබඳ අභිමානය සහ අධිකාරිත්වය හුවා දක්වමින් සෙසු සුළු ජනයා වෙත එල්ල කරන ලද දෘශ්‍යමය අවියක් ලෙස මෙම සිතුවම් පෙන්වාදිය හැකිය. ඊට අමතරව ප්‍රාදේශීය වශයෙන් සුළු ජාතික බලය ව්‍යාප්ත වී පැවති ප්‍රදේශවල සහ නගරවල සිංහල බෞද්ධ අධිකාරීත්ය හුවා දක්වමින් කිසියම් දෘශමය පීඩනයක් ඔවුන් තුළ ජනිත කිරීමේ මෙවලමක් ලෙස ද මෙය යොදාගත් බව පෙනේ.රාවණා රජු පිළිබඳ වන මිථ්‍යා කතාව, පුරා වෘත්තය, සිංහල ජන සමාජයේ එක් කණ්ඩායමක් විසින් මේ මොහොත වන විටත් දැඩිව පිළිගනු ලබයි. රාවණා රජු සිතුවම් අතරට ගෙන ඇත්තේ එබැවිනැයි පෙනී යයි. එය බලය හා හෙළයාගේ මූලය පිළිබඳ වන ප්‍රකාශනයකි. දකුණේ සිතුවම් අතර රාවණා රජු මහත් උතුම් විශිෂ්ටයකු ලෙස ගෙන ඉදිරිපත් කරයි. දකුණේ නගරාශ්‍රිතව අඳින ලද සිතුවම් අතර සිංහයාගේ රූපය, බෞද්ධ කොඩිය, ධර්ම චක්‍රය මෙන් ම ජාතික ධජය ද ඇඳ දක්වා තිබුණි. එමගින් බෞද්ධ පදනම යන අදහස් අවධාරණය කරන සුළුය. එහෙත් විවිධ නගරවල සිතුවම් අතර වෙනත් ආගමික සංකේත ද සහිතව සිතුවම් සංරචන වූ බව අප අමතක නොකළ යුතුය. ඇතැම් සිතුවම් මගින් ජාතීන්ගේ සහයෝගීතාවය මතු කිරීමට ගත් උත්සාහයක් ද වේ. මෙම සිතුවම් නිර්මාණකරණයේ දී එකී ප්‍රවාහය හා එකතු වීමට විවිධ ජන කණ්ඩායම් නියෝජනය කළ අය එක් වූ බව අමතක නොකළ යුතු අතර, ජාතික සහයෝගිතාව අපේක්ෂා කළ පිරිස් ද මේ අතර විය. එහෙයින් හුදු මහාජාතියේ අභිලාස මේ චිත්‍ර මගින් ඉදිරිපත් වූයේ යැයි යන අදහස සැබෑම සත්‍යයක් නොවන බව අපට පෙනේ.

මෙම සිතුවම් වල පවත්නා කලාත්මක අගය කුමක් ද? මේ බහුතර නිර්මාණ චිත්‍රාවලි තුළ පවතින්නේ ඒකාකාරී බවකි. තේමා සංකල්ප හා ඉදරිපත් කිරීමේ ක්‍රමවේදවල පවා ඇත්තේ සමීප රටාවකි. මේවා බොහෝ විට විවිධ අයගේ සහභාගිත්ව මත වැඩ අවසන් කළ නිමැවුම්ය. මහනුවර බෞද්ධ විහාර සම්ප්‍රදායට අනුව යමින් කළ සිතුවම්වල එකී ශෛලියේ ලක්ෂණ දෘශ්‍යමාන වුව ද, අනෙකුත් චිත්‍ර බොහොමයක විවිධ ශෛලි ලක්ෂණ විය. වර්ණ ගැන්වීමේ විවිධ ක්‍රමවේද වේ. සමස්ත රූප රචනා අතර නොගැළපීම් දෘශ්‍යමානය. මෙම නිර්මාණ අපට තත්විෂයීය ගැඹුරුසිද්ධාන්ත මත පිහිටා ඇගයිය

නොහැකි බව කිව යුතුය. මක්නිසාද මෙම ප්‍රවාහයේ චිත්‍ර ඇඳීම යනු එකී විෂය ගවේෂණය ප්‍රශ්න කරනු ලබන ක්‍රියාවලියක් නොවුන බැවිණි. එය වීදි චිත්‍ර රැල්ල ලෙස සලකනුයේ ද එබැවිණි. එහි පරමාර්ථ හා එම නිර්මාණ ප්‍රවේශයේ උත්තේජනය රැඳී ඇත්තේ විෂය ගවේෂණය මත පදනම්ව නොවේ. වීදි චිත්‍ර ප්‍රවාහයේ “චිත්‍රය” යනු එකී ක්‍රියාවලිය ක්ෂණිකව ප්‍රකාශනයේ යොදා ගැනීමෙ හි ලා වූ භාවිතයකි.

මේ සිතුවම් අතර විරෝධි ප්‍රතිචාර සහිත නිර්මාණ ද විය. නාරාහේන්පිට බිත්තිතියක වූ හාස්‍ය උත්පාදන සිතුවම එවැන්නකි. විල්ලපත්තු මහවන විනාශය හා සබැඳි බැව් කියැවුන මුස්ලිම් මන්ත්‍රීවරයකු මෙකී චිත්‍ර සංරචනයේ අන්තර්ගත විය. විනාශ වී ගිය කාන්තාරයක් බඳු වනයක් සමග මෙම මන්ත්‍රීවරයාගේ රුව එක්කොට තිබුණි. මෙය හාස්‍ය, විවේචනය හා විරෝධය මුසු කළ ප්‍රකාශනයකි. බැද්දගානේ ඇඳ තිබූ සිතුවමක් මගින් ඇමෙරිකානු අත පෙවීම සංකේතවත් විය. ඇමෙරිකන් කොඩියක් තුළින් මතුව එන මකරකු ලංකාව ගිලගන්නා අයුරු එහි නිරූපණය විය. ත්‍රිකුණාමලයේ බිත්ති අතරට ආ රාවණාල රාවණා යක්ෂ රජුගේ ගර්ජනාව ලෙස නම් කර තිබුණි. එය නව ජනපතිවරයාට දැක්වූ විරෝධය ව්‍යංගාර්ථව ඉදිරිපත් කිරීමක්ද? එසේ ම සැඟව සිටින යක්ෂයකු වැනි රුවක් ද යාපනයේ වීදි සිතුවම් අතර ඇඳ තිබූ බවට සාධක වේ. ඇතැම් චිත්‍ර සඳහා අන්තර්ජාල සෙවුම් ඇසුරින් බාගත කර ගත් චිත්‍ර අනුකාරක හා මෝස්තර යොදාගෙන තිබූ අයුරු ද නිරීක්ෂණය වෙයි. උඩරට නැට්ටුවා, පරාක්‍රමබාහු රජ ප්‍රතිමාව, පහත රට නැට්ටුවන්, සීගිරි චිත්‍ර, මොනරා, ධීවරයින්, සංඝමිත්තා තෙරණිය, ශ්‍රී මහා බෝධිය වැඩමවීම, රාවණා රජු , ක්‍රිස්තියානි පල්ලිය , වෙස් මුහුණු, මකර රූපය, කැලණි විහාරය, ඉර හඳ සිංහයා සංකේත, පුන්කලස, සටන්කරුවන්, ද්‍රවිඩ නර්තන ශිල්පිනියක සමග උඩරට වෙස් නැටුම් ශිල්පියා, දළදාව වැඩම කරන නැඳුන්ගමුවේ ඇතා, සතුන්ගෙන් පිරි වනය, ගංගොඩවිල සෝම හිමි, දුටු ගැමුණු රජතුමා, යුධ සෙබළා, මහගම සේකර රුව, දැල්පන්දු ප්‍රතිමාව, ක්‍රිකට් ක්‍රීඩකයා, දළදා මාලිගාව, ආදී විවිධ නිර්මාණ රැසක් ගම්පහ නගරයේ වීදි සිතුවම් අතර දැකිය හැකිය. ගම්පහ මහරෝහල අවට තාප්පය, පාසල් ඉදිරිපිට තාප්ප ද විවිධ චිත්‍රවලින් අලංකාර විය. මේ ආකාරයේ නේක පැතිකඩ පිළිබඳ අදහසක් ඇතිව ඒ ඒ නගරවල චිත්‍ර ඇඳ තිබුණි.

මේ සියල්ල එකටගෙන බැලීමේ දී අපට පෙනී යන්නේ පාසල් චිත්‍ර විෂය මාලාව තුළ අන්තර්ගත බොහෝ පැවරුම් ගොනුවක් සේ මේවා නගර තාප්ප පුරා යළි ප්‍රතිනිර්මාණය වූ බවය. චිත්‍ර ලෙස බොහෝ තරුණ තරුණියන් හදාළ දෙය මේ ආකාරයෙන් වීදි චිත්‍ර වලට අන්තර්ගත වීම තත් විෂය පිළිබඳ වන දාර්ශනික චින්තාව ද ප්‍රශ්න කරනු ලබයි.

**චිත්‍ර කලාවේ ප්‍රගමනය උදෙසා මෙම වීදි චිත්‍ර ප්‍රවාහයේ බලපෑම කෙසේ ද?**

මෙම ක්‍රියාවලිය චිත්‍රකරණය හදාළ හා ඊට කැමැත්ත දැක්වූ බොහෝ අයට විශේෂ අවස්ථාවක් විය. ඔවුනගේ දැනුම හෝ ප්‍රකාශන විධික්‍රම කවරක් වුව මෙම වීදි චිත්‍ර ප්‍රවාහය නමැති වේදිකාව තත් විෂයට යහපත් ලෙස ද බලපෑ බව අප කල්පනා කරමු. අංකුර නිර්මාණ ශිල්පීන්ට, අවස්ථා නොලද, හැකියාව සහිත නිර්මාණ අත්දැකීම් ඇති ශිල්පීන්ට මෙවන් පොදු අවකාශයක තම හැකියා ප්‍රදර්ශනය කිරීමට ලැබීම මහගු අවස්ථාවක් විය. අනෙකුත් ප්‍රාසාංගික කලාවන්ට සාපේක්ෂව ජනප්‍රිය තලයේ සහභාගිත්වයකට එක්වීමට මොවුනට ලද එකම ප්‍රධාන අවස්ථාවක් ලෙස ද මෙය සැලකිය යුතු වේ. පාසල් බිත්තිවල චිත්‍ර ඇඳීම, ගම් උදාව වැනි සංකල්ප අළලා කෙරුණ වැඩසටහන්වල දී චිත්‍ර ඇඳීමට ලත් අවස්ථා හැරුණ විට මෙය විශේෂිත අවස්ථාවකි. මෙහි දී කිසිදු බාධාවක් (පරීක්ෂණයක්,සුදුසුකමක් වයස් සීමාවක්) නොමැතිව ඔවුනට මීට ඉදිරිපත් වීමට ලැබීම ඔවුනගේ පාර්ශ්වයෙන් ලද අගනා අවස්ථාවකි. එය තත් විෂය ප්‍රබෝධය ඇතිකිරීමේ ලා සාධනීය බලපෑමක් ද කළ බව අපගේ විශ්වාසයයි.

ශ්‍රී ලංකාවේ කොළඹ කේන්ද්‍රීය අධිකාරීත්වය ලත් බහුතර කලා ශිල්පීන්ගෙන් පරිබාහිර වූ අවකාශයක නිදහසේ සිය හැකියා ප්‍රදර්ශනයට කිරීමට මෙමගින් බොහෝ දෙනෙකුට හැකි විය. ඒ අනුව තත් විෂය නියෝජනය කළ දුරබැහැර හුදෙකලා වූ සිත්තරුනට මෙය මහත් වූ ඉඩකඩක් විය.



2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නඟන ලද ගම්පහ නගරයේ වීදි සිතුවමක කොටසක්

මෙකී නිර්මාණ ප්‍රභවය, භාවිතය හා විකාසනය සම්බන්ධයෙන් අප පූර්ව සාකච්ඡාව මගින් විමසන ලදී. ඒ අනුව පෙනී යන්නේ නොයෙක් විමසුම් ඇසුරින් මෙම කලා කෘති විග්‍රහයට ඉඩකඩ විවර වන බවය. ඒ දෙස ධනාත්මක මෙන් ම සෘණාත්මකව ද බැලිය හැකිය. මෙය ක්‍ෂණික ක්‍රියාවලියක් තුළ සිදු වූ නිර්මාණ භාවිතයක් ලෙස පුළුල් මානයකින් දැකීම වැදගත් බව අපගේ අදහසයි. මෙකී දෘශ්‍ය කලා භාවිතය පිළිබඳව ක්‍ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් දක්වා ඇත්තේ අඩු අවධානයක් බව පෙනේ. එසේ ම ඒවා යම් අවස්ථාවන්වල හැල්ලුවට ලක්කරනු දැකිය හැකිය. මෙම නිර්මාණ ප්‍රවේශවල සාධනීය ලක්‍ෂණ ඔවුන් බැහැර කරනුයේ එමගින් සිය ඊනියා ව්‍යාපෘතිවලට වන බලපෑම නිසාවෙන් බව පැහැදිලිය. 1983 කළු ජූලියේ අමිහිරි මතක තවමත් වාර්ෂිකව සමරන, එහෙත් 88,89 දකුණේ භීෂණය පිළිබඳ අමිහිරියාව අමතක කොට ඇති මෙම ක්‍රියාකාරාන් ලෙස පෙනී සිටින කලා ශිල්පියෝ මෙවන් වීදි රැල්ලක් වැනි පැන නැගීම් ගැන මුනිවත රකිති. ඔවුනගේ ඊනියා ව්‍යාපෘති පමණක් ඉතා සවිඥානික බැව් පෙන්වීමට උත්සාහ ගනුයේ සිය අධිකාරිත්වය තහවුරු කරගනු වස්ය. 90 දශකයේ යුද්ධයට එරෙහි සිත්තරු ද, 2022 අප්‍රේල් අරගල භූමි සිත්තරුන් ද මේ ආකාරයේ අධිකාරිත්ව ගොඩනංවා ගැනීම වෙනුවෙන් පෙනී සිටියහ. එහෙත් ආපසු හැරී බැලීමේ දී පසක් වනුයේ මේ කිසිවකින් ඔවුනට හැර තත් සමාජයට හෝ කලා ධාරාවට යහපතක් නොවූ බවය.

මෙකී රැල්ල සැණකෙළි තත්ත්වයකැයි ද, චිත්‍රය වීදියට යන විට දිය වී යනවා යැයි ද කී ඇතැම් කොළඹ කේන්ද්‍රිය ශිල්පීන්ගේ සවිඥානික නිර්මාණ ප්‍රවේශ ලෙස ඔවුනොවුන් හඳුන්වාගත් දෘශ්‍ය කලා නිර්මාණ භාවිතයක් ද, අතාර්කික, අසාර්ථක හා අරමුණක් නැති ගෝඨා ගෝ අරගල භූමි අතරම මිහිදන් වූ බැව් අපට පෙන්වා දිය හැකිය. මේ සියලු දෘශ්‍ය කලා භාවියන් ම අවසානය අතිශය පෞද්ගලික ව්‍යාපෘති තුළ සැඟව ගිය අතාර්කික ව්‍යායාම් බව ඒ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් ඇසුරින් අපට පැහැදිලි වේ.

මෙම වීදි සිතුවම් සමාජයට හානිදායක ලෙස ද ක්‍රියාත්මක වූ බව පෙන්වා දිය හැකිය. ඒ අතර

I. දෘශ්‍ය අපවිත්‍රතාව (Visual Pollution)
II. ඇතැම් දෘශ්‍ය රූප මගින් ඇති කළ මානසික කම්පනය.
III. නාගරික අවකාශයට උචිත නොවන ලෙස විවිධ වර්ණ හැඩ සහිත චිත්‍රාවලි එක්වීම. (මෙහි දී අප රටේ එවන් සැලසුම් සහගත නගර වේදැයි ප්‍රශ්න කළ හැකි ය)
IV. ගැඹුරු විෂය හැදෑරීමක් නොමැති චිත්‍ර ශිල්පීන් හා කණ්ඩායම් බිහි වීම.
V. චිත්‍රය පිළිබඳ සාමාන්‍ය ජනයාගේ අධ්‍යයනය මෙකී විවිධ චිත්‍රාවලි මත පදනම්වීම හා එහි ගැඹුරු මානය ගිලිහී යාම.

VI. අද දවසේ මෙකී චිත්‍ර නශ්ටාවශේෂව සමාජ අවධානයෙන් ගිලිහී යන සේ දිස්වන අතර එමගින් චිත්‍ර යනු නොවටිනා විෂය පථයක් ලෙස අර්ථකතනය වීමට ඇති වැඩි ඉඩ කඩ විවර වීම.

VII. චිත්‍ර ශිල්පියෙකු වීම හා චිත්‍රය ඇඳීම යන වෘත්තිමය තත්ත්වය හා විෂය ප්‍රකාශනයේ ගුණාත්මක බව පිළිබඳව සරල නිගමන වලට පැමිණීම.

ඉහත කරුණු එකිනෙක විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ මෙම චිත්‍ර ඇඳීමේ රැල්ල තත් විෂය පිළිබඳ ගැඹුරු පසු කථනයටක වැඩි ඉඩක් නොතබා ඇති බවය. එහෙත් ශ්‍රී ලාංකේය සමකාලීන ජනයාගේ හැසිරීම් රටාව ඔවුනගේ ආශාවන් හා සමාජ දේශපාලනයේ හැසිරීම් අධ්‍යයනයෙ හි ලා මෙන් ම දෘශ්‍ය කලා විෂය ධාරාවේ තත්ත්ව අධ්‍යයනය සඳහා ද මෙම “ප්‍රවාහය” ඉතා වැදගත් සාධක සපයන බව අපට පෙන්වා දිය හැකිය.

**නිගමනය**

ශ්‍රී ලාංකේය සමාජ ක්‍රියාකාරි සිදුවීම් බොහොමයක් මෙන් මෙම වීදි චිත්‍ර ප්‍රවාහය ද බුබුළක් සේ හටගෙන කිසිදු අගයකින් තොරව ශේෂව දිය වී යන බව නිගමනය කළ හැකිය. එහෙත් එය සමාජ ක්‍රියාකාරිත්වයක් පිළිබඳ හැදෑරීමේ සාධක සපයන නිර්මාණ ගොනුවකින් සමන්විත වූවක් බව පෙන්වා දිය යුතුය. තත් විෂය (චිත්‍ර කලාව) සම්බන්ධයෙන් යළි සිතා බැලීමට අවැසි කරුණු ගණනාවක් ද මේ ඇසුරින් නිරීක්‍ෂණය වේ. චිත්‍රය සමාජ අවකාශය තුළ සක්‍රීය වීම ඉතා ජනප්‍රිය තලයක දී සිදු වීම යන කාරණාව මෙම විෂයෙහි වැදගත්කම නැවත අවධාරණය කිරීමෙ හි ලා විශේෂ වේ. එසේ ම එය ප්‍රබල මාධ්‍යයක් ලෙස ජන මනැස් විවර කිරීමට යොදා ගත හැකි බව සමකාලීන සමාජයේ තාරුණ්‍ය විසින් ද පෙන්වා දීම සාධනීය ලක්‍ෂණ පෙන්නුම් කරයි. මෙකී මාධ්‍යය භාවිතය ඉතා විධිමත් හා සැලසුම් සහගත ක්‍රමෝපාය තුළින් වීදි බිත්ති වෙත රැගෙන යාමේ හැකියාව පවතින අතර එමගින් තත් විෂයීය අගය පොදු ජන මානයට ලක් කළ හැකිය. ඓතිහාසික ක්‍රියාවලියක් සටහන් කරන මෙම වීදි චිත්‍ර ප්‍රවාහය, දෘශ්‍ය කලා විෂය ක්‍ෂේත්‍රය මෙන් ම ශ්‍රී ලාංකේය සමාජ දේශපාලන ක්‍ෂේත්‍ර වීමංසන සාධක ලෙස ගත හැකි අගනා දෘශ්‍ය පඨිත ගොනුවක් ලෙස වැදගත් වන බව අපගේ නිගමනයයි .

**සමුද්දේශ**

කුමාරි, ඒ.ඩී.එස්.එම්.(2020).ලාංකේය නගරාශ්‍රිත බිත්ති සිදුවම් වලින් පිළිබිඹු වන සමාජ, දේශපාලනික දෘෂ්ටිවාදයන් පිළිබඳ ගවේෂණයක්.කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය ප්‍රසංග කලා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධනය. (අමුද්‍රිතයි).

වික්‍රමගේ, බූපති නලින්. (2022). අප්‍රේල් නැගිටීම් පිළිබඳ අප්‍රේල් සටහන්. කළුබෝවිල: විදර්ශන ප්‍රකාශන.

Bandara W.M.P, Sudarshana. (2023).Lotus.Maharagama: Published by Lady. J.

Bandaranayaka ,S. (1986). The Rock and Wall Paintings of Sri Lanka Lake House Bookshop Colombo.

Doug Bailey, (2010) Prehistoric art, Art History (4th edition) M. and Cothren, M. (eds.). Published in Stokstad, Pearson/Prentice Hall. New York.

Samuel Noah Kramer.(1963). The Sumerians their history, culture, and character. The University of Chicago Press Ltd, London.

Tiffany Renee, Conklin. (2012). Street art Ideology and public space. Thesis of Master of Urban Studies in Portland State University.

https://www.Bykerwin.com. Is graffiti Art pop Art? Pop Art influence & Differences. Resiliencyinitative.org /Community / Azeez Abdulhalik.Sri Lanka new Wave Murals (04 May 2004)

www.tamilgurdian.com. (5 Dec. 2019 / 19 Dec. 2019) Street Propaganda in Sri Lanka.

Wickramasinghe, Kamanthi.(Daily Mirror 18 Dec.2019) New Street Art trend Drawing the line between purpose, Standard and Creativity.

Sundaytimes.lk/140/05/magazine Ara Rasool .The graffiti revolution (02 May 2024)

**පසු සටහන**

2024 මැයි මස මනෝරංජන හේරත් විසින් ඡායාරූපයට නගන ලද ගම්පහ නගරයේ වීදි සිතුවම්වලින් කොටසක්









KAALA


අපේ වැඩක්.


විහාර මාවත
Vihara Mawatha





**ආඛ්‍යාන narrations**
**Volume 10 | Issue 01 | January-June 2025 | Article 05**
**ISSN 2478-0642**

CC BY NC ND

Open Access, Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies, Sabaragamuwa University of Sri Lanka
Submit your academic papers to director@cikcs.sab.ac.lk
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

---

# මහනුවර යුගයේ සිතුවම් කර්මාන්තයේ නියැළුණු චිත්‍ර ශිල්පීන්ගේ පරම්පරා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එස්. එම්. ඒ. පී. රත්නසිරි,** ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, amila.17704@uhss.ruh.ac.lk

**Received:** 25 December 2024 / **Revised:** 12 February 2025 / **Accepted:** 25 February 2025

**සාරසංක්ෂේපය**

මිනිස් සිත තුළ හට ගනු ලබන වඩාත් විශිෂ්ටතම හා උත්තරීතරම හැඟීම් අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කරන සුවිශේෂ මානව ක්‍රියාවලිය කලාව ලෙස සරලව අර්ථගන්වාලිය හැකිය. ලංකාවේ කලා සම්ප්‍රදාය චිත්‍ර කලාව, නර්තන කලාව, සංගීත කලාව ආදී ලෙස වර්ග කර ගත හැකිය. ඒ අතරින් චිත්‍ර කලාව වූ කලී පුළුල් වපසරියක ව්‍යාප්ත වන්නා වූ අද්විතීය කලා මාධ්‍යකි. අප ඇස් ඉදිරිපිට ඇති ලෝකයට අමතරව තවත් ලෝකයක් සිතුවම්වලින් මතු කරයි. එහි දී චිත්‍ර කලාව තුළින් රසිකයාට, ප්‍රේක්ෂකයාට හා සමාජ ව්‍යුහය වෙත කලා කෘති මගින් මනා සංජානනයක් ලබා දීම උදෙසා සිත්තරා විසින් පූර්ව අත්දැකීම්, දැනුම හා ව්‍යවහාරික ඥානය භාවිත කරයි. විශේෂයෙන් ම ලංකාවේ චිත්‍ර කලාව පිළිබඳ පිරික්සීමේ දී එය විවිධ යුග අනුව වර්ධනය හා දියුණු වී පැතිරී ඇත. ඒ අතර මහනුවර යුගය සුවිශේෂ වේ. මෙකී මහනුවර යුගයේ සිතුවම් කර්මාන්තයේ සාධනයෙහිලා එකී කර්මාන්තයේ නියැළුණු චිත්‍ර ශිල්පීන්ගේ කෙබඳු පරම්පරා නියෝජනය කරන්නේ ද? යන අධ්‍යයන ගැටලුවට දත්ත ඒකරාශී කිරීමට මෙමගින් උත්සාහ ගෙන ඇත. මෙම මෙම දක්ෂ, කාර්යශූර චිත්‍ර ශිල්පීන් කුමන පරම්පරාවකින් පැවත එන්නේදැයි විමර්ශනය කිරීම, එම පරම්පරා මහනුවර යුගයට ම සුවිශේෂ වී බිහිවුණ පරම්පරා ද නැතිනම් වෙනත් යුගයන් ගේ සිට සංක්‍රමණය වන පරම්පරා ද යන්න අධ්‍යයනය කිරීම, මෙකී පරම්පරාවන් සිත්තර කර්මාන්තයේ නියැළීමට දේශියන්ගෙන් හා විදේශීයන්ගෙන් ලද ආභාසය හඳුනාගැනීම, මෙම පරම්පරාවලින් මහනුවර යුගයේ සිතුවම් කර්මාන්තයට සිදු වන සේවාව අධ්‍යයනය කිරීම, විමර්ශනය කිරීම හා ගවේෂණය කිරීම මෙම පර්යේෂණය අධ්‍යයන අරමුණු ලෙස

පෙන්වා දිය හැකිය. ඒ සඳහා පුස්තකාල ගවේෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදී. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදයේ දී ද්විතීයික දත්ත මගින් කියවන ලද සාහිත්‍යයමය මූලාශ්‍රය කරුණු ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදයේ දී දෙවිනුවර, මහනුවර, නිලගම, දඹුල්ල, මැදවල ආදී ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරා ගනිමින් සහභාගි නොවන නිරීක්ෂණ ක්‍රමය මගින් තෝරාගත් ක්ෂේත්‍රයේ 50 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වා තේමාත්මක (Thematic) හා කථනාත්මක (Narrative) විශ්ලේෂණ ක්‍රම ඔස්සේ අවසන් නිගමනවලට පැමිණ ඇත. මෙමගින් මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන්ගේ නිලගම, උල්ලදුපිටියේ, දෙවරගම්පොල, හිඟුල්වල, හුලංගමුව ආදී පරම්පරා කීපයක් පිළිබඳ හඳුනා ගත හැකි විය. තව ද නිශ්චිතවම හදුනා ගත නොහැකි පරම්පරා කීපයක් තිබෙන බව ද අනාවරණය කරගත හැකි විය. ඒ අනුව මෙම පරම්පරාවල ශිෂ්‍ය පරම්පරා ලංකාව පුරා ව්‍යාප්තව තිබූ බව හඳුනාගත හැකිවිය. ඒ අනුව මෙම පරම්පරා මහනුවර යුගයේ චිත්‍ර ශිල්පය නංවාලීමට කටයුතු කළ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** *චිත්‍ර ශිල්පය, පරම්පරාව, මහනුවර යුගය, විහාර කර්මාන්තය, සිත්තරවරුන්*

**හැඳින්වීම**

මිනිස් සිත තුළ හට ගනු ලබන වඩාත් විශිෂ්ටතම හා උත්තරීතරම හැඟීම් අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කරන සුවිශේෂී මානව ක්‍රියාවලිය කලාව ලෙස සරලව හඳුනාගත හැකිය. එහි හරය වනුයේ මිනිසාගේ නිර්මාණ කෞශල්‍ය ප්‍රකාශයට පත්කිරීමයි. විවිධ කලා කෘති කලාත්මක වශයෙන් අගය කිරීම දුෂ්කර වූවක් මෙන්ම විවිධ කලාකරුවන්ට ඔවුන්ගේ කලා කෘතිය නිපදවීමට විවිධ රීතීන් මෙන් ම ශිල්පීය මානසිකත්වය හැසිරවීමේ රීති පද්ධතියක් ද ඇත. චිත්‍ර කලාව වූ කලී සම්පූර්ණයෙන්ම වචනයෙන් සන්නිවේදනය කළ නොහැකිය. මානවයා විසින් මේ දක්වා ගොඩනගාගෙන ඇති සෑම දැනුම් සම්භාරයකට මෙය පොදු වේ. ඒ අනුව චිත්‍රය ද මිනිසා විසින් ගොඩනගා ගෙන ඇති අනේකවිධ දැනුම් සම්භාරයක් වන අතර තවත් එක් ආකාරයක දැනුම් ඛණ්ඩයක් ද වේ. චිත්‍ර කලාව වූ කලී පුළුල් වපසරියක ව්‍යාප්ත වන්නා වූ අද්විතීය කලා මාධ්‍යකි. අප ඇස් ඉදිරිපිට ඇති ලෝකයට අමතරව තවත් ලෝකයක් සිතුවම්වලින් මතු කරයි. එහි දී චිත්‍ර කලාව තුළින් රසිකයාට, ප්‍රේක්ෂකයාට හා සමාජ ව්‍යුහය වෙත කලා කෘති මගින් මනා සංජානනයක් ලබාදීම උදෙසා සිත්තරා විසින් පූර්ව අත්දැකීම්, දැනුම හා ව්‍යවහාරික ඥානය භාවිත කරයි.

ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පර්යේෂකයන් විසින් ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව යුගකරණයකට ලක් කොට ඇත (කාලිංගල 1953: 27). එනම්,

- ප්‍රාථමික ගුහා චිත්‍ර

- රජරට අවධියේ චිත්‍ර
- දඹදිව යුගයේ සිට ගම්පොළ යුගය දක්වා චිත්‍ර
- මහනුවර යුගයේ චිත්‍ර
- නූතන යුගයේ චිත්‍ර

මේ අනුව තම වාසස්ථාන වූ ගල්ගුහා මූලික කර ගනිමින් අදින් වසර 6000 කට පමණ ප්‍රථම විසූ මානවයන් සහ ඔවුන්ගේ පසුකාලීනයන් විසින් මෙම ප්‍රාථමික ගුහා චිත්‍ර නිර්මාණය කළ ඇතැයි සැලකෙන අතර ප්‍රාග් ඓතිහාසික යුගයේ නිර්මාණය වූ බවට මතභේද පවතී. නමුත් මෙම යුගයේ නිර්මිත චිත්‍රවල වස්තු විෂය කුමක් ද යන්න අවබෝධ කරගන්නට හැකි වුවත් මෙම චිත්‍ර නිර්මාණය කළේ කුමක් අරමුණු කරගෙන ද යන්න නිශ්චිත වශයෙන්ම පර්යේෂකයන්ට හඳුනාගත නොහැකිය. ඒ අනුව තමන් එදිනෙදා දකින, විඳින අත්දැකීම් පාදක කොටගෙන මෙසේ ප්‍රාථමික ගුහා චිත්‍ර නිර්මාණය කර ඇති බව එම චිත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වේ (විජේරත්න, 1951: 32). අනතුරුව රජරට අවධියේ චිත්‍ර පිළිබඳව විකාසනය ගත් විට එහි විශාල වශයෙන්ම චිත්‍ර කර්මාන්තයේ යම් ප්‍රවණතාවයක් දක්නට ලැබේ. විශේෂයෙන්ම රාජමාලිගා, ධර්ම මණ්ඩප, විහාර ආදී ඉදි කිරීමේ දී අලංකරණය උදෙසා චිත්‍ර භාවිත කර ඇත. සීගිරිය වැනි ස්ථානවල පිහිටි සිතුවම් අනුරාධපුර යුගයේ සිතුවම් කර්මාන්තයේ විශිෂ්ටතම හා සාධනීය ලක්ෂණ පෙන්නුම් කරන නිමැවුම් ලෙස හඳුනාගත හැකි අතර ම එම චිත්‍ර දෙස බැලීමේදී එකල චිත්‍ර කර්මාන්තයේ දියුණුව සහ එහි නිරත වූ ශිල්පීන්ගේ දක්ෂතාවය මැනවින් පැහැදිලි වේ. නිදසුන් ලෙස ඒ බව සීගිරි චිත්‍ර අධ්‍යයනය මඟින් පැහැදිලි වේ. තව ද මෙම යුගයේ සිතුවම් ඉන්දියානු අජන්තා සිතුවම් සම්ප්‍රදායට සමාන ලක්ෂණ පෙන්නුම් කරයි (ගෛගර්, 1912: 36). අනතුරුව දඹදෙණිය යුගයේ සිට ගම්පොළ යුගය දක්වා නිර්මාණය වූ සිතුවම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී විශේෂයෙන්ම ශෛලිගත සම්ප්‍රදායට අනුව චිත්‍ර නිර්මාණය වීමත් ඊට අමතරව බැතිමතුන්ට ශ්‍රද්ධාව දනවන මාධ්‍යයක් ලෙස චිත්‍ර භාවිත කළ ඇති ආකාරය පැහැදිලි වේ (වත්තල, 1962: 15-23).

ශ්‍රී ලංකාවේ රාජධානි විතැන්වීමේ දී අවසාන රාජ පුරක රජකම් කළ රාජධානිය ලෙස මහනුවර රාජධානිය හඳුනාගත හැකිය (අභයසිංහ, 1977: 16), විශේෂයෙන් මෙම රාජධානිය මුල් භාගයේ ඉතා දියුණු මෙන්ම ආර්ථික, දේශපාලනික, සමාජ, සංස්කෘතික, ආගමික ආදී සෑම අතින් සමෘද්ධිමත් වූ යුගයක් ලෙස ද ඇතැම් අවස්ථාවල ආරවුල් සහිත කාල පරිච්ඡේදයක් ලෙස ද හඳුනාගත හැකිය (විජේතුංග, 2012: 53-61). ඒ කෙසේ වෙතත් මහනුවර රාජධානියේ උන්නතිය උදෙසා එහි ස්ථාපිත වූ පරිපාලනමය ප්‍රතිපත්ති, රජවරු, ප්‍රභූ පන්තිය, පැවිදි, ගිහි, සාමාන්‍ය ජනයා යන සියල්ලම වගකිව යුතුය (අභයවර්ධනල 1978, 27). ඒ අනුව මහනුවර යුගයේ සිත්තම් කර්මාන්තය අන් යුගවලට වඩා ඉතා

දියුණු ලෙස ප්‍රතිෂ්ඨාපනය වූ යුගයකි. විශේෂයෙන්ම ඊට හේතුව වන්නේ රාජ්‍ය අනුග්‍රහය ලැබීම හා එම ක්ෂේත්‍රයේ නියැළුණු ශිල්පීන්ගේ ශිල්පීය දක්ෂතාවය බැව් කිව හැකිය. විශේෂයෙන් මොවුන් බිත්තිවල ඇඳීමට යෝග්‍ය පරිදි බදාම පිළියෙල කර ගැනීම, වර්ණ සැකසීමට ස්වභාවික වර්ණ භාවිත කිරීම වැනි දේ සිදු කළේ චිත්‍රවල කල්පැවැත්ම ආරක්ෂා කරගැනීමටය. එමෙන්ම තෙතමනයෙන් චිත්‍ර ආරක්ෂා කර ගැනීමට චිත්‍ර මත වලිත්ති ආලේප කිරීම යොදා ගත්තේය. එමෙන්ම පින්සල් සඳහා විවිධ මාධ්‍ය භාවිත කරන ලදී (මංජු ශ්‍රී, 1977: 156). තව ද මෙම යුගයේ සිටි අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන් ගේ දායකත්වය සහ පළමුවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව.1592 - 1604), සෙනරත් රජු (ක්‍රි.ව.1604 - 1635), දෙවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව.1686 - 1705), ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව.1705 - 1738), විජය රාජසිංහ රජු (ක්‍රි.ව.1739 - 1747), කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව.1746 - 1799) යන රජවරුන්ගේ අනුග්‍රහය සිත්තම් කලාවට නවමු ප්‍රාණයක් එකතු කළේය (සුරවීර, 1976, පිට:79 - 86). මෙම යුගයේ දී විශාල වශයෙන්ම ලෙන් විහාර හා ටැම්පිට විහාරවලට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. රිදිවිහාරය, දෙගල්දොරුව, දනගිරිගල, දඹුල්ල, අලුවිහාරය වැනි ලෙන් විහාරවල ද මැදවෙල විහාරය, දන්තුරේ විහාරය, සූරියගොඩ, දෙවනගල, හිඟුල, දැඹව යන ටැම්පිට විහාරවල ද මෙම යුගයේ චිත්‍ර විශාල ලෙස දක්නට ලැබීම මෙහි චිත්‍ර කර්මාන්තයේ සාධනීය බව ඔප්පු කරන්නකි (ආරච්චිගේල 1980, 47).

පරම්පරාවක් යන්න විමර්ශනය කිරිමේ දී,

> The average span of years between the birth of parents and the birth of their offspring" reckoned in accordance with various disciplines" as in human population studies" which typically cite a generational range as 20 - 35 years" and in the classification of generations X"Y and Z" which loosely frame periods of 15 -20 years' (dictionary of oxford).

Oxford ශබ්දකෝෂයට අනුව පරම්පරාවක් යන්න මැනැවින් පැහැදිලි වේ. ඒ අනුව පරම්පරාවක් යනු පෙර ඒකකය මගින් පසු ඒකකය ජනනය කරනු ලබන ඒකක දාමයක් ලෙස සරලව අර්ථකථනය කළ හැකිය.

මහනුවර යුගය වූ කලී කුලවාදය හා පරම්පරා ක්‍රමය ඉතා දැඩි ලෙස ව්‍යාප්ත වූ යුගයක් ලෙස ද හඳුනාගත හැකිය. මහනුවර යුගයේ සිතුවම් කලාවේ නියැළෙන චිත්‍ර ශිල්පීන්ගේ ද විවිධ පරම්පරා නියෝජනය කළ අය වූ අතර ඔවුන් අත්දැකීම්වලින් සපිරි, පරිපූර්ණ වූ දක්ෂ, කාර්යශූර පරපුරවලින්

පැවත එන චිත්‍ර ශිල්පීන් මෙකල නියෝජනය වීම ද මෙහි උන්නතියට බලපෑ බව සඳහන් කළ හැකිය (චාල්ස්, 1986: 58).

මේ අනුව පාරම්පරික ඥානයක් මෙන් ම අස්පර්ශනීය උරුමයක් ලෙස චිත්‍ර කලාව ඉතා වැදගත් වේ. පැරණි සමයෙහි ඉතා චිත්‍ර කලාව පාරම්පරිකව පැවතුණ ද, වර්තමානයේ එය නූතන තාක්ෂණ ලෝකය හමුවේ අභාවයට යමින් පවතී. ඒ අනුව එම දේශීය පාරම්පරික ඥානය රැක ගැනීම ද, අනාගත පරපුරට දායාද කිරීම ද, ඒ පරම්පරාවල වර්තමාන පුරුක් රැකගැනීම ද කළ යුතුය. ඒ සඳහා සමාජ දැනුවත් කිරීම මෙම අධ්‍යයනය මගින් සිදුවන අතරම චිත්‍ර කලාව, අස්පර්ශනීය උරුම, පාරම්පරික ඥානය සංරක්ෂණයට මෙම අධ්‍යයනය මහඟු පිටු බලයක් වේ.

**සාහිත්‍යය විමර්ශනය**

එස්.පී.චාල්ස් මහතා (1986) විසින් රචිත ලංකාවේ පාරම්පරික චිත්‍ර ශිල්පී පරපුර නම් ග්‍රන්ථයෙහි මාලගම්මන විහාරයෙහි ඇති පැරණි ලේඛනයක සඳහන් වන පරිදි ශ්‍රී සඟ බෝ බුවනෙකබාහු රජුගේ කාලයේ දී පොල්කොටුවේ වලව්වේ ශ්‍රී සුමංගල තෙරුන් වහන්සේ තුන්මුල්ලේ ගෙදර ඩිංගිරි අප්පු ගල්ලද්දා ලවා විහාර කර්මාන්තයෙහි චිත්‍ර, සිතියම් ඇඳි බව ද උනුන් හට කළ දීමනා ගැන ද සඳහන් වනු ඇත. දෙවරගම්පොළ පරපුරෙහි දෙවරගම්පොල සිල්වත් තැනගේ උපන් ගම ද දක්වා ඇත. මාතර හා දෙවුන්දර සිටි සිටි චිත්‍ර ශිල්පීන් දේවේන්ද්‍ර හා දේවසුරේන්ද්‍ර යන නම්වලින් හඳුන්වන බව ද දක්වා ඇත.

සෙනරත් පරණවිතාන මහතා (1943) විසින් රචිත Gadaladeniya Rock Inscription of Dharmkirti Sthavira යන ග්‍රන්ථයෙහි ගඩලාදෙණිය හා ලංකාතිලක යන ස්ථානවලින් හමු වූ සෙල්ලිපිවලට අනුව එම විහාර ගෘහ ගනේෂ්වරචාරී හා ස්ථපතිරාවර යන දෙදෙනා විසින් ඉදි කළ බව දක්වා ඇත.

එම්. සෝමතිලක මහතා (2002) විසින් රචිත මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ බිතුසිතුවම් කලාව යන ග්‍රන්ථයෙහි චිත්‍ර ශිල්පී පරම්පරා කීපයක් දක්වා ඇති අතර ම නිලගම පරම්පරාවේ සම්භවය පිළිබඳව ද යම් තොරතුරු ප්‍රමාණයක් දක්වා ඇත. තව ද නිලගම පරපුරේ ශිල්පීන්ගේ අනුපිළිවෙල දක්වා ඇත.

එච්.ඒ.පී.අභයවර්ධන මහතා (1978) විසින් රචිත කඩයිම් පොත් විමර්ශනය නම් ග්‍රන්ථයෙහි නිලගම පරපුරේ සම්භවය පිළිබඳ යම් සටහනක් දක්වා ඇත

ඩී.එම්.ආර්.දිසානායක මහතා (n.d.) විසින් රචනා කරන ලද ඓතිහාසික මාතලේ යන කෘතියෙහි නිලගම පරම්පරාව පිළිබඳව ද ඔවුන් දඹුලු විහාරයේ පිළිසකර කටයුතුවල මූලිකත්වය ගෙන කටයුතු

කර ඇති බව දක්වා ඇත. එමෙන්ම ඔවුන් නැවත නිශ්ශංකමල්ල රජු විසින් මොවුන් නිලගම නැවත පදිංචි කර වූ බව ද ගම්බිම් ආදිය පවරා දුන් බව ද දක්වා ඇත. තව ද නිලගම පරපුරේ සිත්තර කෙනෙකු යාපහු විහාරයේ චිත්‍ර ඇඳ ඇති බව ද දක්වා ඇත. දෙවරගම්පොල සිල්වත් තැනගේ ශිෂ්‍ය හිමිවරුන් දෙදෙනෙකු කන්ද උඩරට හා මුහුදුබඩ ප්‍රදේශවල චිත්‍ර ඇඳි බව දක්වා ඇත. තව ද කෝට්ටේ, හඟුරන්කෙත, කැලණිය, දෙවුන්දර ආදි විහාරස්ථානවල සිතුවම් ඇඳි හීමප්පු සහ අන්දිරිස් යන චිත්‍ර ශිල්පීන් ගැන තොරතුරු දක්වා ඇත. හේරත්ගම ශ්‍රී රතනපාල හිමි පෙතිකඩ ඇඳීමෙහි දක්ෂ වූ බවත් දැඹව විහාරයේ චිත්‍ර සියල්ලම පිටපත් කළ බව ද දක්වා ඇත.

පී.ඊ.පී.ප්‍රනාන්දු මහතා (1957) විසින් රචනා කරන ලද කලා පුබුදුව නම් ග්‍රන්ථයෙහි මෙම නිලගම පරම්පරාව නායක්කාර් රජුන් සමඟ ඉන්දියාවේ සිට පැමිණි කලාකරුවන්ගෙන් පැවත එන එකක් බව දක්වා ඇත.

Marie Gatellier (1991) විසින් රචනා කරන ලද එච්.ඒ.පී.අභයවර්ධන සංස්කරණය කළ Peintures Murales du Sri Lanka Ecole Kandyenne XVIII - XIX Siecles නම් ග්‍රන්ථයේ ද නිලගම පරම්පරාව නායක්කාර් රජුන් සමඟ ඉන්දියාවේ සිට පැමිණි කලාකරුවන්ගෙන් පැවත එන එකක් බව දක්වා ඇත.

ආනන්ද කුමාරස්වාමි මහතා (n.d.) විසින් රචනා කරන ලද මධ්‍යකාලීන සිංහල කලා නම් කෘතියෙහි නිලගම පටබැන්දා නැමැත්තෙකු දෙගල්දොරුව විහාරයේ චිත්‍ර ඇඳ ඇති බව දක්වා ඇත.

H.W.Codrington (n.d.) විසින් රචනා කරන ලදThe Kandyan Navandanno නම් ග්‍රන්ථයෙහි මහනුවර ගංගාරාම විහාරයේ චිත්‍ර ඇඳ ඇත්තේ ද මෙම නිලගම පරපුරේ අභරණ අප්පු ලෙස සඳහන් කොට ඇත. උල්ලදුපිටියේ සිටි පරම්පරා දෙක පිළිබඳවත් එතැනින් වෙදගෙදර මූලාචාරියා කොඩිතුවක්කු වසමේ සේවය කළ තැනැත්තෙක් බව දක්වා ඇත.

A.C.Lawrie (n.d) විසින් රචිත A Gazetteer of the Central Province of Ceylon නම් ග්‍රන්ථයෙහි නිලගම පරපුරෙහි පටබැඳි හිත්තරගේ නැමැත්තෙකු ගැන දක්වා ඇත. ක්‍රි.ව. 1714 දී හුලංගමුව පරපුරට අයත් හිත්තරගේ රම්බොඩ උන්නැහේ නැමැත්තෙකු ලබාගත් තඹ සන්නසක් පිළිබඳ තොරතුරු ද දක්වා ඇත. හේවාහැට පල්ලේ හා තුන්පනේ පල්ලේ ගොඩපොල පරම්පරාවට අයිති හිත්තර නයිදේවරු ගැන තොරතුරු දක්වා ඇත. තව ද මහනුවර යුගයේ නිශ්චිතවම පරම්පරාවක් සොයා ගත නොහැකි සිත්තරවරුන් කිහිපදෙනෙක් ගැන සඳහන් කොට ඇත.

ජයදේව තිලකසිරි මහතා (1994) විසින් රචනා කරන ලද ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පී ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක් යන ග්‍රන්ථයෙහි පැරණි කළ විහාර චිත්‍රණයේ යෙදී සිටි පෙළපත් නාමය සහිත කාර්මික පවුල් පිළිබඳ තොරතුරු දක්වා ඇත.

Siri Gunusinghe හා L.T.P. Manju sri (1960) විසින් රචනා කරන ලද Survey of Temple Painings - Second Report නම් ග්‍රන්ථයෙහි මහනුවර දෙහිපාගොඩ විහාරයේ ද චිත්‍ර ඇඳ ඇත්තේ ඩී.එස්. මුහන්දිරම් නම් ශිල්පියා බව දක්වා ඇත.

එල්.ටී.පී. මංජු ශ්‍රී මහතා (1977) විසින් රචනා කරන ලද ශ්‍රී ලංකා බිතුසිතුවම් සටහන් නම් ග්‍රන්ථයෙහි කඩොල්ගල්ලේ පරම්පරාව ගැන තොරතුරු දක්වා ඇත. තව ද මෙහි ලීලානන්ද ප්‍රේමතිලක මහතා, නන්දන චූටිවොංග්ස් මහතා හා රෝලන්ඩ් සිල්වා මහතාගේ ලිපියක මෙම කඩොල්ගල්ලේ පරපුර ගැන දක්වා ඇත.

එන්. ලංකානන්ද මහතා විසින් (1958) සංස්කරණය කරන ලද මන්දාරම්පුර පුවත නම් ග්‍රන්ථයෙහි මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන්ගේ පරම්පරා පිළිබඳ යම් සඳහනක් ඇත.

ටී. අභයසිංහ සහ තවත් විද්වතුන් විසින් (1977) රචනා කරන ලද උඩරට රාජධානිය නම් ග්‍රන්ථයෙහි මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් ධූරාවලියකට සැදුම්ලත් ආකාරය පිළිබඳ සඳහන් වේ.

එම්.බී. ආරියපාල මහතා විසින් රචනා කරන ලද (1962) මධ්‍යකාලීන ලංකා සමාජය නම් ග්‍රන්ථයෙහි මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් විවිධ ප්‍රදේශ අරමුණු කොටගෙන ජීවත් වූ ආකාරය සඳහන් වේ.

පී උලුවිස්සහේවා මහතා (1994) විසින් රචනා කරන ලද උඩරට සිතුවම් මඟ නම් කෘතියෙහි මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් විවිධ පරම්පරා අනුව විසිරී පැවති බව සඳහන් වේ.

පී.ඒ. කාලිංග මහතා විසින් (1953) ඩලංකා කලා ඉතිහාසය නම් ග්‍රන්ථයෙහි උල්ලදුපිටියේ පරම්පරාව, දෙවරගම්පොළ පරම්පරාව, කඩොල්ගල්ලේ පරම්පරාව වැනි පරම්පරාවල තොරතුරු සඳහන් වේ.

**අධ්‍යයන අරමුණු**

ලක්දිව පුරා විසිරී ඇති වෙහෙර විහාර විශාල සංඛ්‍යාවක් ඇසුරෙහි දක්නට ලැබෙන 18 වන හා 19 වන සියවස් දෙක තුළ දී නිම කරන ලද සැලකෙන සිතුවම් සම්ප්‍රදාය උඩරට සිතුවම්, නුවර චිත්‍ර, මහනුවර චිත්‍ර හෝ සිංහලේ චිත්‍ර යන නම්වලින් බොහෝ විචාරකයන් විසින් හඳුන්වා දී තිබේ. කන්ද උඩරට රාජධානි සමයට අයත් වෙහෙර විහාර දෙසීයකට පමණ ආසන්න සංඛ්‍යාවක් ඇසුරු කොටගෙන

පැතිරි ඇති නිසාත් මේවා නිම කිරීමේ දී කන්ද උඩරට රජුන් ගෙන් ලැබුණු සුවිශේෂී අනුග්‍රහය නිසාත් ඒවා බහුල ලෙසම දක්නට ඇත්තේ මහනුවර ප්‍රදේශය තුළ හෝ අදාළ ලෙස උඩරට යැයි පොදුවේ පිළිගන්නා වූ ද හඳුනා ගත්තා වූ ද ප්‍රදේශය තුළ වීම නිසාත් මෙම අරමුණ භාවිත කරන ලදී. කෙසේ වෙතත් උඩරට චිත්‍ර විශාල ස්ථානයක් හා පිළිගැනීමක් පැරණි චිත්‍ර තුළ හිමි වේ. මෙකී පිළිගැනීම නිර්මාණය වීමට විවිධ වූ කරුණු කාරණා බලපා ඇත. විශේෂයෙන්ම ඊට හේතුව මෙකල සිතුවම් නිර්මාණය සඳහා දායක වූ සිත්තම්කරුවන්ගේ ශිල්පීය දක්ෂතාවය බව අනුමාන කළ හැකිය. ඒ අනුව මෙම දක්ෂ, කාර්යශූර චිත්‍ර ශිල්පීන් කුමන පරම්පරාවකින් පැවත එන්නේදැයි විමර්ශනය කිරීමල එම පරම්පරා මහනුවර යුගයට ම සුවිශේෂී වී බිහිවුණ පරම්පරා ද නැතිනම් වෙනත් යුගයන් ගේ සිට සංක්‍රමණය වන පරම්පරා ද යන්න අධ්‍යයනය කිරීම, මෙකී පරම්පරාවන් සිත්තර කර්මාන්තයේ නියැලීමට දේශියන්ගෙන් හා විදේශීයන්ගෙන් ලද ආභාසය හඳුනාගැනීම, මෙම පරම්පරාවලින් මහනුවර යුගයේ සිතුවම් කර්මාන්තයට සිදුවන සේවාව අධ්‍යයනය කිරීමල විමර්ශනය කිරීම හා ගවේෂණය කිරීම මෙම පර්යේෂණය අධ්‍යයන අරමුණු ලෙස පෙන්වා දිය හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකාවේ රාජධානි නිරිතදිග විතැන්වීම දී අවසාන රාජධානිය ලෙස මහනුවර රාජධානිය සිත්තම් කලාවේ උන්නතිය සඳහා නියැළුණු සිතුවම්කරුවන්ගේ පරම්පරාවන් පිළිබඳ අවධානයට යොමු වේ. සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය මගින් ඓතිහාසික කරුණු නැවත කියවීම මත පදනම්ව මෙම පර්යේෂණය සිදු කර ඇත. මෙහි දී පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යන පර්යේෂණ ක්‍රමවේද භාවිත කරන ලදී. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදයේ දී ද්විතීක දත්ත ලෙස අන්තර්ජාලය, සඟරා, පර්යේෂණ ලිපි, පර්යේෂණ කෘති හා පොත්පත් මගින් කියවන ලද සාහිත්‍යය මූලාශ්‍ර කරුණු ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදයේ දී දෙවිනුවර, මහනුවර, නිලගම, දඹුල්ල, මැදවල ආදී ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරා ගනිමින් සහභාගි නොවන නිරීක්ෂණ ක්‍රමය මගින් තෝරාගත් ක්ෂේත්‍රයේ 50 දෙනකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ඇත. එලෙස නියැදිය තෝරා ගැනමේ දී අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිතා කරන ලදී, එහි දී,

වගුව 01: අධ්‍යයන නියැදිය

| පුද්ගලයින් | සංඛ්‍යාව |
|---|---|
| භික්ෂූන් වහන්සේලා | 15 |
| චිත්‍ර ශිල්පීන් | 25 |
| මෙම පරම්පරා නියෝජනය කරන වර්තමාන පරපුරෙහි පුද්ගලයින් | 10 |

මූලාශ්‍රය: පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලදි, 2023

ලබාගත් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ගුණාත්මකව විවරණය කරමින් තේමාත්මක (Thematic) හා කථනාත්මක (Narrative) යන විශ්ලේෂණ ක්‍රම ඔස්සේ අවසන් නිගමනවලට පැමිණ ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මහනුවර යුගයේ කලා ශිල්පීන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන වශයෙන්ම සිත්තම් කර්මාන්තයට දැඩි නැඹුරුතාවක් දිය හැකිය. මෙලෙස සිත්තම් කර්මාන්තයේ බොහෝ විට ප්‍රචලිත වන්නට ප්‍රධාන හේතුවක් ලෙස සිත්තම්කරුවන්ගේ දක්ෂතාවය පිළිබඳ හඳුනාගත හැකිය. මේ අනුව මෙම චිත්‍ර ශිල්පයේ නියැළුණු සිත්තම්කරුවන්ගේ පරම්පරා ව්‍යුහය අධ්‍යයනය කිරීම බොහෝ දුර්වලය. ඊට ප්‍රධාන හේතුව වන්නේ චිත්‍ර ඇඳීමේ දී ඒවා නිර්මාණය කළ චිත්‍ර ශිල්පියාගේ නාමය නිර්මාණයේ අන්තර්ගත නොවීමයි. මෙය සෑම පුරාවිද්‍යා සාධකයකට ම පොදු වූ කරුණකි. ඒ වෙනුවට ඊට අනුග්‍රාහකත්වය දැක්වූ සමාජයේ ඉහළ ස්තර නියෝජනය පමණක් දක්වා ඇත. නිදසුනක් ලෙස ගත් කල මහාවංශ කතුවරයා විසින් අසහාය රුවන්වැලිමහාසෑය නම් ස්තූපය පිළිබඳව ඉතා රසවත්ව විස්තර කරන අතර ම එහි නිර්මාණය කළ නිමැවුම්කරුවාගේ තොරතුරු අන්තර්ගත කොට නැත. ඒ සඳහා උත්සාහ ගත් බවක් ද නොපෙනේ. නමුත් ඊට අනුග්‍රහකත්වය දැක්වූ දුට්ටගාමිණීඅභය මහ රජුන්ගේ තොරතුරු දක්වා ඇත (මහාවංසය: 187-227). නමුත් ගඩලාදෙණිය හා ලංකාතිලක වැනි ස්ථානවලින් හමු වී ඇති සෙල්ලිපි සාක්ෂි කීපයක් පමණක් පිළිවෙලින් ගනේෂ්වරචාරී හා ස්ථපතිරාවර යන දෙදෙනා විසින් එම විහාර ගෘහයන් නිම කළ බව සිතිය හැකිය (පරණවිතාන, 1943: 90-110). මහනුවර යුගයේ චිත්‍ර ශිල්පී පරම්පරාවන් අධ්‍යයනය බොහෝ විචාරකයින්ට අපහසු වී ඇත්තේ මේ නිසාය. ඒ අනුව මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන්ගේ පරම්පරා ලෙස,

1. නිලගම පරම්පරාව
2. දෙවරගම්පල පරම්පරාව

3. හිඟුල්වල පරම්පරාව

4. හුලංගමුවේ පරම්පරාව

5. ගොඩපොල පරම්පරාව

6. කඩොල්ගල්ලේ පරම්පරාව

7. ඇම්බැක්කේ පරම්පරාව

8. උල්ලදුපිටියේ පරම්පරාව

ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය (සෝමතිලක, 2002: 432 - 450).

**නිලගම පරම්පරාව**

නිලගම පරම්පරාව පිළිබඳ තොරතුරු ගවේෂණයේ දී මෙම චිත්‍ර ශිල්පී පරපුරකට අයත් යැයි විශ්වාස කෙරෙන පිරිසක් මාතලේ දිසාවෙහි දඹුල්ල අසල පිහිටි එකම පදිංචි වී සිටීම විශේෂ කරුණකි. මෙම පරපුරෙහි අතීතය දෙවන පෑතිස් රාජ්‍ය සමය (ක්‍රි.ව.307 - 267) දක්වා දිව යන බවත් එම කාලයේ ජනප්‍රවාද සමග පවා සම්බන්ධ වී ඇති බවත් විශ්වාස කළ හැකිය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වන අවස්ථාවේ දී මෙරටට පැමිණි අටසැට කුලයක ශිල්ප ශේණි හෙවත් සොළොස් කුල ජනයන්ගෙන් පැවතෙන පරම්පරාවන් ලෙස මෙම නිලගම පරපුර හඳුන්වා දී තිබේ. කාලයාගේ ඇවෑමෙන් මෙම පරපුරෙහි කීර්තිරාවය අවට ප්‍රදේශවල ද පැතිරී ගිය බවත් එම නිසා වළගම්බා රාජ කාලය තුළ (ක්‍රි.ව.103 - 377) දඹුලු විහාරයේ චිත්‍ර හා පොළොන්නරු යුගයේ නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයේ දී (ක්‍රි.ව.1187 - 1198) එහි පිළිසකර කටයුතු සඳහා ද කැඳවන ලද්දේ මෙම පිරිස ම බවද කියැවේ. තව ද මහනුවර යුගයේ දෙවන රාජසිංහ රජ දවස (ක්‍රි.ව.1035 - 1604) ඔවුන් නිල ප්‍රදේශය අතහැර දමා කුරුණෑගල හිරියාල අතපත්තුවේ පිහිටි බලවත්වලට පැමිණි බවට ද විශ්වාසයක් පවතින අතර ගලේවෙල නිලගමට පැමිණ ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුදැනුම ඇතිව වන අතර ම ඔවුන්ව දඹුලු විහාර වැඩ කටයුතු සඳහා ගම්බිම් ආදීය පවරා දී නැවත නිලගම ප්‍රදේශයෙහි නවත්වන ලද්දේ ද කීර්ති රජුන් විසින් බව කියැවේ. මේ පිළිබඳ තොරතුරු දක්වා ඇත්තේ නිලගම පරපුරෙහි බලවත්වල බෝධිනාරයන බුවනෙකබාහු නම් චිත්‍රාචාරියෙකුට කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ප්‍රදානය කරන ලද තුඩපතක ඔවුන්ගේ අතීත තොරතුරු මදක් ගැබ් කොට තැබීමෙනි. එමෙන්ම දඹුලු විහාරයේ හා මහනුවර අස්ගිරි විහාරයේ චිත්‍ර ඇඳීම සිදු කර ඇති අතර ම බොහෝ කාලයක් සිට පුරාණ දඹුලු විහාරය සිතුවම් නිර්මාණය මොවුන් සිදුකළ බවට විශ්වාසයක් පවතී (සෝමතිලක, 2002: 432 - 450).

එනම් දුමින්දාගමනය සමඟ මෙරට පැමිණියාහු ඉන්දීය ශිල්පී පරපුරක් ලෙස කියවෙන විස්තරයට සමාන විස්තරයක් මාතලේ කඩයිම් පොතේ ද යම් තොරතුරු ප්‍රමාණයක් ගැබ් වී ඇත. මාතලේ කඩයිම් පොතට අනුව "දඹදිව මැද්ද දේසෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වන පිණිස ගිය අරිට්ඨ නම් රාජ කුමාරයා විසින් ධර්මාශෝක මහරජ්ජුරුවන් ද ශල කරමින් ඒ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වඩමවා දුන් කල්හි වඩිනා කැටුව ආ මුදලිහුරු නම් සෝමදත්ත බ්‍රාහ්මණ රාල ද ශ්‍රී විෂ්ණු බ්‍රාහ්මණ රාල ද ශ්‍රී රාම බ්‍රාහ්මණ රාල ද සොලංග්‍රි බ්‍රාහ්මණ රාල ද කොටුදෙයිය බ්‍රාහ්මණ රාල ද ශ්‍රී දන්ත දේසෙන් ගොඩ බැසපු ශ්‍රී දන්ත බ්‍රාහ්මණ රාල ද අකුරණ දේසෙන් ගොඩ බැහැපු අකුරම්බොඩ බ්‍රාහ්මණ රාල ද කොසොන්පුර දේසෙන් ගොඩ බැස්ස කොස්වත්තේ රාල ද මාදී නම් වීර මේස්වරයා ද වනබාහු මේස් වරයා ද වඩිනා හළුවා ද ජයකොන් පණ්ඩිතයා ද බෝධිපට්ටලමේ මූලාචාරියා ද රුවන්වල්ලියා ද මිනිවන් විල්ලියා ද රන්කොත් යමනා ද දේසන්ත්‍රිකාරයාය මෙකියාපු අය බෝධි පස්සේ ආවෝය. එයින් සෝමනාද නාගපට්ටලම හිර කර සිටියාය. ශ්‍රී විෂ්ණු බ්‍රාහ්මණ රාල අලුවිහාරයේ පොරාත්තුව සිටියාය. ශ්‍රී දන්ත බ්‍රාහ්මණ රාල රත්වත්තේ පොරොත්තු සිටියාය. කොටුදෙණියේ බ්‍රාහ්මණ රාල කොටුවේ ගෙදර පොරාත්තුව සිටියාය. ශ්‍රී දන්ත බ්‍රාහ්මණ රාල ගෙනා ධාතුන් වහන්සේ නැගෙනහිර දාගැබ කරවා එම අකුරන්බොඩ පොරාත්තුව සිටියාය. කොස්වත්තේ රාල ගෙනා ධාතුන් වහන්සේ නැගෙනහිර දාගැබ කරවා කොසවත්තේ පොරාත්තුව සිටියේය. වැත්තෑවේ බ්‍රාහ්මණ රාල වැබොඩපොල පොරාත්තුව සිටියාය. වඩන හලුවා ලේනාවල පොරාත්තුව සිටියාය. ජයකොන් පණ්ඩිතයා වහකෝට්ටේ හිරකර සිටියාය. බෝධි පට්ටලමේ මූලාචාරියා නීලගම සිරකර සිටියාය. රුවන්විල්ලියා දිවිල්ලේ හිරකර සිටියාය. මිනිවන් වල්ලියා ලොළුවෙල හිරකර සිටියාය. රන්කොත් යමානා පල්ලේපොල හිරකර සිටියාය. දේසාක්ත්‍රිකාරයා දිප්පිටියේ සිට සිටියාය කියා ශල කලා ය" (අභයවර්ධන, 1978: 224 - 226).

මාතලේ කඩයිම් පොතට අනුව එහි දැක්වෙන ස්ථාන නාමවලින් නාගපට්ටලම හැර සෙසු සියල්ල අදටත් එම නාමවලින් ම මාතලේ දිසාවේ පිහිටා තිබෙන බව දැක ගත හැකිය. ඒ අනුව ඉහත දැක්වෙන පුද්ගලයින් අතරෙහි නිලගම සිරකර සිටියා යැයි සඳහන් වන බෝධිපට්ටලමේ මූලාචාරියා පිළිබඳ එන්නා වූ සඳහන නිලගම සිත්තර පරපුරය අයත් සිටින කෙනෙකු බව විස්තරය විය හැකිය. එමෙන්ම මෙහි සඳහන් වන්නා වූ මූලාචාරියා යන විශේෂණ පදයෙන් කාර්මික කුලයට අයත් ව සිටියා වූ තැනැත්තෙකු ගැන කෙරෙන්නා වූ විස්තරයක් ද දැකගත හැකිය. තව ද එහි සඳහන් කළ පට්ටල් හතර හා එහි කාර්මිකයන් ගැන කියූ විස්තරය ද එය සපථ කරයි.

බොහෝ විට මාතලේ කඩයිම් පොත රචනා කරන අවධිය වන විට පැවතියා වූ නම්, ගම් සියල්ල මේ තාක් සිංහල ජනප්‍රවාදයේ පැවැති ශ්‍රී මහාබෝධිය වැඩම කිරීමේ සිද්ධිය හා සම්බන්ධ කොටගෙන

එබඳු ගම්වල වාසය කරන්නන් ද මෙවැනි ප්‍රෞඪ අතීතයක් ඇති වැදගත් පිරිසක් ලෙසට හුවා දැක්වීම මෙහි යටි අරමුණ වූවා විය හැකිය. කෙසේ වෙතත් මේ හොඳින්ම තහවුරු වන්නේ දඹුලු විහාරය අඳින ලද චිත්‍ර නිලගම පරපුරේ ශිල්පීන් විසින් ද ශ්‍රී මහා බෝධිය මෙරටට ගෙන ඒමේ සිද්ධිය ඔවුන්ගේ අතීතය හා සම්බන්ධ විස්තරයක් ද සලකා ගෙන ඇතැම් අවස්ථාවන් දඹුලු විහාරයේ තිබෙන ආකාරය බලා අවබෝධ කොට ගත හැකිය. දේවානම්පියතිස්ස රජු මුව දඩයමේ යාම, මිහිඳු තෙරුන් හමුව, ඇතුන් දෙදෙනකු යොදන ලද නගුලකින් මහමෙව්නාවේ සීමා සලකුණු කිරීම, ශ්‍රී මහා බෝධිය වැඩමවීම, එය රෝපණය කිරීම හා රජු බෝධි වන්දනාව කිරීම යනාදිය අවස්ථාවක් නිරූපණය කොට දැක්වුණ දඹුලු විහාරයේ චිත්‍ර ලෙස මේ අතුරින් හොඳින්ම කැපී පෙනෙයි. කඩයිම් පොතේ සිව් වන පරිච්ඡේදයේ විස්තර කර ඇත්තේ මෙවැනි විශේෂ ගණයේ චිත්‍ර මහනුවර සම්ප්‍රදාය සිතුවම් ඇති වෙනත් තැනක් දැකීම ඉතාමත් අසීරු බවත් මුහුදු බඩ ප්‍රදේශය පිහිටි දොඩන්දූව ශෛලබිම්බාරාමය දී පමණක් මේ හා සම්බන්ධ ඇතැම් සිද්ධියෙන් චිත්‍රණය කොට තිබෙන බවත්ය. එහෙත් මේ තරම් සවිස්තරාත්මක ලෙස එහි අන්තර්ගත නොවේ. කෙසේ වෙතත් ශ්‍රී මහා බෝධිය වැඩම වීමේ සිද්ධිය හා සම්බන්ධ කොටගෙන නාවුක යාත්‍රා කිහිපයක් ම යොදා ඇති බැවින් ඇතැම් විට මුහුදු බඩ ප්‍රදේශයේහි ද ඔවුනට නිතර ඇස ගැටුණු යාත්‍රා පිළිබඳ මතකය නිසා මේ සිද්ධිය විහාර චිත්‍රාවලිය තුළට යොදාගන්නට ඇතැයි කෙනෙකුට අනුමාන කළ හැකිය.


නිලගම සිත්තර පරපුර අධ්‍යනය කිරීමේ දී එහි දැනට වෘද්ධිත ම ශිල්පියා වූ ශ්‍රී බෝධි නාරායන බුවනෙකබාහු චිත්‍රාචාරීන්ගේ ජීවන් නයිදේ මහතා විස්තර කරන පරිදි සිය මුත්තා වූ අප්පු නයිදේ මහතාත් සීයා වූ කපුරු නයිදේ මහතාත් පියා වූ අභරණ අප්පු මහතාත් පැරණි සම්ප්‍රදායික චිත්‍ර ශිල්පය මෙතෙක් පාරම්පරිකව රැකගෙන ආපු පිරිසට අයත් වනු ඇත. තවමත් පැරණි සම්ප්‍රදාය අනුගමනය කරමින් විහාර චිත්‍ර කර්තව්‍යයේ යෙදෙන ජීවන් නයිදේ මහතාට ඔහුගේ මවගේ සොහොයුරෙකු වන මෙක් අප්පු මහතාගේ සහය ද හොඳින් ලැබේ. එමෙන්ම දඹුලු විහාරය මහා භාරකාර තැනගේ පාලනයට ගැනීමට පෙර අවධියෙහි එහි සිතුවම් පිළිසකර කිරීමේ කාර්යය ද ඔවුන් මූලිකත්වය ගෙන කටයුතු කර ඇත (දිසානායක, බගාග: 190)

> (සම්මුඛ සාකච්ඡා 01)
>
> “අපේ පරම්පරාව දේවානම්පියතිස්ස රජ කාලය ලක්දිවට පැමිණි ශිල්ප ශ්‍රේණිවලින් පැමිණි එකක් බවට නෑකම් කියනවා”
>
> (මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2023)

ඉහත දැක්වූ ජීවන් නයිදේ මහතාගේ ප්‍රකාශය අනුව ඔහුගේ පරම්පරාව දෙවන පැතිස් රජ සමයේ ලක්දිවට පැමිණි බෝධාහර කුලවලින් එකකට නෑකම් කියන බව පවසයි. එසේ නමුත් පී.ටී. ප්‍රනාන්දු

මහතා හා මාරි ගැතලියේ විසින් මෙම පරපුර නායක්කාර රජුන් සමඟ ඉන්දියාවේ සිට පැමිණි දක්ෂ කලාකරුවන්ගෙන් පැවත එන එකක් බව ප්‍රකාශ කොට තිබේ (Gatellier, 1991, වෙළුම: II, පිට:187 - 191). ඒ අනුව ඇතැම් විචාරකයන් විසින් මෙම චිත්‍ර ශිල්පී පරම්පරාවන්හි ඉතිහාසය බොහෝ පැරැණි බව හැඟවීමට මෙන්ම ඒවාට ඉන්දීය සම්භවයක් පැවති බව කීමට ද ඔවුන් හා සම්බන්ධ වන තරමක් පැරණි ලිපි ලේඛන මගින් අවධාරණය කොට ඇත. විශේෂයෙන්ම පැරණි සමයකට අයත් වන චිත්‍ර ශිල්පී පරම්පරා මේ තාක් සත්‍ය ලෙසම ශේෂ වී තිබේ ද යන්න කිසිවෙක් හෝ තහවුරු කරගත් නිශ්චිත සාක්ෂි නොමැති තරම්ය. මෙකී පසුබිම පැරණි චිත්‍ර ශිල්පී පරම්පරාවන්හි නූතන සාමාජිකයන් කෙරෙහි ද බලපා තිබෙන අතර ඔවුන් සියලු දෙනාම තම මුතුන්මිත්තන් උතුරු ඉන්දියාවේ සිට මෙරටට ශ්‍රී මහා බෝධිය සමඟ හෝ දකුණු ඉන්දියාවේ සිට නායක්කාර රජවරුන් සමඟ හෝ පැමිණි තැනැත්තන් පිරිසක් බවට පිළිගනී. මේ අතුරින් ඇතැමෙක් සබරගමුව වැනි ප්‍රදේශයක සිට ඔවුන් කන්ද උඩරට රාජධානියට පැමිණ බව ද විශ්වාස කරන බව මහනුවර, මාතලේ හා හේවාහැට වැනි කේන්ද්‍රිය උඩරට ප්‍රධාන කාර්මික පෙළපත්වල පුද්ගලයින් ගණනාවකින් පර්යේෂකයා කළ ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි විණි. මේ කරුණින් ද වඩාත් හොඳින් තහවුරු වන්නේ මෙම ශිල්පී පරම්පරාවල ප්‍රභවය මෙන්ම ඒවායේ ඈත අතීතයේ ද බෙහෙවින් ඝණ අඳුරකින් වැසී ඇති ආකාරයයි. ඔවුන්ගේ ප්‍රභවය මහනුවර පෙදෙසෙන් දුර බැහැර පිහිටි පිටස්තර ප්‍රදේශවලට පවරා දී ඇත්තේ ද මේ නිසා විය හැකිය. මෙමගින් මෙම පරම්පරාව මහනුවර යුගයටම සුවිශේෂී නොවූ විදේශ රටවලින් පවා සංක්‍රමණය වූ බව නිගමනය කළ හැකිය, කෙසේ වෙතත් මේ තත්ත්වය කෙතරම් බැරෑරුම් ද කියනවා නම් ඉතා පැරැණි චිත්‍ර පරම්පරාවෙන් ජීවත් නයිදේ මහතාට පවා සිය පරපුර පිළිබඳ අඛණ්ඩ විස්තරයක් සැපයීමට හැකි වී ඇත්තේ සිය මුත්තා වූ අප්පු නයිදේ මහතා දක්වා පමණයි. හෙතෙම සිය පෙළපත ගැන දන්නා කරුණුවලට අනුව එම පරපුරේ සිටි පැරණි ශිල්පීන් කිහිපදෙනා අපට මෙසේ අනුපිළිවෙල දැක්විය හැකිය.

රූප සටහන 01: පැරණි ශිල්පීන් අනුපිළිවෙල




(මූලාශ්‍රය: සෝමතිලක, 2002: 436)

ඉහත සඳහන් කළ පරිදි නිලගම සිත්තර පරම්පරාවේ ශිල්පීන්ගේ අනුපිළිවෙල පැහැදිලි වේ. එමෙන්ම මෙම සිත්තර පරපුරෙන් පැවත ආ බව සිතිය හැකි ඉහත සඳහන් නොවන සිත්තරවරුන් කීප දෙනෙක්ම දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල පිහිටි විහාරවල චිත්‍ර කරණයෙහි යෙදෙන්නට ඇති බව ද පෙනේ. විශේෂයෙන්ම දෙගොල්දොරුව විහාරය චිත්‍ර දෙන ලද සිත්තරුන් ගැන කියවෙන තොරතුරුවලට මෙහි දී ඉතා වැදගත් තැනක් හිමිවන අතරම නිලගම පටබැන්දා නම් නැමැත්තකු තත් විහාර ගෘහයේ චිත්‍ර ඇඳීමේ කාර්යෙහි නිරත වී සිටි බව සඳහන් වී තිබේ (කුමාරස්වාමී, n.d, පිට:167). මීට අමතරව යාපහු විහාරය චිත්‍ර ඇඳ ඇත්තේ එම පරපුරේ ම අයෙකු විසින් බව චිත්‍ර අතර යොදා තිබෙන "මේ බිතුසිතුවම් නිලගම පරම්පරාවට අයත් නිකවැව පහළවත්තේ උක්කු නයිදේ සිත්තර විසින් කුඹුක්වැව ධම්මරක්ඛිත හිමියන් දවස කරවන ලදී" යන පාඨයෙන් හොඳින් තහවුරු වේ. එමෙන්ම එහි සඳහන් වන උක්කු නයිදේ මහතා හා නිලගම සිත්තර පරපුර අතර ඇති සම්බන්ධය ගැන කරුණු දැක්වීමට පරම්පරාවේ ජීවන් නයිදේ මහතා පවා අද අපොහොසත් වී සිටී (දිසානායක, බගාග, පිට:189). තව ද මහනුවර ගංගාරාම විහාරයේ චිත්‍ර ඇඳීමෙන් නිරතව වී ඇත්තේ ද මේ පරපුරේම

අයෙක් බවත් නිලගම අභරණ අප්පු නැමැත්තෙකු ගැන එහි සඳහන් කොට තිබීම මගින් එය තහවුරු වේ (Codrington, n.d, P:245). නිලගම සිත්තර පරම්පරාවේ පටබැඳී හිත්තරගේ නැමැත්තෙකු ගැන ඒ.සී.ලෝරි දක්වා තිබෙන සටහන ද මේ පිළිබඳ තවත් වැදගත් සාක්ෂියකි (Lawrie, n.d, වෙළුම: II, පිට:642).

මීට අමතරව දෙගල්දොරුව විහාරයේ චිත්‍ර කර්මාන්ත කටයුතු සඳහා සහභාගි වූ ශිල්පීන් කිහිප දෙනෙකු ගැන තොරතුරු ඇතුළත් පසුකාලීන ලේඛනවල වාර්තා වී ඒ අනුව මේ සියවස මුල් භාගය ආනන්ද කුමාරස්වාමි හා කොඩ්රින්ටන් යන දෙදෙනාගේ විස්තරවල දීත් මේ ශිල්පීන් ගැන සඳහන් වී ඇතත් දෙගොල්දොරුව විහාර සන්නසේ පවා ඔවුන් ගැන කිසිදු සඳහනක් ඇතුළත් වී නොමැති බවක් පෙනේ (කුමාරස්වාමී, n.d, පිට:74). එහෙයින් එය මේ රචකයන් එකල අසන්නට ලැබුණු පාරම්පරික විශ්වාසයක් වුව ද විය හැකිය. මේ විස්තරය අනුව ගිය සේනක බණ්ඩාරනායක, මාරි ගැතලියේ, සිරිමා කිරිබමුණේ හා ජෝන් හෝල්ට් වැනි මෑත කාලීන පර්යේෂකයන් ද එය එලෙස ම පිළිගෙන තිබේ (Gatellier, 1991, වෙළුම: I, පිට:56). තව ද මීට අමතරව මේ ශිල්පීන් අතුරින් දෙවරගම්පල සිල්වත් තැන විසින් රිදී විහාරයේ චිත්‍ර අඳින ලද බව ආනන්ද කුමාරස්සාමි විසින් වාර්තා කොට ඇති අතර ඒ ද වෙනත් කිසිදු ප්‍රාථමික මූලාශ්‍රය තහවුරු නොවේ. දෙගල්දොරුව හා රිදී විහාර යන විහාරස්ථානවල චිත්‍රවල මතුපිට පෙනෙන සෞම්‍ය සැලකිල්ලට ගැනීම නිසා මෙවැනි නිගමනයකට එළඹුණු බව සිතිය හැකිය. නමුත් ඇතැම් විට මේ කරුණ සමකාලිකයන්ගෙන් ඔහුට ලැබුණ තොරතුරක් ද විය හැකි බව විශ්වාස කළ හැකිය. කෙසේ වෙතත් මේ විහාර දෙකේ දී පමණක් නොව මහනුවර නගරාශ්‍රිත බොහෝ විහාරයන්හි ද මෙවැනි සමීප සාම්‍යයක් දක්නට ලැබේ. එහෙයින් සේනක බණ්ඩාරනායක හා මාරි ගැතලියේ වැනි ශාස්ත්‍රඥයන් කුමාරස්වාමි මහතාගේ මේ විස්තරය උපුටා දැක්වූවා විනා එහි පදනම සොයා බැලූ බවක් නම් නොපෙනේ. එපමණක් නොව ඉහත සඳහන් කළ කොස්වත්තේ හිත්තර නයිදේ යන අය විසින් ද දෙගල්දොරුව විහාරයේ ඇති සුතසෝම ජාතකය අඳින ලදැයි විශ්වාසයක් ඇතත් එම චිත්‍ර මෙලෙස ශිල්පීන් අනුව වෙන් කොට හඳුනා ගැනීමට හැකියාවක් නොලැබේ (කුමාරස්වාමී, n.d, පිට:167). මේ විස්තරය පිළිබඳ විශ්වාස තැබූ බොහෝ රචකයන්ගෙ ලිපි ලේඛනවලත් මෙම ඌනතාවය එසේමය.


**දෙවරගම්පල පරම්පරාව**

දෙවරගම්පල පරම්පරාව නියෝජනය කළ ප්‍රධාන ම ප්‍රසිද්ධ සිත්තරකු ලෙස දෙවරගම්පල සිල්වත් තැන පෙන්වා දිය හැකිය. ඔහු කෑගලු දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රදේශයේ පිහිටි දෙවරගම්පල නම් ගමේ උපන් අයෙකි (චාල්ස්, n.d, පිට:14). විශේෂයෙන්ම මෙතුමා කීර්ති රාජසිංහ රජුගේ කාලයේ දී ගරු බුහුමන් ලැබූ තැනැත්තෙකු බව සඳහන් වන අතරම ඔහු සමග එකට එකතු වී හෝ සමකාලීනයන්

ලෙසට වැඩ කළ අනිකුත් ශිල්පීන් ලෙස හිරියාල නයිදේ, දේවේන්ද්‍ර මූලාචාරීන්, කොස්වත්තේ හිත්තර නයිදේ, නිලගම පටබැන්දා, වැත්තෑවේ හාමුදුරුවෝ හා කටුවන හාමුදුරුවෝ යනාදීහු පෙන්වාදිය හැකිය. මේ අතරින් එම කාලයේ ප්‍රසිද්ධ කීර්තියක් ඇති ව දෙවරගම්පල සිල්වත් තැන ශ්‍රේෂ්ඨ ශිල්පී පරපුරකින් පැවත එන්නෙකු විය හැකි වන අතරම මේ ප්‍රදේශය අවට තවමත් චිත්‍ර කර්මාන්තයේ නියැළුණු වයෝවෘද්ධ ශිල්පීන් කිහිප දෙනෙකු ද පදිංචි වී සිටිති. එමෙන්ම මීට අමතරව පැරණි අවධියේ විහාර චිත්‍රණය හා සම්බන්ධ වී සිටි බව සිතීමට පෙළපත් නාමය සහිත කාර්මික පවුල් ගණනාවක් ද මේ ප්‍රදේශයෙන් හමු වේ. දනාගම හිඳින දන්තසිංහ මූලාචාරීන්ගේ, ගොඩිගමුවේ හිඳින ගොඩිගමුවේ හිත්තර ගෙදර හා දේවනාරායන හිත්තර ගෙදර යන පවුල් කිහිපයක් හබලක්කාව හා දුල්දෙණිය යන ගම්වල හිඳින දේවනාරායන පෙළපත් නාමය දරණ පිරිසත් මීට කදිම නිදසුන්ය (තිලකසිරි, 1994: 134 - 140). තව ද එම ප්‍රදේශ අවට දොඩන්තලේ, දනගිරිගල හා දෙවනගල වැනි මහනුවර සමයට අයත් චිත්‍ර සහිත විහාර ගණනාවක් ද ශේෂ වී ඇති බව දැකගත හැකිය.

එම පරම්පරාව පිළිබඳ සාකච්ඡා කරන විට දකුණු පළාතේ මාතර කරගොඩට ආසන්න උයන්ගොඩ සිට පසු කලෙක උඩරට පිහිටි මාතලේ ප්‍රදේශයට පැමිණ පදිංචි වූ එම්.පී. ලිවේරිස් මහත්මා මෙවැනි තවත් පැරණි සිත්තර පරපුරකින් පැවත එන්නෙකු බවට විශ්වාස කෙරේ. කෙසේ වෙතත් ඔහු මහනුවර සමයේ ද අති දක්ෂ චිත්‍ර ශිල්පියකු ලෙස ප්‍රසිද්ධව සිටි ඉහත කී දෙවරගම්පල සිල්වත් තැනගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවකින් පැවත එන ලෙසට විශ්වාස කරයි. තව ද දෙවරගම්පල සිල්වත් තැන සැලකිය හැකි වූ වැත්තෑවේ හා කටුවන භික්ෂූන් දෙනම ද කන්ද උඩරට හා මුහුදුබඩ යන ප්‍රදේශ දෙකෙහිම චිත්‍ර ඇඳීමේ කටයුතුවලට ද බොහෝ සෙයින් මෙම සිත්තරුන්ගෙන් කටුවන භික්ෂුවගේ ශිෂ්‍ය පරපුරට අයත් වූවන් පිරිසක් ලෙසට සැලකේ (දිසානායක, බගා: 190). එමෙන්ම හඟුරන්කෙත, කෝට්ටේ, කැලණිය, දෙවුන්දර, පෙතන්ගහවත්ත වැනි විහාරස්ථානයන්හි ඇති සිතුවම් නිමකල අන්දිරිස් මහතා මෙන්ම මෙම පරපුරේම සිටි හීමප්පු මහතාත් මෙබඳු ම දක්ෂ ශිල්පීන් දෙදෙනෙකි (දිසානායක, බගා: 190). එම පරපුරෙහි දැනට සිටින තැනැත්තා වූ එච්.ජී.ලිවේරිස් මහතා ද චිත්‍ර ශිල්පය පිළිබඳ කරුණු හදාරා ඇත්තේ ද මේ පරපුරේම සිටි ඉහත සඳහන් කළ හිමප්පුගෙනි. නිර්මාල් දිසානායක පවසන ආකාරයට එම පරපුරේ පුද්ගලයින් පිළිබඳ ලබාගත හැකි තොරතුරු මෙලෙස දැක්විය හැකිය.

රූප සටහන 02: දෙවරගම්පල පරපුරේ පුද්ගලයින්




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2023)

ඉහත තොරතුරු අනුව මේ අතරින් මාතර හා දෙවුන්දර ප්‍රදේශ අවට සිටි දක්ෂතම පැරණි චිත්‍ර ශිල්පීන් දේවේන්ද්‍ර හා දේවසුරේන්ද්‍ර යන පරම්පරාගත නම්වලින් හඳුන්වනු ලබන බව පෙනේ (චාල්ස්, n.d, පිට:13-15). විශේෂයෙන්ම විසිවන සියවසේ මුල් භාගය පමණ දැඹව විහාරයේ විසූ හේරත්ගම ශ්‍රී රතනපාල තෙරණුවෝ චිත්‍ර ශිල්පය පිළිබඳ ප්‍රවීණ ප්‍රසිද්ධ සිත්තරෙකි. උන්වහන්සේ පෙතිකඩ චිත්‍ර ඇඳීමෙහි දක්ෂයකු වූ අතරම දැඹව විහාරයේ තිබූ චිත්‍ර සියල්ලම නැවත පිටපත් කළ බව ද මූලාශ්‍රය මඟින් අනාවරණය වේ (සුමනජෝති හිමි, බගාග: 107). එමෙන්ම ආනන්ද කුමාරස්වාමි මහතා ද මේ සියවස මුල් භාගයේදී දෙවරගම්පල සිල්වත් තැනගේ පරපුරට අයත් වූවකු ලෙස සැලකෙන සේරුගොල්ලේ හිත්තර නයිදේ නැමැත්තෙකු හමු වී ඇති අතර ඔහුගෙන් ලබාගන්නා ලද චිත්‍ර කිහිපයක් මධ්‍යකාලීන සිංහල කලා නම් තම කෘතියට ද ඇතුළත් කොට තිබේ. ඇතැම් විට මහනුවර ප්‍රදේශයෙන් දුර බැහැරව පිහිටි විහාරවල චිත්‍ර කර්මාන්තයේ දී දෙවරගම්පල සිල්වත් තැන හා නිලගම පටබැන්දා වැන්නන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයත් පිරිස සම්බන්ධ වී ක්‍රියා කරන්නට ඇතැයි සිතිය හැකිය. මහනුවර සම්ප්‍රදායට අනුව චිත්‍ර අඳින ලද අවසාන වැදගත් ශිල්පියා ලෙසට සැලකිය හැකි වන්නේ ඩී.එස්. මුහන්දිරම්ය. ඔහු ආනන්ද කුමාරස්වාමී මහතාගේ මධ්‍යකාලීන සිංහල කලා නම් ග්‍රන්ථයට විශාල වශයෙන් කරුණු සපයා දුන් තැනැත්තෙක් වන අතරම යථෝක්ත මහනුවර දෙහිපාගොඩ විහාරයේ චිත්‍ර අඳින ලද්දේ ඔහු විසින් යයි විශ්වාසයක් පවතී (Survey of Temple Paintings – second report, 1960, පිට:05).

**හිඟුල්වල පරපුර**

මෙම හිඟුල්වල සිත්තරුන් පිරිස ගැන තොරතුරු හමු වීමේ දී ඔවුන් පසු කාලීනව උල්ලඳුපිටියට පැමිණ පදිංචි වී තිබේ. මෙසේ උල්ලඳුපිටියෙහි පදිංචිව සිටි ප්‍රධාන සිත්තර පවුල් ගණන දෙකකි. ඔවුන් වෙද ගෙදර හා කුඹුරේ ගෙදර යනුවෙන් හැඳින්වේ. එයින් වෙද ගෙදර පවුලට අයත් වෙද ගෙදර මූලාචාරියාගේ හා කොඩිතුවක්කු වසමේ ද සේවය කළ තැනැත්තෙක් බව කොඩ්රින්ටන් සඳහන් කර තිබේ (Codrington, n.d, පිට:242). එමෙන්ම මේ ප්‍රදේශයේ සිටි සිත්තර පවුල්වල අතීතය යටත් පිරිසෙයින් ක්‍රි.ව. දහසය වන සියවස අග භාගය වන තෙක් ඈතට දිවෙන බව විමලධර්මසූරිය රජුගේ කාලයට අයත් වර්ෂ 1592 පැරණි සන්නසක සඳහන් වී තිබෙන උල්ලඳුපිටියේ රාජේශ්වර හිත්තර ආචාරියෙකු ගැන කියවෙන බව හොඳින් පැහැදිලි වේ. මීට අමතරව උල්ලඳුපිටියේ සිටි තවත් සිත්තර නයිදේ කෙනකු ගැන ද තොරතුරු ඇති අතර හාරිස්පත්තුව කුළුගම්මන සියපත්තුවට අයත් එම ගමෙහි පිහිටි දළදා මාලිගාව සතුව පැවති හිත්තර පංගුවක් ද මේ පෙළපතේ අයට පරම්පරාගත ලෙස භුක්ති විඳීමට හැකිවන පරිදි ප්‍රදානය කොට ඇත. තවද මේ සියවස මුල් භාගයේ දී දළදා මැඳුරෙහි පහළ මාලයේ දකුණු පස වියන් තට්ටුවේ තිබෙන චිත්‍ර ඇඹලපුරේ කිරිහාමී මුහන්දිරම් නැමැත්තෙකු විසින් නිම කරන ලද බව සඳහන්ය. එහි ඇතුළත් වන ඇඹලපුරේ යන උල්ලඳුපිටියේ එක් පසෙකින් පිහිටි තවත් කුඩා ගමකි. එම කාර්මික පරපුරටම අයත් තැනැත්තෙකු වන දන්ත සිංහ චිත්‍ර මූලාචාරීන්ගේ කරුණාතිලක මහතාට අනුව මේ කිරිහාමි මුහන්දිරම් ක්‍රිස්තු වර්ෂ 1932 දෙසැම්බර් මස මිය ගොස් තිබූ අතර පසුව ඔවුන් චිත්‍ර ශිල්පියා වෙනුවට වෙනත් කර්මාන්තවලට සම්බන්ධ වූ බව දක්වයි. තව ද මේ විස්තරවලට අනුව මේ ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් ප්‍රසිද්ධ සිත්තර පරම්පරාවක් හෝ දෙකක් වත් පදිංචි වී සිටි බව හොඳින්ම පැහැදිලි වේ.

**හුලංගමුව පරම්පරාව**

තවත් පැරණි මහනුවර යුගයේ චිත්‍ර කර්මාන්තයේ නියැළුණ සිත්තර පරම්පරාවක් ලෙස හුලංගමුවේ සිත්තර පරම්පරාව හඳුන්වාදිය හැකිය. මාතලේ හුලංගමුව ප්‍රදේශයේ සිටි මොවුන් ශක වර්ෂ 1714 දී එම පෙළපතෙහි හිත්තරගේ රම්බොඩ උන්නැහෙ නැමැත්තකු විසින් තඹ සන්නසක් ද ලබා ගෙන තිබේ (Lwrie, n.d, පිට:364-366). මෙම සිත්තර පරම්පරාව උල්ලඳුපිටියේ සිත්තර පරපුර හා නිලගම පරම්පරාව යන පරම්පරා සමඟ ඉතාමත් සමීප ඥාති සම්බන්ධතාවයක් පවත්වා ඇත. එකී පරම්පරාවලට අයත් වෘද්ධිතමයන් විසින් පර්යේෂකයා හට පැවසූ පරිදි එම සබඳතා බෙහෙවින් දීර්ඝ අතීතයක් දක්වා ඈතට විහිදේ.

(සම්මුඛ සාකච්ඡා 02)

> අපේ පරපුර පැරණි සිත්තර පරපුර සමග ඉතාමත් සම්බන්ධතා පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා, විශේෂයෙන් ඒ කාලය තිබ්බ ප්‍රධාන පරපුරක් වෙච්ච නිලගම පරපුර හා උල්ලදූපිටියේ පරපුර අපිට ඥාතීන්" (මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2023)

ඉහත සම්මුඛ සාකච්ඡා තොරතුරුවලින් ඒ බව මැනැවින් තහවුරු වේ. එමෙන්ම ඉහත සඳහන් කළ නිලගම සිත්තර පරපුරක් මෙවැනි තවත් බොහෝ ප්‍රසිද්ධ පැරණි කාර්මික පවුලක් වන නීලගම පරපුර සමග ඉතාමත් කිට්ටු ඥාති සම්බන්ධතාවක් පවත්වාගෙන යන බවත්, මේ පෙළපත් දෙකේම තැනැත්තන් එකම මූල පරම්පරාවකින් පැවත එන බවත් මේ පිරිස විශ්වාස කරන බව පර්යේෂකයා හට පවසන ලදී. මේ පිරිස හුලංගමුවේ සිත්තර පරපුර සමඟත් ඉතාමත් කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන යන බව ද එය ඈත අවධියක් දක්වා දිව යන බව ද විශ්වාස කරයි. තව ද මොහු තවත් කාර්මික පිරිසක් වන ඇම්බැක්කේ ප්‍රධාන කැටයම් ශිල්පී පවුල් සමඟත් හපුවි ද, මංගලගම හා මඩවල වැනි ගම්මානවල හිදින කාර්මික පවුල් සමඟ ගොඩපොල පරම්පරාව සමඟ ඉතාමත් කිට්ටු සම්බන්ධතාවයක් පවත්වන නමුත් ගඩලාදෙණිය හා කරිවවුලේ වැනි ගම්මානවල පදිංචි වී සිටින පිත්තල කාර්මිකයන් සමග ඥාති සම්බන්ධතා නොපවත්වන බව ඉතාමත් සෘජු ලෙස පර්යේෂකයා හට ප්‍රකාශ කරන ලදී.

**ගොඩපොල පරම්පරාව**

හේවහැට පල්ලේ ගම්පහ මතුරට කෝරලයේ උකුතලේ  ප්‍රදේශයේ ඉඩම් ප්‍රදානයක දීත් සිත්තර නයිදේ කෙනෙකු ගැන සාක්ෂිකරුවකු ලෙසට සඳහන් කර ඇති අතර තුන්පනේ පල්ලේ පළාත කෝරලේ මුදගම්මන විහාරයට අයත් ශක වර්ෂ  1713 ට අයත් වන සන්නසකත් තවත් හිත්තර නයිදේ කෙනෙකු ගැන තොරතුරු වාර්තා වී තිබේ (Lawrie, n.d, පිට:869). විශේෂයෙන්ම මහනුවර ප්‍රදේශයේ ගෙලිඔයට නොදුරු ගොඩපොල ගමේ ද සුප්‍රකට පැරණි චිත්‍ර සම්භවයක් සිටි බවත් එහි පසුකාලීනව දක්ෂ සිත්තරෙක් වූ ගොඩපොල මුහන්දිරම් නැමැත්තා මීට දසක කිහිපයකට පෙර මියගොස් ඇති බවත් සඳහන් වේ. මේ සියවස මුල් භාගයේ දී පමණ ඔහු විසින් දෙහිපාගොඩ අග්‍රබෝධි විහාරයේ චිත්‍ර අඳින ලද බව කියැවෙන අතරම ලංකාවේ විවිධ ප්‍රදේශවල පිහිටි වෙහෙර විහාරවල ඔහු විසින් චිත්‍ර අඳින ලද බව ප්‍රසිද්ධය. විශේෂයෙන්ම ඔහු හුලංගමුව සිත්තර පරම්පරාවට සම්බන්ධ තැනැත්තෙකු බව එම පෙළපතේ පමණක් නොව හුලංගමුව පෙළපතේ අය ද විශ්වාස කරති. එම පරපුරය අනෙකුත් තැනැත්තන් අද වන විට මේ ශිල්පීන් මුළුමනින්ම පාහේ ඉවත් ව සිටියත් ඔවුන් අතර පවා හොඳින් චිත්‍ර ඇඳීමේ දක්ෂතාව ඇති පුද්ගලයින් සිටින බව ඔවුන් විසින් අඳින චිත්‍ර කිහිපයක්

දැකීමෙන් පර්යේෂකයා හට අවබෝධ විය. ඒ අනුව මෙම ගොඩපොල සිත්තර පරම්පරාව හුලංගමුව පරම්පරාවෙන් බිඳී පැවත ආ පිරිසක් බව අවධාරණය වේ.

**කඩොල්ගල්ලේ පරම්පරාව**

මාතර, දෙවුන්දර, වැලිගම, දෙනිපිටිය, අකුරුගොඩ, ගරාඬුව, බටුවිට, මිරිස්ස, පොල්වත්ත, කෝදාගොඩ, මාරගොඩ වැනි ස්ථානවල මෙලෙස පැරණි චිත්‍ර ශිල්පීන් පදිංචි වූ බවට බොහෝ දෙනෙකු විශ්වාස කරන අතරම කඩොල්ගල්ලේ හීමප්පු හා වැලිතර හීමප්පු, අහංගම ඩිංගිරි අප්පු ගණින්නාන්සේ ආදීන් එවැනි ගම්වල වාසය කළ බව ප්‍රසිද්ධ සිත්තරුන් කිහිප දෙනෙකි. මෙයින් කඩොල්ගල්ලේ සිත්තර පරම්පරාව විසින් කතලුව පූර්වාරාමයේ චිත්‍ර අඳින ලද බවට විශ්වාසයක් පවතින අතර මොවුන්ගේ සමාරම්භකයින් ලෙස සැලකෙන්නේ කඩල්ගල්ලේ මහා සිත්තරා හා කඩොල්ගල්ලේ පොඩ්ඩා සිත්තරා නමින් හැඳින්වුණු සිත්තරවරුන් දෙදෙනාය. එපමණක් නොව ගාල්ලේ බෝගහවත්ත විහාරයේ බිතුසිතුවම් ගරාඬුවේ මහා සිත්තරා විසින් අඳින ලද අම්බලන්ගොඩ සුනන්දාරාමයේ චිත්‍ර පරපුරෙහි තැනැත්තන් විසින් ඳින ලද බවත් විශ්වාස කරන අතර මේ පරපුරේ ආදිතමයා හීමප්පු ගුරුන්නාන්සේ නම් තැනැත්තෙකු බව කියැවේ (මංජු, 1977: 11). ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුවේ ජිනේන්ද්‍රාරාමයේ ඇති චිත්‍ර ක්‍රි.ව. 1840 ගාලුපියද්දේ බබුන් නැමති ශිල්පියෙකු විසින් අඳින ලද ඒවා බවත් ඉහත සඳහන් ශිල්පීන් පිරිස් අතරින් කඩොල්ගල්ලේ මහ සිත්තරා හා පොඩ්ඩා සිත්තරා විසින් තෙල්වත්ත අලුත් විහාරයේ දී හා අටකෝරළයේ සිත්තර මුදියන්සේ විසින් එහිම අලුත් විහාරයේදීත් චිත්‍ර අඳින ලද බවත් විශ්වාසයක් පවතී (ප්‍රේමතිලක, 1990: 12).

මේ අවධියේ තවත් සිත්තරවරුන් කිහිප දෙනෙක් ගැන ද කරුණු හමු වන අතරම ඔවුන් කවර ශිල්පී පරම්පරාවට අයත් වූවන් ද යන හරියටම සොයාගත නොහැකි වී තිබේ. මහනුවර ගංගාරාම විහාරයේ චිත්‍ර අඳින ලද ගන්නෝරුවේ ලොකු මුහන්දිරම්, හිරියාල හිත්තර නයිදේ හා සූරියගොඩ විහාරයේ චිත්‍ර අඳින ලද තෙල්දෙණිය හිත්තර නයිදේ ආදීන් මේ අතුරින් වැදගත් තැනක් හිමි කර ගනී. ඒ.සී. ලෝරි සඳහන් කර තිබෙන පරිදි ගංගාරාමයේ වැඩ කටයුතු නිම කළේ මේ පිරිස් අතුරින් ගන්නෝරුවේ ලොකු මුහන්දිරම්ගේ ප්‍රධානත්වයෙන් බවය. එම කටයුතු භාරව සිටි ප්‍රධාන කාර්මික ශිල්පියා වූයේ ගන්නෝරුව අබරණ ආචාරියා නිකන් හැඳින්වූ තැනැත්තෙකි (Lawrie, n.d, පිට:642). මෙහි වැඩ කටයුතුවල දී ගුරුලාවල බුවනෙකබාහු දේවනාරායන සිත්තර මූලාචාරියාගේ ද සහය ලැබී ඇති බව අවධාරණය වේ (Codrington, n.d, පිට:244).

මාතලේ ප්‍රදේශයේ සිටි තවත් සිත්තරවරුන්ගේ කීප දෙනෙකු ගැන ද තොරතුරු හමු වන නමුත් ඔවුන්ගේ පෙළපත් ගැන විස්තර කිසිවක් සපයාගත නොහැකි වී තිබේ. නාගොල්ලේ හිත්තර නයිදේ, මැද සියපත්තුවේ ඉඹුල්පිටියේ සිටි හිත්තර නයිදේ, කඩපල්ල කෝරලේ හිත්තරගේ, දඹෑව හිත්තර නයිදේ හා උඩංගමුව වසමේ හපුවිද හිත්තර නයිදේ ආදීන් ගැන ලෝරිගේ වාර්තාවේ සඳහන් වී තිබෙන විස්තරයෙන් පැහැදිලි වේ (Lawrie, n.d, පිට:289). විශේෂයෙන්ම කුරුණෑගල ප්‍රදේශයේ පිහිටි කැබැල්ලලෙන විහාරයේ චිත්‍ර ඇඳි තැනැත්තෙකු ලෙස සැලකෙන අප්පු නයිදේ නැමැත්තෙකු ගැන ද කියවෙන විස්තරය ද මෙවැන්නකි.

මෙලෙස පැරණි අවධියට අයත් වන චිත්‍ර ශිල්පය හා සම්බන්ධ වන පවුල් ගණනාවක් මේ වන විට තත් ශිල්පයෙන් ඉවත් වී සිටීම නිසා ඔවුන් ගැන කාරණා සෙවීම ද අද වන විට බෙහෙවින් දුෂ්කර කටයුත්තක් වී ඇතත් කාර්මික ගම්මාන ලෙසට ප්‍රසිද්ධ වී ඇති තැන්වල පදිංචි බොහෝ දෙනෙකුගේ පෙළපත් නම්වලින් ඔවුන් චිත්‍ර ශිල්පය හා සම්බන්ධ වී සිටි පවුල් බව ද පෙනේ. විශේෂයෙන්ම මාවනැල්ල ප්‍රදේශයේ දනාගම හිඳින දන්තසිංහ චිත්‍ර මූලාචරියන්ගේ, ගොඩිගමුව හිඳින ගොඩිගමුවේ හිත්තර ගෙදර, අරණායක හබල්කාවේ හා දුල්දෙණියේ හිඳින දේවනාරායන හිත්තර ගෙදර, මහනුවර කිරිවවුලේ හිඳින දේවනාරායන හිත්තර ගෙදර, යාලේගම හිත්තර ගෙදර, කිරිවවුලේ හිත්තර ගෙදර හා නීලවල දේවනාරයන හිත්තර ගෙදර වැනි පෙළපත් නම්වලින් මේ බව හොඳින් ම පැහැදිලි වේ. විශේෂයෙන්ම කීර්ති රාජසිංහ කාලේ රජුගේ කාලයේ දී උපසම්පදාව ලත් භික්ෂූන් දිවයින පුරාම වාගේ විසිරී ගොස් ශාසනික ක්‍රියා හා විහාර නවකම් වැනි දෑ කිරීමට පටන් ගනු ලැබුවේය. මේ කාලයේ දී සිටි චිත්‍ර ශිල්පීන්ටත් එම කටයුතුවලට විශේෂ කාර්යභාරයක් පැවරුණු අතර ම එම කාලය වන විට ඔවුන් හොඳින් රට පුරා විසිරී සිටියහ. ඔවුහු අවට ජනයාගේ උවමනාවන් ඉටු කරමින් සිටි අතර ගැමියන්ගෙන් ජ්‍යෝතිෂ්‍යය, වාස්තු විද්‍යාත්මක, යන්ත්‍ර මන්ත්‍ර හා බලිතොවිල් කටයුතු පමණක් නොව ආභරණ හා ලෝහයෙන් ගෘහ උපකරණ තැනීම වැනි සෑම කාර්යයක්ම ඉටු කරමින් ගමේ අත්‍යවශ්‍ය පුද්ගලයින් පිරිසක් බවට ද මෙම චිත්‍ර ශිල්පීන් පත් වී සිටියේය. විශේෂයෙන්ම මේ තත්වය නිසා මුහුදුබඩ ප්‍රදේශයේ ගාල්ල හා මාතර වැනි දිස්ත්‍රික්කවල සිටි ශිල්පීන් කිහිප දෙනෙකු ගැන තොරතුරු ස්වල්පයක් අද වන විට ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

**නිගමනය**

මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන්ගේ පරම්පරා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී විශේෂයෙන්ම පරම්පරා කිහිපයක් අපට හඳුනාගත හැකි විය. ඒ අතර නිලගම පරම්පරාව, කඩොල්ගල්ලේ පරම්පරාව, දෙවරගම්පල පරම්පරාව, හිත්තැටිය පරම්පරාව, ඇම්බැක්කේ පරම්පරාව, හුලංගමුව පරම්පරාව වැනි පරම්පරාව විශේෂ වේ. මීට අමතරව නිශ්චිතව පරම්පරාවකට ඇතුළත් කළ නොහැකි චිත්‍ර ශිල්පීන්ගේ

තොරතුරු ද යම් යම් ප්‍රමාණයකට හමු වී ඇත. විශේෂයෙන්ම මෙම කාලයේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයන් හි ඇති වූ විවිධ වෙනස්කම් නිසා චිත්‍ර ශිල්පීන් නිරතව සිටි මෙවැනි ශිල්පී පරම්පරා බොහොමයක් වෙනත් කටයුතුවල නිරතවීමට පෙළඹවීමෙන් මෙම ශිල්පීය පරම්පරාවලින් ක්‍රමයෙන් ගිලිහී යාම සිදු වී තිබුණි. යටත් විජිත සමයේ පසු කාලයේ දී රැකී රක්ෂා ලබා ගැනීමේ දී ශිල්පීන්ට මුහුණ දීමට සිදු වූ විවිධ දුෂ්කරතා නිසා ඔවුන් බොහෝ දෙනෙකු තම වාසගම් පවා වෙනස් කර ගනිමින් කටයුතු කරන්නට වීම නිසා මෙම චිත්‍ර ශිල්පී පරම්පරාවන් අභාවයට යාමත් එකී පරම්පරාවන් නිශ්චිත ලෙස කරුණු නිර්ණය කර ගැනීමටත් හැකියාව ලැබී නොමැත.

එමෙන්ම මහනුවර යුගයේ චිත්‍ර ශිල්පය පිළිබඳව කරුණු ගොනු කිරීමේ දී උඩරට ප්‍රදේශයේ සිටි මෙම චිත්‍ර ශිල්පීන් බොහෝ දෙනකුගේ නම්හි අගට 'නයිදේ' යන පදය යෙදී ඇති බැව් පෙනේ. ඔවුන් ඇත්ත වශයෙන්ම මෙම පැරණිතම පරම්පරාවලට අයත් වූවන් ද වෙති. දෙල්දෙණියේ හිත්තර නයිදේ, බෝධිනාරායන චිත්‍රාචාරීන්ගේ කපුරු  නයිදේ, හිරියාලේ නයිදේ, කුඹේපිටියේ පටබැඳි විදානගේ නයිදේ, සේරුගොල්ලේ හිත්තර නයිදේ යන ආදීන් මහනුවර සමයේ ප්‍රසිද්ධ සිටි මෙවැනි පැරණි චිත්‍ර ශිල්පීන් කිහිපදෙනෙකි. විශේෂයෙන්ම නයිදේ යනු රජුගේ ඇතැම් කටයුතු ඉටු කරන්නන්ගේ ප්‍රධානියාට දෙන ලද නාමයකි. ඒ අනුව මෙම චිත්‍ර ශිල්පීන් මහනුවර යුගය වන විට ඉතාමත් වැදගත් කර්තව්‍යයක නිරත වී ඇති බවත් උඩරට ප්‍රදේශයන්හි නයිදේ ලෙසත්, පහතරට ප්‍රදේශයන්හි 'අප්පු' යන නාමයෙන් ඔවුන් අර්ථ ගන්වා ඇත. විශේෂයෙන්ම වෙරළබඩ ප්‍රදේශවල සිටි වැලිතර හීමප්පු, අහංගම ඩිංගිරන් කිරි අප්පු, කඩොල්ගල්ලේ හීමප්පු යන ආදීන්ගේ නම්වලින් මේ බව පැහැදිලි වේ.

මෙයින් නිගමනය කළ හැකි තවත් කරුණක් නම් මෙවැනි ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පීන් බොහෝ දෙනක් ඥාති සම්බන්ධතා පැවැත්වූ අතර ඇතැම් විට දුර බැහැර ප්‍රදේශවල අය සමඟ පවා ඔවුන් සහයෝගයෙන් කටයුතු කළ බව නිගමනය කළ හැකිය. විශේෂයෙන්ම මහනුවර ප්‍රදේශාශ්‍රිත හිඳින පැරණි කාර්මික පවුල්වලින් පැවතෙන්නෝ මේ පිළිබඳව කරුණු දක්වන අතරම ඔවුන් ඇතැම් විට ඔවුනොවුන් අතර විවාහ සම්බන්ධතා පවත්වන බව ද අද පවා ඔවුන්ගේ ඥාති සම්බන්ධතා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන බව නිගමනය කළ හැකිය. එමෙන්ම යම්කිසි ගමක අලුතින් විහාරයක් ගොඩ නංවන්නේ නම්  සියලු කටයුතු භාර වන්නේ ඒ ගමේ හෝ ඒ ගමට ආසන්නව සිටින ප්‍රධානතම චිත්‍ර ශිල්පියා ලෙස ප්‍රකට වැදූන තැනැත්තාටය. නමුත් ඇතැම් අවස්ථාවල දුරබැහැර ප්‍රදේශවලින් චිත්‍රශිල්පීන් කැඳවූ බව ද මෙම අධ්‍යයනයේ දී නිගමනය කළ හැකි තවත් කරුණකි.

එමෙන් ම මෙයින් පැහැදිලි වන තවත් කරුණක් නම් බලි ඇඹීම, යන්ත්‍ර මන්ත්‍ර වැඩ, පිළිම තැනීම, විහාර කර්මාන්තය, බිතුසිතුවම් හෝ පෙතිකඩ ඇඳීම, වෙස්මුහුණු තැනීම හා වලිච්චි වැඩ යන ආදිය මේ සමයේ දී චිත්‍ර කලාව සමඟ සම්බන්ධ පැවති අනෙකුත් විෂයන් වීමයි. විශේෂයෙන් ම මෙබඳු කලා

කටයුතු බොහොමයක් චිත්‍ර ශිල්පය සමග හොඳින් බැඳී පවතින බව ද නිගමනය කළ හැකිය. ගම්මඩුවක් හෝ කංකාරියක් වැනි ශාන්ති කර්මයක් පවත්වන අවස්ථාවක දී වෙස්මුහුණ සැකසීමට, ග්‍රහ, රාක්ෂ හා දේවතාවුන් ඇතුළත් වන බල රූප ඇඳීමට හෝ ඒවා ඇඹීමට ද චිත්‍ර ශිල්පීන්ගේ සහාය අවශ්‍ය වන බව මෙමඟින් පැහැදිලි වේ.

මෙම පරම්පරා අධ්‍යයනය කිරීමේ දී නිගමනය කළ හැකි තවත් කරුණක් නම් ආධුනික චිත්‍ර ශිල්පීන්ට පුහුණු කළ හැකි විශේෂ අධ්‍යාපන ක්‍රමයක් මොවුන් අතර පැවැතීමයි. විශේෂයෙන්ම මේ පුහුණුව සඳහා යොදා ගන්නා ලද ශිෂ්‍යයින් වැඩි දෙනා විශාරද කාර්මිකයින්ගේ පුත්‍රයින් හෝ ඔවුන්ගේ ඥාති පුත්‍රයින් පිරිසක් වූ අතර ඒ සඳහා මුලින්ම නැකත් බලා රස කැවිලි, බත්බුලත්, පුදපඬුරු ආදිය රැගෙන ශිල්පී ආචාර්යවරයාගේ නිවසට නැකතකින් කැඳවාගෙන ගොස් ශිල්පිය ඉගැන්වීම ආරම්භ කරන ක්‍රමයක් මහ නුවර යුගයේ පැවති බව මෙම අධ්‍යයනයේ දී දැනගන්නට ලැබුණි.

- මෙකී පැරණි පරම්පරා පිළිබඳ ලිඛිත සාක්ෂි ආරම්භකොට ඉතිහාස කතිකාවතට එක් කිරීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල වැනි ආයතනවල අවධානයට නතු වීම.
- පැරණි චිත්‍ර භාවිත කළ හැකි පරිදි ප්‍රතිසංස්කරණයට යොමුවීම.

වැනි යෝජනා මෙම පරම්පරාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිරිපත් කළ හැකිය.

**සමුද්දේශ**


පියරතන, එම් (සං). (1995). එළුඅත්තනගලුවංශය. ගුණසේන සමාගම.

ධර්මාරාම, ආර්.ඩී (සං). (1947). කාව්‍යශේඛරය. ද්විතියික මුද්‍රණය. විද්‍යාලංකාර පිරිවෙන් ප්‍රකාශක.

සැබිහෙළ, ඒ.ඊ (සං). (1962). කොවුල් සදෙස් විවරණය. ගුණසේන සමාගම.

තෙන්නකෝන්, ආර් (සං). (1962). ගිරා සංදේශය. ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම.

ලීලසේන (සං). (1923). තිසර සංදේශය. විජය යන්ත්‍රාලය.

කුමාරතුංග, එම් (සං). (1955). තිසර සංදේශය. රත්නාකර යන්ත්‍රය.

විමලකිත්ති, එම්. සෝමින්ද, එම් (සං). (1967). දහම්පිය අටුවාගැටපදය. ගුණසේන සමාගම.

ධම්මානන්ද, ඩී (සං). (1959). ධර්මප්‍රදීපිකාව. සත්‍ය සමුච්චය මුද්‍රණාලය.

ඉන්දරතන, එම් (සං). (1957). දළදාවංශය (දළදා පූජාවලිය). ගුණසේන සමාගම.

විමලකිත්ති, එම්. සුමංගල, කේ (සං). (1968). ධර්මප්‍රදීපිකාව. රත්න පොත් ප්‍රකාශකයෝ.

සාරානන්ද, පී.එස්. සරණංකර, ඕ.එස් (සං). (1956). නම්පොත (විවරණ සහිත නම් පොත හෙවත් විහාර අස්න). තිලක මුද්‍රණාලය.

වීරසූරිය, ඩී.ජී.එස් (සං). (1955). නීලකොබෝ සංදේශය. ගුණසේන සමාගම.

පුරාණ තුන්සරණය (N.D.). ගුණසේන සමාගම.

සද්ධාතිස්ස (සං). (1935). පූජාවලිය. පානදුර මුද්‍රණාලය.

ලංකානන්ද, එන් (සං). (1968). බුත්සරණ. ගුණසේන සමාගම.

ලංකානන්ද, එන් (සං). (1958). මන්දාරම්පුර පුවත. අනුලා මුද්‍රණාලය.

කුමාරතුංග, එම් (සං). (1963). මයුර සංදේශය. ගුණසේන සමාගම.

සූරවීර, ඒ.වී (සං). (1976). රාජාවලිය. ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්.

ජයතිලක, ඩී.බී (සං). (1936). සද්ධර්මරත්නාවලිය. ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය.

තෙන්නකෝන්, ආර් (සං). (1969). සැවුල් සංදේශය. ගුණසේන සමාගම.

සමරනායක, ඩී.පී.ආර් (සං). (1959). සුළුරාජාවලිය. ෆ්‍රී ප්‍රෙස් සමාගම.

ධර්මරත්න, එම් (සං). (1961). විසුද්ධිමාර්ගය - I වන සහ II වන කාණ්ඩ. ලක්මිණි පහන් මුද්‍රණාලය.

මුදියන්සේ, එන් (සං). (1983). වෛජයන්තතන්ත්‍රය. කැලණිය විශ්වවිද්‍යාල ප්‍රකාශන.

ගෛගර්, ඩබ් (පරි). (1925 – 1930). චූලවංසය - I කාණ්ඩ හා II . ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

ගෛගර්, ඩබ් (පරි). (1912). මහාවංසය. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

අභයවර්ධන, එච්.ඒ.පී. (1978). කඩයිම් පොත් විමර්ශනය. රජයේ මුද්‍රණාලය.

අභයසිංහ, ටී සහ තවත් අය. (1977). උඩරට රාජධානිය. ලේකහවුස් ඉන්වෙස්ට්මන්ට්

ආරච්චිගේ, එස්. (1980). පෙතිකඩ සිත්තමක අසිරිය, දෙසතිය, 30 වන කලාපය. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ආරියපාල, එම්.බී. (1962). මධ්‍යකාලීන ලංකා සමාජය. ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ඇඳගම, පී. (1986). අපේ ජන කලා. නාගරික මුද්‍රණාලය.

ඉලංගසිංහ, එම්. (n.d.). රජයේ ආගම හා අධ්‍යාපනය (බ්‍රිතාන්‍ය පාලන සමය). මොරටුව විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

උල්ලුවිස්හේවා, පී. (1994). උඩරට සිතුවම් මඟ. රජයේ මුද්‍රණාලය.

කරුණාතිලක, ඒ.ඩී.පී. (1955). සෙංකඩගලපුර ඉතිහාසය. කැන්ඩි ප්‍රින්ටර්ස්.

කරුණාතිලක, ටී.බී. (1985). ජන කලා සංකේත, මහවැලි වංශය II වන කාණ්ඩය. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

කාලිංග, පී.ඒ. (1953). ලංකා කලා ඉතිහාසය. ගාමිණි මුද්‍රණාලය.

කුමාරස්වාමි, ඒ.කේ. (1983), පුරාණ ගොඩනැගිලි ආරක්ෂා කිරීම සඳහා අදහස් කීපයක්. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

කෝපරහේවා, එස්. (1958). යුරෝපා කලාවේ ලුහුඩු ඉතිහාසය. ගුණසේන සමාගම

ආරියපාල, එම්.බී (පරි). (1969). මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය.

ගුණරත්න, ඩී.ඇස්. (1976). පාරම්පරික පැරණි සැරසිලි චිත්‍ර සංලක්ෂණ, විස්කම්.

ගුණවර්ධන, ජී.ඩබ්ලිව්. (1905). ශිල්පකර්මෝපදේශය - I වන කාණ්ඩය. ග්‍රන්ථ ප්‍රකාශ යන්ත්‍රාලය.

ගොඩකුඹුර, සී.ඊ. (1964). මැදවල විහාර බිතුසිතුවම්. ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ගොඩකුඹුර, සී.ඊ. (1969). තිවංක පිළිමගෙයි සිතුවම්. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ගොඩකුඹුර, සී.ඊ. (1971). ශාස්ත්‍රීය ලිපි හා කථා. ඇපා මුද්‍රණාලය.

චාල්ස්, එස්.පී. (1950). සීගිරි බිතුසිතුවම්. ඇපා මුද්‍රණාලය.

චාල්ස්, එස්.පී. (1956), කැලණි විහාරයේ බිතු සිතුවම්.

චාල්ස්, එස්.පී. (1956). මහනුවර ගංගාරාමයේ සිතුවම්.

චාල්ස්. එස්.පී. (1986). ලංකාවේ පාරම්පරික චිත්‍ර ශිල්පී පරපුර. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

චූටිවොංග්ස්; නන්දන හා තවත් අය. (1990). ශ්‍රී ලංකා බිතුසිතුවම් ගංගාරාමය. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ජයවර්ධන, ඒ. (1889). තොටගමු විහාරය පිළිබඳ පුරාණ කථාව. ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය.

ජයවර්ධන, ඩී.ආර්. (1947). අපේ කලා ශිල්ප හා සාහිත්‍යය. ගුණසේන සමාගම.

ඤාණවිමල, කේ. (1967). සපරගමුවේ දර්ශනය. ශාස්ත්‍රෝදය යන්ත්‍රාලය.

ඤාණවිමල, කේ. (1942). සපරගමුවේ පැරණි ලියවිලි. ජිනාලංකාර මුද්‍රණාලය.

තිලකසිරි, ජේ. (1994). ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පී ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්. ගොඩගේ සහෝදරයෝ.

ද අල්විස්, සී.එම්. (1986). කෝට්ටේ රාජධානි ඉතිහාසය සහ පුරාවස්තු. දීප්ති මුද්‍රණාලය.

ද සිල්වා, ටී.යූ. (1951 - 1971). පැරණි සිංහල චිත්‍ර සැරසිලි මෝස්තර. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

දිසානායක, ඩී.එම්.ආර්. (1984). මාතලේ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ගේ පරම්පරා - ඓතිහාසික මාතලේ. රජයේ මුද්‍රණාලය.

ධනපාල, ඩී.බී; දිසානායක, එම්. (1958). සිංහල සිතුවම් කථාව. සමන් මුද්‍රණාලය.

ධම්මානන්ද, එන්. (1969). මධ්‍යම ලංකා පුරාවෘත්තය. ගුණසේන මුද්‍රණාලය.

පරණවිතාන, එස්. (1969). සිංහලයෝ. ලේකහවුස් ඉන්වෙස්ට්මන්ට්.

(1972). පැරණි ස්මාරක නාමාවලිය. සංස්කෘතික අමාත්‍යාංශ ප්‍රකාශන.

පීරිස්, ආර්. (1964). සිංහල සමාජ සංවිධානය. සමන් මුද්‍රණාලය.

මද්දුමාගේ, එම්. (1981). ලංකාවේ කලා ශිල්ප හා දාර්ශනික දෘෂ්ටිය. මිහිර මුද්‍රණ ශිල්පියෝ.

මද්දුමාගේ, එම්. (1987). කලා ඉතිහාස විචාරය. චතුර මුද්‍රණ ශිල්පියෝ.

මංජු ශ්‍රී, එල්.ටී.පී. (1977). ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය. ඉන්දික මුද්‍රණාලය.

මුදියාන්සේ, එන්. (1971). ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය. ගුණසේන සමාගම.

මිරැන්ඩෝ, ඒ.එච්. (1988). 17 - 18 සියවස්හි සිංහල සාහිත්‍යය. ගොඩගේ සහෝදරයෝ.

රතනසාර, ටී. (1967). දර්ශන සියය. ගුණසේන සමාගම.

වජිර, කේ. (1983). දළදා ඉතිහාසය හා සංස්කෘතිය. තිසර ප්‍රකාශකයෝ.

වජිරඥාන, ජී. (1961). විහාර වග විත්ති. ගුණසේන සමාගම.

වත්තල, එස්. (1962). කලාව හා ශිල්ප ශාස්ත්‍ර. ගුණසේන සමාගම.

වනරතන, කේ. (1962). පොළොන්නරු නටඹුන්. ගුණසේන සමාගම.

වාචිස්සර, කේ. (1960). සරණංකර සංඝරාජ සමය. දොන් ඇඩ්වින් සමාගම.

වික්‍රමසිංහ, එස්. ඒ. (1951). හෙළ කලා ඉතිහාසය නොහොත් චිත්‍ර මූර්ති ගෘහනිර්මාණ ශිල්පය. එක්සත් මුද්‍රණාලය.

වික්‍රමසිංහ, කේ.ඩී.පී. (1976). අපේ සංස්කෘතික උරුමය 01වන කාණ්ඩය, ඉන්දික මුද්‍රණාලය.

විජයවර්ධන, ජී.එච්; මීගස්කුඹුර, පී.බී. (1993). සියම් ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා 18 වැනි සියවස. ප්‍රදීප ප්‍රකාශකයෝ.

විජේබණ්ඩාර, සී; මොරටුවගම, එච්.ඇම්. (1979). බෞද්ධ ශිෂ්ටාචාරයේ ඉතිහාසය. ඉන්දික ප්‍රකාශකයෝ.

විජේරත්න, බී.එස්. (1951). ලංකා චිත්‍ර කලා ඉතිහාසය, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්.

විජේසේකර, එන්. (1982). වෙස්මුහුණු හා කෝලම් නැටීම. ගුණසේන සමාගම.

විජේසේකර, එන්. (1987). තෝරාගත් ලිපි සංග්‍රහය. සමයවර්ධන මුද්‍රණාලය.

විදානගම, ඩී.සී. (1961). හෙළ ගැමි කලා. ගුණසේන සමාගම.

විපස්සි, බී. (1949). ගඩලාදෙණිය සද්ධර්මතිලක රජමහා විහාර ඉතිහාසය. ගාමිණි යන්ත්‍රාලය.

විමලකීර්ති, එම්; සුමංගල, කේ. (1965). සිංහල භාෂාවේ ඉතිහාසය. ගුණසේන සමාගම.

විමලරත්න, කේ.ඩී.ජේ. (1991). බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවේ විහාර ඉඩම් පාලනය. තෙන්නකෝන් විමලානන්ද පදනම ප්‍රකාශක.

විමලසිරි, බී. (1970). තායිලන්ත බෞද්ධ සංස්කෘතිය. ගුණසේන සමාගම.

සරච්චන්ද්‍ර, ඒ. (1968). සිංහල ගැමි නාටකය. ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

සරච්චන්ද්‍ර, බී.එස්. (1970). අපේ සංස්කෘතික උරුමය සහ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිසරය - 01 කාණ්ඩය. විජය මුද්‍රණාලය.

සිරිනායක, එච්. ඩී. (1933). චිත්‍ර ශිල්පය, ග්‍රන්ථ ප්‍රකාශක සඟරාව - 01 කාණ්ඩය. ප්‍රකාශක සඳහන් නොවේ.

සිරිවීර, ඊ. (1971). මධ්‍යතන ලංකාව. සුප්‍රා මුද්‍රණාලය.

සිරිසීවලි, බී. (1973). බෞද්ධ ලෝකය. ගුණසේන සමාගම.

සිරිසීවලි, බී. (1960). ලංකා බෞද්ධ සංස්කෘතිය. කැලණිය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

සිරිසේන, එස්.ඇම්. (1982). නුවර යුගයේ හා මෑත යුගයේ සිතුවම්, සතර පුවත්පත. ප්‍රකාශන තොරතුරු සඳහන් නොවේ.

සෙනවිරත්න, ඒ. (1972). ගම්පළ යුගයේ කලා ශිල්ප. ලංකා විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

සෙනවිරත්න, ඒ. (1981). සංස්කෘතිය හා කලා ශිල්ප. ඉන්දික මුද්‍රණාලය.

සෙනවිරත්න, ඩී.ආර්. (1967). චතුෂ්ෂෂ්ටි කලා, සමයවර්ධන මුද්‍රණාලය.

සේනාධීර, කේ. (1973). නූතන චිත්‍ර කලාවේ රසික සංකල්පය. විජය මුද්‍රණාලය.

හෙට්ටිආරච්චි, ඩී.ඊ. (1979). සිංහල සිරිත් සංග්‍රහය. වෙස්ලි මුද්‍රණාලය.

සෝමරත්න, ඒ. (1967). ඩේවි දුටු ලංකාව. ගුණසේන සමාගම.

වජිර, කේ. (1974). ලක්දිව දන්ත ධාතූන් වහන්සේගේ ඉතිහාසය හා තදාශ්‍රිත පූජා විධි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

Beal, S. (1869). Travel of Buddhist Pilgrims. London Trubner.

Giles,H.A. (1923). Travels of Fa – Hien. Cambridge University Press.

Hart, R.R (tr). (1952). Heydt's Ceylon. Government Press.

Ryan, J. (1911). An Historical Relation of Ceylon, Jemes Mac Lehose & Sons.

Legge, j. (1886). Fa – Hien's Records of Buddhist Kingdoms. Oxford University Press.

Amunugama, S. (1980). Notes on Sinhala Culture. Gunasena Press.

Bandaranayake, S. (1976). The Historical Architecture of Sri Lanka. Gunathilaka Press.

Bandaranayake, S. (1986). The Rock and Wall Paintings of Sri Lanka. Lake House Press.

Bechert, H; Gombrich, R. (1984). The Word of Buddhism: Buddhist Monks and Nuns in Society and Culture. London Thames and Hudson Press.

Bell, H.C.P. (1904). Repeat on the Kegalla District of the Province of Sabaragamuwa. Colombo Government Printers.

Bhivasri, S. (1959). The Origin and Evolution of Thai Murals. Bankok Fine Arts Department.

Chaitanya, K. (1976). A History of Indian Painting : The Mural Tradition. Abhinav Publications.

Cone, M; Richard, F.G. (1977). The Perfect Generosity of Prince Vessantara. Clarendon Press.

Coomaraswamy, A.K. (1913). The Arts and Crafts of India and Ceylon. Today & Tomorrow Printers.

Coomaraswamy, A.K. (1957). An open Letter to the Kandyan Chiefs. Arts Council odf Ceylon.

Coomaraswamy, A.K. (1969). Mediaeval Sinhalese Art. Pantheon Books.

Silva, K.M.D. (1981). A History of Sri Lanka. Oxford University Press.

Silva, R.H. (1970). Rock Painting in Sri Lanka. Archaeological Department.

Devaraja, L.S. (1972). The kandyan Kingdom 1707 – 60. Lake House Investments.

Dhanapala, D.B. (1956/1957). The Story of Sinhalese Painting. Saman Press.

Dhanapala, D.B. (1964). Buddhist Paintings From Shrines and Temple in Ceylon. Amilcare Pizzi SPA.

Gunathilaka, M.H. (1978). Masks and Masks Systems of Sri Lanka. Tamarind Books.

Gunasingha, S. (1978). An album of Buddhist Paintings from Sri Lanka. Department of Government Printers.

Karunarathna, L.K. (1984). The Traditional Art of Wood Carvings. Trumpet.

Laawrie, A.C. (1896/1898). A Gazetteer of the Central Province of Ceylon – II Vols. Governments Printing.

Liyanagamage, A. (1968). The Decline of Polonnaruwa and the Rise of Dambadeniya. Government Press.

Maranzi, L. (1972). Preservation of Mural paintings. Paris UNESCO.

Marasinghe, E.W. (1989). The Vastuvidya Sastra Ascribed to Manjusri. Sri Satguru.

Miller, B.S. (1983). Exploring India's Sacred Art. University of Pennsylvenia Press.

Mudiyanse, N. (1963). The Art and Architecture of the Gampola Period 1344 – 1415. Gunasena.

Narada. (1987). The Buddha and his Teaching. J.F.& I. Printers.

Pandya, R. (1981). Cave Paintings of Sri Lanka. Shree Jagat Dhatrimata Trust.

Perera, S.G. (1959). A History of Ceylon; The Portuguese and the Dutch Period 1505 – 1796. Associated Newspapers.

Senaviratna, A. (1983). Kandy. Government Press.

Senaviratna, A. (1987). Golden Rock Temple of Dambulla. State Printing Corporation.

Senaviratna, C. (1968). South Indian Painting. National Museum.

Stein, M.A. (1907). Ancient Khotan – Vol I. Clarendon Press.

Wijesekara, N. (1962 & 1976). Ancient Paintings and Sculpture of Sri Lanka. The Times of Ceylon.

Wijesekara, N. (1984). Heritage of Sri Lanka. The Times of Ceylon.

Wiesekara, N. (1983). Selected Writings. Tisara Press.